# නියමුවා

ISSN 1391 - 1031
2016 අගෝස්තු
22 වෙළුම 05 කලාපය

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ආධාරය රු 30/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"ඓතිහාසික සත්‍යය නම්, සෑම ගැඹුරු විප්ලවයකදීම අවුරුදු ගණනක් යන තෙක් සූරාකනු ලබන්නන්ට නැති වැදගත් ප්‍රායෝගික වාසි ගණනාවක් තමන් සතුකර ගෙන සිටින සූරාකන්නන් විප්ලවයට විරුද්ධව දීර්ඝ, දුර්දාන්ත සහ දරුණු ප්‍රතිරෝධයක් දැක්වීම සාමාන්‍ය සිරිත බවය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**9වැනි වෙළුම,**
**36 පිටුව**

**05 ජාතික ආණ්ඩුවේ...**



පසුගිය වසරේ පළමු ඉනිමේදී ආණ්ඩුව එල්ල කරන ලද පහරවල් වූයේ වැට් බදු වැඩිකිරීම, තව තවත් ණය...

**07 ප්‍රවාහනය...**



පෞද්ගලික වාහන මාර්ගවලට එක් කිරීම හෝ මාර්ග තැනීම මාර්ග තදබදයට ස්ථිර සාර විසඳුමක්...

**09 වසර මැද අර්බුදය...**



ආර්ථිකයේ ආදායම ආණ්ඩුව අපේක්ෂා කරන මට්ටමින් ළඟාකර ගැනීමට...

**11 මිත්‍යාව...**



දෙවියන් පිළිබඳව, භූතයින් පිළිබඳ, ග්‍රහලෝක පිළිබඳ පතුරුවන මිත්‍යාවට වඩා බරපතළ...

සංවාදය.......................... 03
තරුණ.............................. 04
ආවර්ජනා........................ 06
කාන්තා............................ 10
ජාත්‍යන්තර ......................... 12
වේදිකාව .......................... 13
විශේෂාංග........................ 14

# රටේ ප්‍රශ්න ගැන පුළුල් සංවාදයකට

# ජ.වි.පෙ. ගෙන්ගෙට!

02 පිටුවට




යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# SAITMOට එරෙහිව සියලු රෝහල් වර්ජනයක

මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට නීතිමය පිළිගැනීමක් ලබාදීමට සෞඛ්‍ය ඇමතිවරයා ඇතුළු සෞඛ්‍ය බලධාරීන් විසින් සිදුකරන මැදිහත්වීම් නතර කරන ලෙසත්, මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය අහෝසි කරන ලෙසත් බලකරමින් පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විරෝධී මධ්‍යස්ථානයට අනුබද්ධ සියලුම වෘත්තීය සමිති පසුගිය ජූලි 04 දින පැය 4ක සංකේත වැඩවර්ජනයක් දියත් කළහ. ඒ අනුව රටපුරා සියලු රෝහල්වල කාර්ය මණ්ඩලය මෙම වැඩවර්ජනය සඳහා එක්වූ බවත් එම මධ්‍යස්ථානය වෙනුවෙන් අදහස් දැක්වූ සමන්ත කෝරලේආරච්චි සහෝදරයා කියා සිටියේය. එහිදී සියලු රෝහල්වල මෙම වර්ජනය සාර්ථක වූ බවත් අත්‍යවශ්‍ය හදිසි සේවාවන් පවත්වාගෙන යාම වෙනුවෙන් කටයුතු කිරීමට පියවර ගත් බවත් ඔහු මෙහිදී පැවසීය.

# පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ජාවාරම ගැන කෘතියක් එළිදකියි



'ජන ජීවිත බිලි දී වෛද්‍යවරුන් තනන පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ජාවාරම' නමින් වන කෘතියක් පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විරෝධී මධ්‍යස්ථානය මගින් පසුගියදා ජාතික පුස්තකාලයේදී එළිදැක්වුණු අතර මෙම අවස්ථාව සඳහා ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා ආරාධිත දේශකයා ලෙස සහභාගි විය. මෙහිදී ඔහු පැවසුයේ රටේ ජනතාව ගැන සිතා මෙම ආයතනනයෙන් වෛද්‍යවරුන් පිටවීම නතර කළ යුතු බවත් වාහන පැදවිය නොහැකි අයට ලයිසන් දීමෙන් සිදුවිය හැකි අනතුර මෙම ආයතනය තුළින්ද සිදුවන බැවින් මෙම සටන ජයග්‍රහණය කිරීමට කටයුතු කළ යුතු බවත්ය.

මෙහිදී පසුගිය කාලයේ වෛද්‍ය පීඨ ශිෂ්‍ය අරගලයේදී ඝාතනය කළ වෙනුර එදිරිසිංහ සොයුරාගේ මවට මෙම කෘතිය පිළිගැන්වුණු අතර මෙම අවස්ථාවට එක්වූ මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන, නීතිඥ ජේ.එම්. විජේබණ්ඩාර, විශේෂඥ වෛද්‍ය ඉඳුනිල් විජේනායක, වෛද්‍ය ජයන්ත බණ්ඩාර යන අය අදහස් දැක්වූ අතර වෛද්‍ය අසංග වික්‍රමසිංහ, සහ සමන්ත කෝරළේආරච්චි සහෝදරයාද සහභාගි වූහ.

# තෙල් සංස්ථාවේ ටැංකි ඉන්දියාවට පැවරීමට විරෝධය




ත්‍රිකුණාමලය, 'චයිනා බේ' පිහිටි තෙල් ටැංකි ඉන්දියානු සමාගමකට පැවරීමට එරෙහිව විරෝධය දක්වන බවත් එය නැවැත්වීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා බවත් ලංකා ඛනිජ තෙල් පොදු සේවක සංගමයේ සභාපති අශෝක රංවල සහෝදරයා පසුගියදා පැවති මාධ්‍ය හමුවකදී පැවසීය.

චයින බේ තෙල් ටැංකි 100 න් 14 ක් අයි.ඕ.සී. සමාගමට පවරා ඇති අතර ඉතිරි 86 න් 17 ක් ඉතාමත් හොඳ තත්වයේ ප්‍රමිතියක් සහිත බව ඛණිජ තෙල් සංස්ථාව විසින් තීරණය කර ඇති හෙයින් ඒවා ඛණිජ තෙල් සංස්ථාව යටතට පවරා ගෙන තෙල් බෙදාහැරීම සිදුකරන ලෙස වර්තමාන ආණ්ඩුවට පසුගිය වසරේ අයවැය යෝජනාවක් ලෙස යෝජනා කළ බවත් එයට කැබිනට් අනුමැතිය පවා ලැබුණු බවද මෙහිදී රංවල සහෝදරයා පැවසීය. නමුත් නැවත කැබිනට් අනුමැතියක් මගින් මෙම තෙල් ටැංකි ඉන්දියාවට පැවරීමට පියවර ගෙන ඇති බවත් මෙයට දැඩි විරෝධය පළකරන බවත් මෙහිදී රංවල සහෝදරයා පැවසීය.

මෙම මාධ්‍ය හමුව සඳහා ඛණිජ තෙල් පොදු සේවක සංගමයේ සංවිධායක ලේකම් ඩී.ජේ. රාජකරුණා. විධායක සභිකයින් වන මනෝජ් විජේවීර, පත්මසිරි යන සහෝදරවරුද සහභාගි වූහ.

# ආයුර්වේද වෛද්‍ය සත්‍යග්‍රහයට වෘත්තීය සමිති ව්‍යාපාරයේ සහාය



රැකියා විරහිත උපාධිධාරී වෛද්‍යවරුන්ට වසර 06ක් පුරා රැකියා ලබා නොදීමට එරෙහිව ආරම්භ කර ඇති සත්‍යග්‍රහය සඳහා සහාය පළකරමින් පසුගියදා ජාතික වෘත්තීය සමිති නියෝජිතයෝ එම සත්‍යග්‍රහය සඳහා එක් වූහ. ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය වෙනුවෙන් වසන්ත සමරසිංහ, චන්ද්‍රසිරි මහගමගේ, එස්.පී. විතාන, චන්දිම විමලසුරේන්ද්‍ර, සරත් ලාල් ආදී වෘත්තීය සමිති නියෝජිතයෝ මේ සඳහා එක්ව සිටියහ. පසුගිය 13 වැනිදා සිට ආරම්භ කර ඇති උපාධිධාරී සත්‍යග්‍රහය බොරැල්ල ආයුර්වේද වටරවුමේ පැවැත්වෙන අතර 700 ක් පමණ ආයුර්වේද උපාධිධාරීන් වසර ගණනක් තිස්සේ රැකියා ලබා නොදීමට එරෙහිව මෙම සත්‍යග්‍රහය ආරම්භ කර තිබේ.

# විශ්වවිද්‍යාල ප්‍රවේශය ලද සිසුන්ට අධ්‍යාපන සමුපකාරයෙන් ශිෂ්‍යත්ව



බස්නාහිර පළාතේ අධ්‍යාපන සමුපකාරයේ සාමාජිකයින්ගේ දූ දරුවන් හට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ උළෙලක් පසුගියදා දෙහිවල එස්.ද එස්. ජයසිංහ ශාලාවේදී පැවැත්විණි. මෙම අවස්ථාවට විශ්වවිද්‍යාලයට සුදුසුකම්ලත් සිසු සිසුවියන් විශාල පිරිසක් සහභාගි වූ අතර අධ්‍යාපන සමුපකාරයේ වත්මන් සභාපති ප්‍රියන්ත ලියනගමගේ, ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ යන සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් මෙම උළෙල පැවැත්විණි. මේ වන විට රට පුරා පළාත් 06ක මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කර ඇති බවද නව පාලනය භාරගෙන මාස 02ක් ඇතුළත සාමාජිකයින් වෙනුවෙන් මේ වන විටත් විශාල වැඩකොටසක් ක්‍රියාත්මක කෙරෙමින් පවතින බවද මෙහිදී සභාපති ප්‍රියන්ත ලියනගමගේ සහෝදරයා නියමුවා වෙත පැවසීය.

# අඛණ්ඩව සිදුකරන සිසු මර්දනය හෙළා දකිමු!

## ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය

**ආණ්ඩුව විසින් සිදුකරන ශිෂ්‍ය මර්දනය හෙළා දකිමින් ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය විසින් පසුගිය 10වැනි දින ජනමාධ්‍ය නිවේදනයක් නිකුත් කරන ලදී. එම නිවේදනය සම්පූර්ණයෙන් මෙසේය.**

පසුගිය සියලුම ආණ්ඩු මෙන්ම වත්මන් හවුල් ආණ්ඩුවද ශිෂ්‍ය ව්‍යාපාරය මර්දනය කොට බියවැද්දීම සඳහා දිගින් දිගටම කටයුතු කරන බව පෙනේ.

ලංකාවේ සියලුම පාලකයින් කාලයක් තිස්සේ අනුගමනය කරනු ලැබූ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියත්, ලංකාව මුහුණ දී සිටින දැවැන්ත ආර්ථික අර්බුදයට පිළියමත් ලෙස ජනතාවගේ අයිතීන් කප්පාදු කිරීමට ගන්නා ක්‍රියාමාර්ග නිසා ලංකාවේ නිදහස් අධ්‍යාපනය දිගින් දිගටම කප්පාදු කරමින් තිබේ. නිදහස් අධ්‍යාපනය කප්පාදු කිරීම සඳහා ආණ්ඩු විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් තිබෙන අතර පුද්ගලික වෛද්‍ය විද්‍යාල ඉන් එක් අවස්ථාවක් පමණි.

රට තුළ සිදුකරන නිදහස් අධ්‍යාපන කප්පාදුවට එරෙහි අනවරත අරගලයක නියලුණේත් දැනට අරගල කරමින් සිටින්නේත් මෙරට ශිෂ්‍ය ව්‍යාපාරයයි. නිදහස් අධ්‍යාපනය අහෝසි නොකරන ලෙස ආණ්ඩුවට බලකරමින් සිදුකරන ශිෂ්‍ය උද්ඝෝෂණවලට, සිසුන්ගේ සාධාරණ ඉල්ලීම්වලට ඇහුම්කන් දී ඒවා විසඳනවා වෙනුවට බංකොලොත් ආණ්ඩු විසින් සිදුකරනු ලබන්නේ ශිෂ්‍ය අරගල මර්දනය කිරීම හා සිසු නායකයින් දඩයම් කිරීමයි.

සාමකාමී හා සාධාරණ ශිෂ්‍ය උද්ඝෝෂණවලට ජල ප්‍රහාර, බැටන් ප්‍රහාර එල්ල කරමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ඔළු පලන, ලේ සොලවන ආණ්ඩුව විවිධ චෝදනා නඟා ඔවුන් අත්අඩංගුවටද ගනිමින් පංති තහනම් කරමින් දිගින් දිගටම සිය මර්දනකාරී ක්‍රියාපිළිවෙත අනුගමනය කරමින් සිටී. මේ පිළිබඳ අලුත්ම උදාහරණය අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු ලහිරු වීරසේකර සිසුවා අත්අඩංගුවට ගැනීමයි.

සාමකාමී හා සාධාරණ ශිෂ්‍ය උද්ඝෝෂණවලට පහරදෙමින්, සිසු නායකයින් අත්අඩංගුවට ගනිමින් ආණ්ඩුව ගෙනයන මෙම මර්දනකාරී ක්‍රියාපිළිවෙත දැඩි ලෙස හෙළා දකින අපි දිගින් දිගටම සිදුකරන ශිෂ්‍ය මර්දනය වහාම නවතන ලෙසත් අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු ලහිරු වීරසේකර සිසුවා ඇතුළු අත්අඩංගුවේ පසුවන සියලුම සිසුන් වහාම නිදහස් කරන ලෙසත් ආණ්ඩුවට බලකර සිටිමු.

එමෙන්ම වර්තමානයේ සිසු පරපුර මුහුණ දී සිටින ගැටලු පොදු සමාජ ගැටලු ලෙස සලකා නිදහස් අධ්‍යාපනයේ අයිතිය ආරක්ෂා කර ගැනීමටත් ශිෂ්‍ය මර්දනය නැවැත්වීමටත් ආණ්ඩුවට බලකිරීමට පෙරට එන ලෙස සියලුම ජනතාවගෙන් ඉල්ලා සිටිමු.

# යාපනය සරසවි සිසුන්ට එල්ලකළ ප්‍රහාරය හෙළාදකිමු! ජාතික සමගිය ගොඩනැගීම උදෙසා පෙළගැසෙමු!

## සමාජවාදී ශිෂ්‍ය සංගමය

**යාපනය විශ්වවිද්‍යාලයේ සිදුවීම පදනම් කරගනිමින් පසුගිය 17වැනි දින මාධ්‍ය නිවේදනයක් නිකුත් කළ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රියා සහෝදරයා, ජාතිවාදය ඇවිළවීමේ උත්සාහයක් පිළිබඳව අනතුරු ඇඟවීය.**

එම නිවේදනය සම්පූර්ණයෙන් මෙසේය.

යාපනය සරසවියේ සිසුන් අතර ඊයේ දිනයේ(16) ඇතිවූ ගැටුමක් හේතුවෙන් සිසුන් කිහිප දෙනෙකු තුවාල ලබා ඇත. මෙම සිදුවීම පදනම් කරගනිමින් උතුරේත් දකුණේත් සරසවි සිසුන් අතර මෙන්ම පොදු මහජනතාව අතරද ජාතිවාදය ඇවිලවීමේ උත්සාහයන් ක්‍රියාත්මක වෙමින් පවතින බව දක්නට ලැබේ.

මාළඹේ නීතිවිරෝධී පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය අහෝසි කිරීම උදෙසා වූ අරගලය ඇතුළුව නිදහස් අධ්‍යාපනය රැකගැනීම සඳහා වූ සිසු අරගලයන් තීව්‍ර වී ඇති මෙවන් මොහොතක මෙවන් ගැටුම් ඇතිවීම බෙහෙවින්ම ඛේදජනකය. එම අරගලයට විද්වතුන්, කලාකරුවන්, ප්‍රගතිශීලී පුද්ගලයින් සහ සිවිල් සංවිධාන එක මිටකට එක්වද්දී, පොදු මධ්‍යස්ථාන ගොඩනැගෙද්දී, එහි ප්‍රධානතම කොටස්කරුවන් වූ සරසවි සිසුන් අතර බෙදීම් ඇතිකරන මෙවන් ගැටුම් ඇතිවීම පිළිබඳව සතුටු විය හැක්කේ අධ්‍යාපන අයිතිය විකිණීමට පක්ෂ කණ්ඩායම්වලට පමණක්මය.

'ජාතිවාදය' හැමදාමත් සේවය කළේ සටන් කරනා බලවේගයන්ට නොව ඊට එරෙහි පාලකයන්ටය. එය හැමදාමත් සිදුකළේ අරගලයන්ට ජවයක් දීම වෙනුවට එම අරගලයන් මොටකිරීමය. ඒ වෙනුවෙන් එම සටන්කරනා බලවේගයන්ගේ ශක්තිය හීන වන ලෙස කැබලි ගණනාවකට බෙදා වෙන්කිරීමය. අන් සියල්ලන්ටම මෙන්ම ශිෂ්‍යයින්ටද එය එසේමය.

එහෙයින් සිසු අරගල ඇතුළුව සියලු ප්‍රගතිශීලී අරගලයන්ට එරෙහිව පාලකයින්ගේ වුවමනාව ඉටුකරනා 'ජාතිවාදය' නම් සතුරා සරසවි බිමෙන් පමණක් නොව මේ සමස්ත දිවයිනෙන්ම තුරන්කළ යුතුය. පොදු ජනතා ඉල්ලීම් දිනාගත හැකිවනු ඇත්තේත්, එම ජයග්‍රහණය එක්ව භුක්තිවිඳිය හැක්කේත් එවිටය. එහෙයින් සිසුන් භේදකර පාලක වුවමනාවන් ඉටුකරනා මෙම පහරදීම හෙළාදකින අපි අධ්‍යාපන අයිතිය දිනාගැනීමේ අරගලය උදෙසාත් ජාතික සමගිය ගොඩනැගීම උදෙසාත් ජාති, ආගම් භේදයන්ගෙන් තොරව එකට එක්වන ලෙස සමස්ත ශිෂ්‍ය ප්‍රජාවගෙන් ඉල්ලා සිටිමු.

## රටේ ප්‍රශ්න ගැන...

මුල් පිටුවෙන්

සියලු ක්ෂේත්‍රයන්හි ගැටලු උග්‍රවෙමින් ජනතාව මහත් පීඩනයකට පත්ව සිටියෙදී සහ ඒ ප්‍රශ්න යටපත් කරමින් විවිධ කණ්ඩායම් බලය වෙනුවෙන් ජනතාව නොමඟ යැවීමට උත්සාහ කරමින් සිටියෙදී ජනතාව පෙළන ගැටලු පිළිබඳවත් ඊට අදාළ විසඳුම් පිළිබඳවත් හරවත් සංවාදයක් ඇරඹීම අරමුණු කරගනිමින් අගෝස්තු මාසයේ සිට ගෙන්ගෙට යාමේ ව්‍යාපාරයක් ඇරඹීමට ජනතා විමුක්ති පෙරමුණ තීරණය කර තිබේ. විශේෂයෙන් ජනතාව සමග ඇතිකර ගන්නා මෙම සංවාදය ඔවුන් සංවිධානගත කරගන්නා වූ ජන බලයක් ගොඩනැගීම දක්වා පුළුල් කර ගැනීමටද අපේක්ෂිතය.

රටේ ආර්ථික අර්බුදයට විසඳුම් නැති මෛත්‍රී රනිල් හවුල් ආණ්ඩුව, එම අර්බුදය ජනතාව මත පැටවීමේ මාර්ග සොයමින් සිටී. එසේම ඔවුහු තමන් බලයට පත් කරන ලද ජනවරමට පිටුපාමින් පසුගිය පාලනයේ දූෂිතයින්ට හා වංචනිකයින්ට එරෙහි පරීක්ෂණ 'ඩීල්' මත තීරණය කරමින්ද පසුගිය රාජපක්ෂ පාලනයට නොදෙවැනි ලෙස වංචනික හා දූෂිත ක්‍රියාවන්හි නිරත වෙමින්ද පසුවෙති. මේ තත්වය තුළ රාජපක්ෂ පවුල් පාලනය පරාජය කිරීම වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කළ ජනතාව පත්ව සිටින්නේ බලාපෙරොත්තු කඩවූ තත්වයකය. මේ අතර පරාජය කරන ලද සහ මේ වන විට නීතියෙන් දඬුවම් ලැබිය යුතුව තිබූ රාජපක්ෂ පාලනයේ දූෂිතයෝ හා වංචනිකයෝ, නැවත බලය ඩැහැගැනීමේ අරමුණ ඇතිව ජනතාව නොමඟ යැවීමට තැත් කරමින් සිටිති.

මෙම තත්වය හමුවේ ජනතාව පෙළන ප්‍රශ්නවල යථාර්ථයත් ඊට බලපා ඇති ආර්ථික දේශපාලන හේතූත් ඊට විකල්ප ලෙස තෝරාගත හැකි මාර්ග පිළිබඳවත් ගෙන්ගෙට යාමේදී ජනතාව සමඟ පුළුල්ව සංවාද කරගැනීමට ජ.වි.පෙ. අපේක්ෂා කරයි.

මේ පිළිබඳව නියමුවා කරන ලද විමසුමකට පිළිතුරු දෙමින් ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා කියා සිටියේ ජ.වි.පෙ. විසින් දැනට ප්‍රාදේශීය මට්ටමින් කරගෙන යනු ලබන 'ණයබර, බදුබර හා බිඳ වැටෙන ආර්ථිකය' සම්මන්ත්‍රණ මාලාවට අමතර වශයෙන් ගම්මට්ටමින් අගෝස්තු මාසයේ සිට මෙම ගෙන්ගෙට යාමේ වැඩපිළිවෙළ දියත් කරනු ලබන බවයි. "හවුල් ආණ්ඩුව ජනතාව අතර වේගයෙන් පිරිහෙමින් තිබෙනවා. ශ්‍රීල.නි.ප.යේ රාජපක්ෂවාදීන් මෙම තත්වය ජනතාව තමන් වෙත හැරීමක් ලෙස අර්ථකථනය කරන්න හදනවා. ඒත් ඔවුන්ට නැවත වරක් ජනතාව නොමඟ යවන්න අපි ඉඩ තබන්නේ නැහැ. ජනතාව ජ.වි.පෙ. නායකත්වයෙන් හැදෙන විකල්ප සමාජ ආර්ථික වැඩපිළිවෙළක් වටා පෙළගැහීම නවත්තන්න බැහැ." විජිත හේරත් සහෝදරයා අවධාරණය කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ජාතිවාදයට යළිත් ඉඩ නොදෙමු!

පසුගියදා යාපනය විශ්වවිද්‍යාලයේ සිංහල සිසුන් පිරිසකට දෙමළ සිසුන් පිරිසක් විසින් කරන ලද පහරදීමත් සමග නැවතත් ජාතිවාදය පැතිරයාමේ අවදානමක් ඇතිවිය. ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු ජාතිවාදයට එරෙහි දේශපාලන පක්ෂත් සිවිල් සංවිධානත් සමාජ ක්‍රියාකාරීනුත් විසින් වහාම සිදුකරනු ලැබූ මැදිහත්වීම නිසා ජතිවාදී ගිනි ඇවිලී යාමක් සිදු නොවීය. ඒ හේතුවෙන් ජාතිවාදී ගිනි ඇවිලවීමට 'අඬන්නට ඇහැට ඇඟිල්ලෙන් අනින තුරු' බලාසිටි දෙපැත්තේම ජාතිවාදීන්ගේ ජාතිවාදී වුවමනාවන් ඉටුකර ගැනීමට නොහැකි විය. මෙය වඩාත් බරපතළ වූයේ මේ සිදුවීම සිදුවූයේ 'කළු ජූලිය' සිදුවූ ජූලි මාසයේම වීමය. සැබැවින්ම මෙම ජාතිවාදී ප්‍රහාරය හෙළාදැකිය යුතුය. එමෙන්ම යළි මෙවැනි තත්වයන් ඇතිවීම වැළැක්වීමට පියවරද ගත යුතුය.

කෙසේ වෙතත් ප්‍රශ්නය තවම විසඳී නොමැත. එය දැන් පවතින්නේ අළු යට ගිනි මෙනි. මෙම ප්‍රශ්නයේදී ආණ්ඩුව කටයුතු කළේද වගකීමක් නැති අලස ස්වභාවයකිනි. තම දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට ආණ්ඩුව ප්‍රමාණවත් පියවර ගන්නාතුරු තම දරුවන් යාපනයට නොයවන බව දෙමාපියෝ පැවසූහ. දරුවන් සිටින්නේද බියෙනි. එය සාධාරණය. මෙම බිය නැති කොට ආරක්ෂාව තහවුරු කොට සිසුන්ට නිදහස් මනසකින් ඉගෙනීම් කටයුතු කිරීමට හැකි වාතාවරණයක් සකස් කොට දීමේ වගකීම ඇත්තේ ආණ්ඩුවටය. එහෙත් ආණ්ඩුව සුපුරුදු ඉබි ගමනේය. ආණ්ඩුවේ මෙම අලස, වගකීම් විරහිත ස්වභාවය වාසි සලසන්නේ ජාතිවාදීන්ටය.

ජාතිවාදයත් ජාතික අසමගියත් නිසා තිස් අවුරුදු යුද්ධයකින් බැටකෑ ජනතාවක් හා රටක් ලෙස ජාතිවාදය පැරදවීම වෙනුවෙන් මෙයට වඩා සක්‍රීය යමක් කළ යුතුය. එහෙත් මේ ප්‍රශ්නයේ සැබෑ වගඋත්තරකරුවන් වන සිංහල හා දෙමළ ධනපති නායකයෝත් ධනපති ආණ්ඩුවත් ජාතිවාදය මතම යැපීමට උත්සහ කරති. විසඳුම් ලෙස ජාතිවාදය අවුළුවාලන යෝජනාම ඉදිරිපත් කරති. බේදවාචකය එයයි. ජාතිවාදයෙන් බැටකෑ රටක ජාතික සමගිය ආරම්භ කළ යුත්තේ, පාසල් පංති කාමරයෙන් හා විශ්වවිද්‍යාලයෙනි. එහෙත් තවමත් ලංකාවේ පාසැල් තුළත් විශ්වවිද්‍යාල තුළත් සිදුවන්නේ ජාතිවාදය වැපිරීම, පෝෂණය කිරීම හා පවත්වාගෙන යාමය. විශ්වවිද්‍යාල වැනි උසස් අධ්‍යාපනය ලබන තැන්වල පවා ජාතිවාදයත් ජාතිවාදී ගැටුමුත් තිබීම අවාසනාවන්ත තත්වයකි. එය වහාම වෙනස් කළ යුතුය. එහෙත් බලය ලබාගැනීම සඳහා ඇති එකම මඟ ලෙස ජාතිවාදය තෝරාගත් දේශපාලන නායකයන් සිටින විට ජාතිවාදය ඇවිළවීම මිස ජාතික සමගිය ගොඩනැගීම සිදුවන්නේ නැත.

දුම්රියක් ගමන් කිරීමට පීලි දෙකක් අවශ්‍ය වන්නාක් මෙන් ජාතිවාදයටද දෙපැත්තක් අවශ්‍ය වේ. සිංහල ජාතිවාදය නොමැතිව දෙමළ ජාතිවාදයටත් දෙමළ ජාතිවාදය නොමැතිව සිංහල ජාතිවාදයටත් මෙ දෙකම නොමැතිව මුස්ලිම් ජාතිවාදයටත් පැවැත්මක් නැත. එබැවින් දෙමළ ජාතිවාදීන් දැන හෝ නොදැන සිදු කරන්නේ සිංහල ජාතිවාදය පැරදවීම නොව එය පෝෂණය කිරීම වන අතර එලෙසම සිංහල ජාතිවාදය විසින් දෙමළ හෝ මුස්ලිම් ජාතිවාදය පරදවනවා වෙනුවට ඒවා පෝෂණය කරනු ලැබේ. සත්‍යය එයයි. විශ්වවිද්‍යාලයක ගැටුමක් ඇතිවූ විට පවා සමාජය අනතුරුදායක තත්වයට පත් වන්නේ ඒ නිසාය.

යාපනය විශ්වවිද්‍යාලයේදී සිංහල සිසුන්ට පහර දීමට මුල්වූවායයි කියන සසිදරන් නම් සිසුවාට වඩා ඔවුන් තුළ ජාතිවාදයේ විෂ වැපුරූ හා තවමත් වපුරන උතුරේ දේශපාලන නායකයින් භයානකය. එසේම උතුරේ එම සිදුවීම පදනම් කර ගනිමින් ෆේස්බුක් පිටුවල සිංහල ජාතිවාදී ප්‍රකාශ පළකරන සිංහල තරුණයින්ට වඩා ඔවුන් තුළට ජාතිවාදී විෂ ඇතුල් කරන සිංහල දේශපාලන නායකයින් භයානකය. මන්ද මතවාදයන් පැතිරවීමේ හැකියාව හා බලය ඇත්තේත් දේශපාලන තීරණ ගනු ලබන්නේත් ඔවුන් විසින් වන නිසාය. තම බංකොලොත් දේශපාලනය වසා ගැනීමට විග්නේශ්වරන්, සම්බන්දන් ඇතුළු පිරිසට දෙමළ ජාතිවාදය අවශ්‍ය වන්නා සේම තම දේශපාලන ප්‍රතිගාමීත්වයත් බංකොලොත් බවත් වසා ගැනීමට රාජපක්ෂ කල්ලියටද සිංහල ජාතිවාදය අවශ්‍යය. රනිල් මෛත්‍රී හවුල් ආණ්ඩුවටද එය අවශ්‍යය. මුස්ලිම් ජාතිවාදයද මෙලෙසමය. මොවුන් විසින් වපුරන ජාතිවාදයේ ගොදුරු බවට පත්වන්නේ මෙරට පීඩාවට පත් තරුණ පරපුර හා පොදු ජනතාවය. පොදු ජනතාවටත් විශේෂයෙන් තරුණ පරපුරටත් ජාතිවාදයෙන් ලැබී ඇත්තේ දුක් කරදර මිස සතුට සැපත නොවේ; නරක ප්‍රතිඵල මිස හොඳ ප්‍රතිඵල නොවේ. එබැවින් ජාතිවාදය පැරදවීමට දැන් තරුණ පරපුර පෙරමුණ ගත යුතුය. ජාතිවාදය මුළුමනින්ම පැරදවිය යුතුය. මේ ඒ සඳහා කාලයයි.

# ශිෂ්‍ය ව්‍යාපාරයට නිවැරදි දැක්ම එන්නත් කරන්නේ සමාජවාදී ශිෂ්‍ය සංගමයයි!



**සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා**

***නියමුවා:- හවුල් ආණ්ඩුවත් ශිෂ්‍ය ගැටලුවලට පිළිතුරු සොයමින් සිටින්නේ පෙර පාලනයන් පරිදිමයි. ශිෂ්‍ය නායකයින් අත්අඩංගුවට ගනු ලැබ තිබෙනවා. සිසු සිසුවියන් ගණනාවකගේ ශිෂ්‍යභාවය අහෝසි කර තිබෙනවා. මෙම තත්වය ඔබ හඳුනාගන්නේ කොහොමද?***

***රංගන දේවප්‍රිය සහෝදරයා:-*** අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කතා කරද්දි විශේෂයෙන් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාලයක් පුරා දක්නට ලැබුණු ගැටලු තවදුරටත් වර්ධනය වීමක් තමයි අද වෙද්දි අපට දකින්න තිබෙන්නෙ. එක් පැත්තකින් අධ්‍යාපන පෞද්ගලීකරණය පෙරට ඇවිත් තියෙනවා. ඒ මගින් පුද්ගලයෙකුට තමන් කුමන විෂයක් කෙතෙක් දුරට හදාරනවාද යන්න ඔහු හෝ ඇය සතු මුදලේ ප්‍රමාණයට සීමාකරනු ලැබ තිබෙනවා. ඒ වගේම තමයි දැන් එම ක්‍රියාවලිය තුළ මාලඹේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය වැනි වංචනික ආයතන, ජනතාවගේ ජීවිත පිළිබඳ තීන්දු කරන වෛද්‍ය වෘත්තිය වැනි වෘත්තීන් සඳහා කිසිදු සුදුසුකමක් නොමැති පුද්ගලයින් එක්කිරීමේ සූදානමක ඉන්නවා.

ඒ වගේම තමයි පෞද්ගලික ආයතන එසේ බිහිවෙද්දි නිදහස් අධ්‍යාපනය ලබා දෙන ආයතනයන්හි තිබෙන අධ්‍යයන, සුභසාධන ගැටලුත් විශාල ප්‍රමාණයක් තියෙනවා. පසුගිය මාස 3 ඇතුලත කැළණිය විශ්වවිද්‍යාලයත් සබරගමුව විශ්වවිද්‍යාලයත් සෞඛ්‍ය ප්‍රශ්න මත වසාදාන්න පරිපාලනයට සිද්ධවුණා. මෙවන් තත්වයක් ඇතිවීමේ හැකියාව ශිෂ්‍යයෝ කාලයක් තිස්සේ පෙන්වලාදීලා තිබුණත් ඒවාට උත්තර ලැබුණෙ නැහැ. ඒ වගේම මේ වෙනකොට තිබෙන තවත් ප්‍රධානම ගැටපුවක් තමයි ආචාර්ය හිඟය. විශ්වවිද්‍යාලවලට වගේම උසස් තාක්ෂණ ඩිප්ලෝමා ආයතන වැනි අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනයන්ටත් ඒක පොදු තත්වයක් වෙලා. ආචාර්යවරු නොමැතිකමින් ඒ ආයතන තුළ ඇති තමන් තෝරාගත් පාඨමාලා වෙනුවට ගුරුවරු සිටින වෙනත් පාඨමාලා හදාරන්න ශිෂ්‍යයන්ට සිදුවෙන තත්වයට ඒ ගැටලුව උග්‍රවෙලා.

ඒ නිසා අධ්‍යාපන පෞද්ගලීකරණයට එරෙහිවත් අධ්‍යයන සුබසාධන ගැටලු වෙනුවෙනුත් එදා වගේම අදටත් සිසුන්ට අරගල කරන්න සිද්ධවෙලා තිබෙනවා. ඒ නිසා තමයි මේ මොහොතේ ඒ අරගල කරන ශිෂ්‍යයින්ට එරෙහිව මර්දනය දියත්වෙලා තිබෙන්නෙ. අත්අඩංගුවට ගැනීම්, පංති තහනම්කිරීම්, නඩු පැවරීම් කරමින් තනි තනි ශිෂ්‍යයින් වෙත මර්දනය ගේනවා වගේම තමයි ඒ මර්දයට අවශ්‍ය කරන වටපිටාව සකසා ගැනීම වෙනුවෙන් ආණ්ඩුව සමස්ත විශ්වවිද්‍යාල ශිෂ්‍යයා සම්බන්ධයෙන් බියකරු ප්‍රතිරූපයක් ජනතාව තුළ මවාපාන්න උත්සාහ කරමින් සිටිනවා.

> "ආණ්ඩුව විසින් සිදු කරන අධ්‍යාපන පෞද්ගලීකරණයත් ශිෂ්‍ය මර්දනයත් මෙන්ම ආණ්ඩුවේ ඒ අරමුණ සාර්ථක කරගැනීම වෙනුවෙන් විවිධ කණ්ඩායම් ප්‍රගතිශීලී යැයි පෙනෙන ව්‍යාජ යෝජනාවන් ගෙන එමින් තිබෙන අවස්ථාවකුයි මේ ගතවෙමින් තිබෙන්නෙ. එවැනි මොහොතක ශිෂ්‍ය ව්‍යාපාරය නිවැරදි දේශපාලන තීන්දු තීරණයන්හි කෙලින් සිටගත යුතුව තිබෙනවා. ගනු ලබන ක්‍රියාමාර්ගවල පටන් භාවිතාකරන වචන දක්වාම තෝරා බේරා ගත හැකි නිවැරදි දැක්මක් එය සතු විය යුතුයි."

පෙර පැවති ආණ්ඩු තමන්ට ශිෂ්‍ය ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න නොහැකි වූ අවස්ථාවන්වලදි සිදුකළෙත් මේ ලෙසම ශිෂ්‍ය ක්‍රියාකාරීන්ව මර්දනය කිරීම. එදා වෙන්වෙන්ව තම නොහැකියාව පෙන්වූ කණ්ඩායම් එකට එකතුවෙලා ගොඩනගන ලද වත්මන් හවුල් ආණ්ඩුවත් මේ සිදුකරන ශිෂ්‍ය මර්දනය හරහා පෙන්නුම් කරන්නේ අධ්‍යාපන ගැටලුවලට පිළිතුරු දීමට ඔවුන්ගේ ඇති නොහැකියාව.

***නියමුවා:- ආණ්ඩුව තමන් බලයට පත්කරන ලද ජනවරමට පිටුපා පෞද්ගලීකරණය පෙරට ගෙන තිබෙනවා. විශේෂයෙන් ඔවුන් අත තබා ඇති ක්ෂේත්‍රයක් වන්නේ අධ්‍යාපනයයි. මේ පිළිබඳව කීවොත්.***

***රංගන දේවප්‍රිය සහෝදරයා:-*** අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න මෙතෙක් සිටි කිසිම ධනේශ්වර පාලකයකුට වුවමනාවක් තිබුණෙ නැහැ. අද සිටින අයටත් නැහැ. ඒ හේතුවෙන් අද රටේ ආර්ථිකය යැපෙන්නෙ බදු සහ ණය මත. රටේ ජනතාවට පටි තදකරගන්න කියන ගමන් හවුල් ආණ්ඩුවේ නායකයො දෙන්නා මාරුවෙන්

**15 වැනි පිටුවට**



# Yes We Can

## සහෝදරත්වයේ දිනය

1948 ඊනියා නිදහසට පෙර පටන්මත් ඇරඹි, අප රටේ බලයේ සිට ධනපති ආණ්ඩු විසින් ඇතිකළ ජාතිවාදී එදිරිවාදිකම් වල උච්චතම සිදුවීම 1983 කළු ජූලියයි. දෙමළ දහස් ගණනකගේ ජීවිත මෙන්ම මිල කළ නොහැකි දේපළ විනාශ කරමින් එම සිදුවීම ලාංකේය භූමිය මත පැතිර ගියේ සිංහල හා දෙමළ ජනයාගේ හදවත් වෛරීය හා, සතුරුභාවයේ ගිලී ගිල්වමිනි. එය ලාංකේය ඉතිහාසයේ නොමැකෙන කළු පැල්ලමක ලෙස සටහන් වී ඇත. එකී වෛරීභාවය හා සතුරු භාවය වෙනුවට මිත්‍රත්වය හා සහෝදරත්වය ගොඩනැගීම අද දවසේ කාර්යභාරය වී ඇත. එකී කාර්යය අරමුණු කොටගත් සමාජවාදී තරුණ සංගමය, එකී සිදුවීම සිදුවූ ජූලි 23 ''සහෝදරත්වයේ දිනය'' ලෙස ප්‍රකාශයට පත්කළේය. යළි ලාංකේය භූමිය මත එවැනි සිදුවීම් වළක්වනු පිණිස ගතහැකි සෑම ක්‍රියාමාගයක් ගැනීම උදෙසා සිංහල දෙමළ මුස්ලිම් යන ජාතිකත්වයන් අතර සහෝදරත්වය ගොඩනැංවීම මෙහි අරමුණ විය.

2008වසරේ සිට සමාජවාදී තරුණ සංගමය සහෝදරත්වයේ දිනය පවත්වන ලද අතර පසුගියදා ද සාර්ථක අන්දමින් වැඩසටහන් රැසක් උතුරේත් දකුණෙත් ක්‍රියාවට නගන ලදී. ජාතිවාදයට එරෙහිව නඟන හඬට සමාජය තුළ ඉඩකඩ විවර වීමක් සිදුවෙමින් ඇති බවට ඉඟි පළකරමින් තිබුණේය. වඩා පුළුල් ලෙස මෙවර සහෝදරත්වයේ වැඩසටන් ගණනාවක් උතුරේ මෙන්ම දකුණේද ක්‍රියාවට නැගීමට හැකිවිය. ජූලි 19 වන දා අත්පත්‍රිකා බෙදාහරිමින් සමාජය දැනුවත් අරඹූ අතර ජූලි 23 යාපනයේ ට්‍රිමර් ශාලාවේදී පැවති සහෝදරත්වයේ සාහිත්‍ය උළෙල වඩා විචිත්‍රවත් එකක් විය. ජාතික සමගිය තේමාකොට ගනිමින් පාසල් මට්ටමින් කාණ්ඩ 3ක් යටතේ මෙන්ම විවෘත අංශයෙන් එක් කාණ්ඩයක් යටතේත් දිවයින පුරා විසිරී සිටින නිර්මාණ කරුවන්ගේ කවි, චිත්‍ර, නැටුම්, යන ක්ෂේත්‍රයන්ගේ නිර්මාණයන් කැඳවා තොරාගත් නිර්මාණ සඳහා ත්‍යාග සහ සහතික පත් පිරිනැමීම සිදුකෙරිණි. සිංහල දෙමළ මුස්ලිම් සහොදරත්වයේ අවශ්‍යතාවය තහවුරු කරමින් ජවිපෙ නායක අනුර දිසානායක සහෝදරයා අතුළු සිංහල, දමිළ, මුස්ලිම් විද්වතුන් රැසකගේ අදහස් දැක්වීම්වලින්ද සුසැදි සහෝදරත්වයේ සොදුරු වේදිකාවක් තැනිණි. එපමණක් නොව උතුරු ප්‍රදේශයේ විශේෂ කලා හැකියවන් සහිත පිරිසකගේ නිර්මාණයන්ගෙන් හැඩවුණු ප්‍රසංගයක්ද පැවැත්වූයේ සිංහල දෙමළ මුස්ලිම් විශාල පිරිසකගේ සහභාගිත්වයක් සහිතවය.

එලෙස විචිත්‍රවත්වූ සහෝදරත්වයේ සාහිත්‍ය උළෙලින් 23 වදා නිමාවුවද යාපනය හා කිලිනොච්චි යන දිස්ත්‍රිකක්යන්හි ස්ථාන 06කෙදී 24 වනදා ''සහෝදරත්වයේ නෑගම් යෑම'' ඇරඹුණි. (වාදරවත්ත, මූලායි නැගෙනහිර, නාවක්කුලි, නවක්කුලි ගෙවල් 05, භාරතීපුරම් හා කල්මඩු) මෙහිදී සිදුකරන ලද ප්‍රමුඛ කාර්යයන් අතර පාසල් මෙන්ම පෙරපාසල් ප්‍රතිසංස්කරණය, පෙරපාසල් සදහා අවශ්‍ය ඩෙස්පුටු ආදී උපකරණ ලබාදීම, පාසල් මෙන්ම පෙරපාසල් ළමුන් සදහා අවශ්‍ය පාසල්බෑග් පාසල් උපකරණ ලබාදීම, චිත්‍ර හා අධ්‍යාපනික වැඩමුළු පැවැත්වීම වෛද්‍ය සායන පැවැත්වීම, සහෝදරත්වයේ ක්‍රීඩාවැඩසටහන් මෙන්ම සහෝදරත්වයේ සංස්කෘතික සැඳෑවන් පසුගිය ජූලි, 24,25,26 යන දිනයන් හිදී පවත්වන ලදී.

තවත් සුවිශේෂී වැඩසටහනක් වූයේ 28 වන දින කොළඹ දී ක්‍රියාත්මක වූ සහෝදරත්වයේ සිත්තම හා සංගීත සැදෑවයි. එහි විශේෂත්වයක් වූයේ, මේ සදහා රටේ විද්වත් වෘත්තික මෙන්ම ආගමික නායකයින්, කලාකරුවන්, රැසක් සහභාගිත්වය හා දායකත්වය මේ සඳහා ලබාදීමයි. ඒ, අන් යමක් උදෙසා නොව රටේ ජාතිකත්වයන් අතර සහෝදරත්වය ගොඩනැගීම උදෙසායි; අප රටේ ධනපති පාලකයන් විසින් ජාතිවාදයත් වෛරයත් වපුරමින් යන වටපිටාවක ඊට එරෙහිව තම පටු පුද්ගලික වාසි පසෙකලා කටයුතු කිරීම සඳහායි. සහෝදරත්වය හා සමගියේ පණිවිඩය සමාජය වෙත රැගෙන යාමට ඔවුන් සතු හැකියාව ලබාදීම සඳහායි. මේ මොහොතේ සමාජයට ආදරය කරන කාගේත් වගකීම එයයි.

මෙලෙස වඩාත් පුළුල් වු අර්ථයෙන් සහෝදරත්වයේ වැඩසටහන් මාලාවකට කියාවට නැගූ පළමු අවස්ථාව මෙයයි. මෙය සමාජවාදී තරුණ සංගමය ලෙස අප ලද ජයග්‍රහණයකි. මේ දක්වා වන තරමට අපට පළල් ක්‍රියාකාරීවයකට යාමට හැකිවූයේ කණ්ඩායමක් ලෙස එක අරමුණකට අනුව කටයුතු කිරීම නිසාය. අභාවයට යමින් ඇති අප රටේ ධනවාදයට තවදුරටත් ලාංකේය සමාජය ලබාදිය හැකි ජයග්‍රහණයක් නොමැත. අප හමුවේ හෙට දවසේ ඇති අභියෝගයනම් මේ ධනපති ක්‍රමය තුළ වැඩෙමින් පොෂණය වෙමින් යින ජාතිවාදී මතවාද පැරදවීමත් ඊට එරෙහිව ජාතික සමගිය දිශාවට සහෝදරත්වය වර්ධනය කිරීමත්ය. අපගේ පසුගිය ගමන්මඟ ඔස්සේ බලන කළ ඉතා දුෂ්කර තත්වයක සිට අද දක්වා බොහෝ අභියෝගයන් අප විසින් ජයගෙන ඇත. හෙට දවසේ අභියෝග නිසැක ලෙසම ජයගත හැක්කේද අද වන විට අප එදාට වඩා හැම අතින්ම බොහෝ සේ ශක්තිමත් වී ඇති බැවිනි.

# ඉතින් අපි කවදාක හිනැහෙමුද ඒ රටේ...

රටක් ලෙසත් මිනිස් සමාජයක් ලෙසත් අපට පසුගිය දශක තුනකට ආසන්න කාලය ඉතා අසීරු කාලපරාසයකි. එකී කාලය තුළ අපේ රටේ ජනතාව අතර ක්‍රමයෙන් වර්ධනය වූ සැකය හා අවිශ්වාසය වෙනුවට සමගිය හා සහෝදරත්වය වර්ධනය කළ යුතු කාලය දැන් ඕනෑවටත් කල් පමා වී ගොසිනි. ඉදින් එකී අඩුව පුරවාලමින් අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ජනතාවත් අතර වෛරයේ ගිනිදැල් වෙනුවට මානව සහෝදරත්වයේ මෘදු සිසිලස බෙදාහරින්නට සමාජවාදී තරුණ සංගමය විසින් 2008 වසරේ සිට මේ දක්වා සෑම වසරකම ජූලි 23 දිනය සහෝදරත්වයේ දිනය ලෙස නම් කරනු ලැබ ඇත.

මෙවර සහෝදරත්වයේ දිනය වෙනුවෙන් සමාජවාදී තරුණ සංගමය විසින් උතුරට නැගම් ගියේ එකී වගකීම පෙරදැරිවය.


ධනවාදය තුළ නිර්මාණය කරන ලද 30 අවුරුදු යුද්ධය විසින් උතුරේද දකුණේද ජනතාවට උරුම කර ඇත්තේ කුමක්ද? ඇසට කඳුළු උනන යථාර්ථයක ජීවත් වන උතුරේ සහෝදර ජනයා එකී සත්‍යයේ ප්‍රථම සහ විශාලතම ගොදුර බවට පත් වී ඇත්තේය.

එහි ජීවත් වන කුඩා දරුවන්ට යුද්ධය කෙතරම් බලපා ඇත්දැයි දැනෙන්නට එක් උදාහරණයක් හොඳටම ප්‍රමාණවත් වනු ඇත. අප කවුරුත් දන්නා බොහෝ ජන ක්‍රීඩා ආදිය නිර්මාණය වන්නේ අපේ ජීවන අත්දැකීම් ඇසුරෙන් බව අපි දනිමු. ඉතින් අපට හමුවුණු යාපනය නාවක්කුලි ගම්මානයේ දරුවන් පිරිසක් කළ ක්‍රීඩාවක සිංහල තේරුම වූයේ "තක්කාලි තක්කාලි, ලොකු ලොකු තක්කාලි, මීළඟ බෝම්බෙ වැටෙන්නේ කොහෙටද?" යන්නයි. සැබැවින්ම අවුරුදු 30ක් පුරා දිවා රාත්‍රී දෙකෙහිම ඔවුන්ගේ හිස තුළ දැගලූ එකම පැනයද එයමය.

ඒ එක් අත්දැකීමකි. අනෙක් අතට දකුණේ ජනයා මුහුණපාන ආර්ථික අර්බුදය අපි හොඳහැටි අත්දැකීමෙන්ම දනිමු. බොහෝ අය සිතන්නේ 'උතුරට වසන්තය' දැන් එළඹ ඇතැයි කියාය! අපේ රටේ පාලකයින් විසින් යුද්ධය අවසන් වී වසර 07 කුත් ඉක්ම යන තෙක් උතුරට දුන් වසන්තයක් නැත.

වාදරවත්ත නම් ගම්මානයේ වැසියන් විසින් තමන්ට උදව් උපකාර කළ සමාජවාදී තරුණ සංගමයේ සාමාජිකත්වයට කළගුණ සැලකීමේ උත්සවයක් සූදානම් කළහ. ඔවුන්ට දීමට හැකිවූ උපරිම සත්කාරය කිරි තේ වීදුරුවකි. කල්පනාවට ගත යුත්තේ එයය. අසරණ මිනිසුන්ට කිරි තේ පානය කිරීම උත්සව අවස්ථාවක් බවට පත්කර ඇති මෙවැනි පාලනයන් තවත් මේ රටට අවශ්‍යද? උතුරටත් දකුණටත් ධනවාදය නිසාත් ධනවාදයේ නිර්මාණයක් වූ යුද්ධය නිසාත් අත්වූ සෙතක් නැත. අදටද නැත. හෙටද නොවනු ඇත. ඒ නිසා සෑම මිනිසෙකුටම මිනිසෙකු ලෙස ජීවත් විය හැක්කේ සමාජවාදය තුළ බවට සැකයක් නැත. ඒ මනෝරාජික අදහසක් නොවේ. ලෝකයේ උදාහරණ ඕනෑ තරම්ය. "ඉතින් අපි කවදාක හිනැහෙමුද ඒ රටේ..."

සහෝදරත්වයේ දිනය වෙනුවෙන් පැවැත්වූ සහෝදරත්වයේ සාහිත්‍ය උළෙලේ විවෘත අංශයේ පළමු ස්ථානය දිනාගත් චිත්‍රය






















# ජාතික ආණ්ඩුවේ දෙවැනි ඉනිම?

එ.ජා.ප.-ශ්‍රීල.නි.ප. හවුල් ආණ්ඩුව හෙවත් ඊනියා ජාතික ආණ්ඩුවේ ආයු කාලය වසර 05 දක්වා දික්කර ගත් බවත් එය බිඳ වැටීමට ඉඩ නොදෙන බවත් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පසුගියදා ප්‍රකාශ කළේය. ඒ, 2015 අගෝස්තු මහ මැතිවරණයෙන් පසු එ.ජා.ප.ය හා ශ්‍රීල.නි.ප.ය අතර වසර දෙකක හවුල් පාලනයක් සඳහා අත්සන් කළ ගිවිසුම වසර පහක් දක්වා දීර්ඝ කිරීමෙන් පසුවය. මෛත්‍රී රනිල් ආණ්ඩුවේ පළමු ඉනිම වූ වසර දෙකක කාලය නිමා වීමටත් පෙර ඔවුන් දෙවැනි ඉනිමද ක්‍රීඩා කිරීමට තීරණය කර තිබේ. ඒ කුමක් සඳහාද? ජනාධිපතිවරණයේදී පැවසූ පරිදි "රටේ සංවර්ධනය" ඉදිරියට ගෙනයාම සඳහාද? නැතිනම් තම බල කඳවුර ශක්තිමත් කර ගැනීමට " කාලය හා අවකාශය" ලබා ගැනීම සඳහා සහ තවදුරටත් බලය භුක්ති විඳීම සඳහාද? අප ඉදිරියේ මැවෙන ගැටලු මේවාය.

2015 අගෝස්තු මහ මැතිවරණයෙන් පසු දිග හැරුණු හවුල් ආණ්ඩුවේ වසරක කාලය දෙස බැලීමෙන්ම මෙම ආණ්ඩුවේ ගමන් මග වැටී ඇත්තේ කුමන දිශාවකට දැයි වටහා ගත හැකිවේ. පළමු වසර තුළදීම තම අසමත්කමත් අවිධිමත්කමත් අපිළිවෙළත් හොඳින් පෙන්වූ ආණ්ඩුව බලයට ඒමට පෙර කථාකළ යහපාලනය, ප්‍රජාතන්ත්‍රවාදය, ආර්ථික කළමනාකරණය මනෝරාජික සංකල්ප පමණක්ම බවත් තහවුරු කළේය. පසුගිය වසර 68ක් තුළ පැවති සියලු පාලනයන් මෙන්ම වත්මන් පාලනයද ආර්ථිකය සංවර්ධනය කිරීමට හෝ ජනතා ප්‍රශ්න විසඳීමට සමත් නැති බවත් ඒ සඳහා අඩු ගණනේ උත්සාහයක්වත් නැති බවත් දැන් පෙන්වා හමාරය. පසුගිය වසරේ පළමු ඉනිමේදී ආණ්ඩුව එල්ල කරන ලද පහරවල් වූයේ වැට් බදු වැඩිකිරීම, (එය හයේ පහරක් වූ අතර එම පහර නීති විරෝධී බව අධිකරණය පැවසීය.) තව තවත් ණය ගැනීම, මහ බැංකු බැඳුම්කර වංචාව යට ගැසීම, බඩුමිල වැඩිකිරීම, පෙළපාලි යන සිසුන්ට පහර දීම, හොරුන්ට ඇමතිකම් දීම වැනි ඒවාය. ඒවායින් ජනතාවට සිදුවූයේ පාඩුවක්, පීඩාවක්, අවැඩක් මිස වාසියක් නොවේ. ආදායම් මර්ග බිඳවැටීම නිසාත් ණයබර සඳහා වාර්ෂිකව රාජ්‍ය ආදායම තරම් මුදලක් ණය පොලී වාරිකය වෙනුවෙන් ගෙවීමට සිදුවීම නිසාත් නාස්තිය හා දූෂණය නිසාත් මුදල් නොමැති අර්බුදයකට ආණ්ඩුව මුහුණදී සිටී. ආදායම් උත්පාදනය නොවීම නිසා මුදල් නොමැතිකමින් ලියුකේමියා හැදුණු, ආර්ථිකයකට 'ලේ' දීම



සඳහා බදුබර මගින් ජනතාවගේ ලේ උරා බීමට ආණ්ඩුව පියවර ගෙන තිබේ. හවුල් ආණ්ඩුවේ වසර දෙකේ පළමු ඉනිමෙන් අඩක් ගෙවීමටවත් පෙර ආණ්ඩුව තම බැරිකම හා ජනතා විරෝධීකම පෙන්වා තිබියදී දැන් පළමු ඉනිම නිමාවීමටත් පෙර දෙවන ඉනිමට අත්සන් තැබීම ජනතාවගේ පැත්තෙන් යහපත් වන්නේ නැත.

**එසේ නම් "ජාතික ආණ්ඩුවේ" දෙවැනි ඉනිම කාටද? කුමක් සඳහාද? පැහැදිලිවම මෙය බලය සඳහාය. තවදුරටත් පිටියේ රැඳී සිටීම සඳහාය. ජනතාව වෙනුවෙන් නොව තමන් වෙනුවෙන් ලකුණු (දේශපාලන බලය හා වරප්‍රසාද) රැස්කර ගැනීම සඳහාය.**

වත්මන් පාර්ලිමේන්තුවේ එ.ජා.ප.යට මෙන්ම ශ්‍රීල.නි.ප.යටද තනිව ආණ්ඩුවක් පිහිටුවීමට බහුතර බලයක් නැත. හවුල් ආණ්ඩුවකට පදනම සකස් වන්නේ එම කරුණ නිසාය. වසර 20ක් විපක්ෂයේ සිටි එ.ජා.ප.යට බලයේ රහ බැලීමට අවශ්‍යය. තනිව බැරිනම් හවුලේ හෝ බලයේ රස බැලිය යුතුය. ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක්වූ 19වන සංශෝධනයට අනුව (තුනෙන් දෙකක යෝජනාවකින් හැර) පාර්ලිමේන්තුවට වසර හතර හමාරක් පිරෙනතුරු එය විසුරුවාලීමට නොහැක. හදිසි මැතිවරණයකින් දැනට ඇති බලයේ ප්‍රමාණ වෙනස්කර ගැනීමටද නොහැක. **එ.ජා.ප.යට ජනාධිපතිකමද නැත. එය පවතින්නේ මෛත්‍රීපාල සිරිසේන මහතා අතය. ඔහු ශ්‍රීල.නි.ප. වත්මන් නායකයාය. එසේ වූ විට ශ්‍රීල.නි.ප.ය සමඟ වූ දීගය යළි දික්කර ගන්නවා මිස වෙනත් විකල්පයක් එ.ජා.ප.යට නැත. එබැවින් එ.ජා.ප.යේ අරමුණ "හවුලේ රට හැදීම" නොව හවුලේ හෝ බලය පවත්වාගෙන යාමය.** එ.ජා.ප. පාලනයකට එරෙහිව විපක්ෂයේ සිට අරගල කළ යුතු ශ්‍රීල.නි.ප.යෙන් අඩක් ආණ්ඩුවට එක්වී පාලනයට සහාය දීම එ.ජා.ප.යේ පැත්තෙන් වාසියකි.

අනෙක් අතට මහින්ද රාජපක්ෂගේ ඒකාබද්ධ විපක්ෂයේ කල්ලියද රනිල් වික්‍රමසිංහ මහතා සමඟ යටින් ඇතිකරගත් අවබෝධයකින් ක්‍රියාත්මක වීමත් ඔවුන් මෛත්‍රීපාල සිරිසේන මහතාගේ නායකත්වයෙන් යුත් ශ්‍රීල.නි.ප. කණ්ඩායමට පහර එල්ල කිරීමත් එ.ජා.ප.යට හොඳය. හවුල් පාලනයටද නරක නැත. ඒ, මේ සියල්ල මැද ජනතාවද තුෂ්නිම්භූතව සිටින බැවිනි. මහින්ද රාජපක්ෂ කල්ලියේ 'නීති විරෝධී' පන්දු වාසි ගෙනෙන්නේ මෛත්‍රී-රනිල් හවුල් පාලනයටමය. මේ සඳහා හොඳම උදාහරණය රාජපක්ෂ කල්ලිය රවී කරුණානායකට එරෙහිව ගෙනා විශ්වාසභංග යය. ඉන් සිදුවූයේ සැබෑ ලෙසම විශ්වාසය භංගවී සිටි රවී කරුණානායක පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයකින් විශ්වාසය පෙන්වා නිර්දෝෂී වීමය.

**මෛත්‍රීපාල ජනාධිපතිවරයාගේ පැත්තෙන් ගත් විටද වත්මන් හවුල් පාලනය වසර 05 දක්වා දිගුකර ගන්නවා හැර අන් විසඳුමක් ඔහුට නැත. මෛත්‍රීපාල මහතාට ජනාධිපති බලය තිබුණද ආණ්ඩු බලය නැත. පක්ෂයේ නායක බලය තිබුණද පක්ෂයේ බිමේ බලය නැත. එබැවින් මේ ගැටලු දෙකටම ඔහුගේ පැත්තෙන් විසඳුම වන්නේ, කෙසේ හෝ ආණ්ඩුව තුළම සිටීමය.** ආණ්ඩු බලයෙන් වෙන් කරලද ජනාධිපති බලය නොන්ඩි ගසන අශ්වයෙක් බව ඔහු දනී. එසේම පක්ෂයේ බලය තමන් අත තබා ගත හැක්කේද, ශ්‍රීල.නි.ප.යේ පිරිසක් තමන්ට පක්ෂපාතීව තබාගත හැක්කේද රාජ්‍ය බලය මගින් ඔවුනට ඇමතිකම් ඇතුළු විවිධ වරප්‍රසාද දීමෙන් බව ඔහු දනී. එ.ජා.ප.ය වසර 20ක් විපක්ෂයේ සිටි නිසා බලයට කෑදර සේම ශ්‍රීල.නි.ප.ය වසර 20ක් බලයේ සිටි නිසා ඔවුන්ද බලයට කෑදරය. ඔවුනට බලය නැතිව, ඇමතිධුර නැතිව ජීවත් විය නොහැක. එ.ජා.ප.යෙත්, ශ්‍රීල.නි.ප.යෙත් මෙම බලයේ අරමුණ සමපාත වූ විට ඊනියා ජාතික ආණ්ඩුවේ පැවැත්ම තර්කානුකුල යථාර්ථය බවට පත්වේ. ශ්‍රීල.නි.ප.ය විවිධ තර්ක නගමින් වසර දෙක පහ දක්වා දිගුකර ගන්නේ මේ නිසාය.

මෙහිදී ශ්‍රීල.නි.ප.ය අර්බුදයකටද මුහුණ දේ. එ.ජා.ප.ය සමඟ ආණ්ඩුවක සිටින විට හා එම ආණ්ඩුවේ ජනතා විරෝධී ක්‍රියාමාර්ග නිසා බිමේ ශ්‍රීල.නි.ප. පාක්ෂිකයාගේ විරෝධයට මුහුණ දීමට ආණ්ඩුව තුළ සිටන ශ්‍රීල.නි.ප. නායකයින්ට සිදුවේ. එහෙත් අනෙක් අතට බලය නැතිව ජීවත්වීමටද ඔවුනට හැකියාව නැත. මෙම ප්‍රතිවිරෝධය සමනය කර ගැනීමට ඔවුන් උපයෝගී කරගන්නා උපක්‍රමය වන්නේ (ඒවා පැස්බරා හිස සඟවා ගැනීම වැනි වුවත්) ඒ අතකින් ආණ්ඩුව තුළ තාවකාලිකව සිටින බව ඇඟවීමෙනි. මුලින් අත්සන් කළ ගිවිසුම වසර 02කට සීමා කළේ එබැවිනි. එසේම ආණ්ඩුවේ සමහර ක්‍රියාමාර්ගවලට තමන් එකඟ නැති බව පවසා ඇඟ බේරා ගැනීම අනෙක් උපක්‍රමය වේ.

පළමු වසර දෙක නිමා වීමට පෙර හවුල් ආණ්ඩු ගිවිසුම වසර පහ දක්වා දිගු කිරීමට මෛත්‍රීපාල ජනාධිපතිවරයාට සිදු වන්නේ ඇයි? රාජපක්ෂ කල්ලිය ඔහුට එරෙහිව ශ්‍රීල.නි.ප. නායකත්වය මහින්ද රාජපක්ෂ අතට ගැනීමට කරන වැඩ තීව්‍ර වන විට, ආණ්ඩුව තුළ ශ්‍රීල.නි.ප. පැවැත්ම තාවකාලික යයි හෝ එය වසර දෙකෙන් අවසන් වේ යැයි දැනුණහොත් බලය වෙනුවෙන් මෛත්‍රී වටා සිටිනා අයගේ ධෛර්ය හීන වී ඔවුන්ද මෛත්‍රීගෙන් ඉවත් වීමට ඉඩ තිබේ. ඒ නිසා බලයට කෑදරකම මත මෛත්‍රී සමඟ සිටින අයට තවදුරටත් බලයේ සිටිය හැකි බවට සහතිකයක් දීම අවශ්‍ය වේ. ඊනියා ජාතික ආණ්ඩු ගිවිසුම හදිසියේ වසර 05 දක්වා දීර්ඝ වූ බව පැවසෙන්නේ ඒ අනුවය.

**රාජපක්ෂ මහතා වටා සිටිනා කල්ලිය ඔහු වටා තබා ගැනීම සඳහා රාජපක්ෂ මහතා නැවත බලයට එන බවත් ආණ්ඩුව ඉක්මනින් පෙරළා තමන් බලය ගන්නා බවත් පාක්ෂිකයන්ට තහවුරු කළ යුතුය. රාජපක්ෂලා කියන කරන දේවල් හා පා ගමන් පදනම් වී ඇත්තේ එම කරුණ මතය. එලෙසම මෛත්‍රීපාල වටා සිටින පිරිස ඔහු වටාම තබා ගැනීම සඳහාද ඔවුන් තවදුරටත් බලයේ සිටින බවත් ආණ්ඩුව ඉක්මනින්ම බිඳ නොවැටෙන බවත් තහවුරු කළ යුතුය. ජනාධිපතිවරයා පසුගියදා කළ ප්‍රකාශය සිදු කරන්නේ ඒ නිසාය.**

**මේ සියල්ල දෙස විමසිල්ලෙන් බලන විට ඉතා හොඳින් පැහැදිලි වන්නේ ඊනියා ජාතික ආණ්ඩු සංකල්පය තුළ ශ්‍රීල.නි.ප මෛත්‍රී පිල හා එ.ජා.ප.යත් විපක්ෂයේ සිටින**

15 වැනි පිටුවට

> "පසුගිය වසරේ පළමු ඉනිමේදී ආණ්ඩුව එල්ල කරන ලද පහරවල් වූයේ වැට් බදු වැඩිකිරීම (එය හයේ පහරක් වූ අතර එම පහර නීති විරෝධී බව අධිකරණය පැවසීය), තව තවත් ණය ගැනීම, මහ බැංකු බැඳුම්කර වංචාව යට ගැසීම, බඩුමිල වැඩිකිරීම, පෙළපාලි යන සිසුන්ට පහර දීම, හොරුන්ට ඇමතිකම් දීම වැනි ඒවාය. ඒවායින් ජනතාවට සිදුවූයේ පාඩුවක්, පීඩාවක්, අවැඩක් මිස වාසියක් නොවේ."



"සමාජමය නිෂ්පාදනය හා බෙදා හැරීම විද්‍යාත්මක මාර්ගයක් අනුව පුළුල් ලෙස ව්‍යාප්ත කිරීමට, ඒවා වැඩකරන ජනතාවගේ ජීවිතය පහසු කිරීමේ සහ හැකි තරම් දුරට ඔවුන්ගේ යහ සාධනය වැඩි දියුණු කිරීමේ අරමුණාට යටත් කිරීමටත් ඉඩ සලසන්නේ සමාජවාදය පමණාකි. මෙය ඉටු කළ හැක්කේ සමාජවාදයට පමණාකි."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**8වැනි වෙළුම,**
**134 පිටුව**

# රටපුරා VAT විරෝධී සටන්






රට තුළ සටනක් ඇවිල තිබේ. පක්ෂ පාට බේදයකින් තොරව පොදු ජනයා මෙන්ම රටේ විවිධ ස්ථර නියෝජනය කරන කොටස් මේ සටනට අවතීර්ණ වී සිටී. රනිල් - මෛත්‍රී හවුල් ආණ්ඩුව විසින් අසාධාරණ ලෙස වැඩි කළ වැට් බද්දට එරෙහිව ගෙන යන මේ විරෝධතාවයන්ට ආරම්භය දෙන ලද්දේ ජ.වි.පෙ. විසිනි.

අත් පත්‍රිකා බෙදා හැරීම්, සාකච්ඡා සම්මන්ත්‍රණ ආදිය පවත්වා වැට් බද්දට එරෙහිව මතවාදී අරගලයක් ගොඩනැගීමද අනෙක් පැත්තෙන් උද්ඝෝෂණ ක්‍රියා මාර්ග දියත් කරමින්ද පොදු ජනතාව මේ අරගලයට සම්බන්ධ කර ගැනීමටද ජ.වි.පෙ. මූලික වී සිටී.

පසුගිය ජූලි මාසයේදී 'ණයබර, බදුබර හා බිඳ වැටෙන ආර්ථිකය' යන මැයෙන් සම්මන්ත්‍රණ මාලාවක්ද, ඒ හා සමගාමීව දිවයින පුරා ප්‍රධාන නගරයන්හි ජ.වි.පෙ. මූලිකත්වයෙන් උද්ඝෝෂණ මාලාවක්ද සූදානම් කර තිබුණි.

මේ සම්මන්ත්‍රණ මාලාවේ තවත් එක් සම්මන්ත්‍රණයක් පසුගිය ජූලි මස 20 වැනිදා ගාල්ල කරන්දෙනිය ප්‍රදේශයේදී ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු අතර පසුගිය ජූලි 07 වෙනිදා මහරගම නගරයේදීද වැට් විරෝධී උද්ඝෝෂණ මාලාවේ එක් උද්ඝෝෂණයක් බස්නාහිර පළාත් සභා මන්ත්‍රී ලක්ෂමන් නිපුණආරච්චි සහෝදරයාගේ ප්‍රධානත්වයෙන්ද පැවැත්වුණි.

# ජාතික සමගිය වෙනුවෙන්






ජූලි මාසය 1977 න් පසු අපේ රටේ ඛේදවාචක කිහිපයකට මුල් වූ මාසයක් ලෙස හැඳින්විය හැක. එහි ප්‍රධාන සිද්ධීන් දෙකක් පිළිබඳව අවධානය යොමු කළ හැකිය. ඒ, 1980 ජූලි මාසයයි. පැවතියේ ජේ.ආර්. ජයවර්ධනගේ එ.ජා.ප. ආණ්ඩුවයි. ඉහළ යන ජීවන වියදම හමුවේ තම ජීවන වියදම් දීමනාව රු. 05කින්ද මාසික වැටුප රු10කින්ද ඉහළ දමන ලෙස ඉල්ලා ප්‍රධාන වශයෙන් රාජ්‍ය අංශයේ සේවක සේවිකාවන්ද දැවැන්ත වැඩ වර්ජනයකට අවතීර්ණ වී සිටි මොහොතයි. එහි අවසාන ප්‍රතිඵලය වූයේ ජේ.ආර්. ඒකාධිපතියෙකු වෙමින් 114,000 කට පමණ රැකියා අහිමි කිරීමය.

1983 ජූලි ජාතිකව මෙන්ම ජාත්‍යන්තරවත් කළු පැල්ලමක් ඇති කළ ඒ බිහිසුණු මාසයයි. සිංහල, දෙමළ දේශපාලන නායකයන්ගේ බල ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතිවාදය වැපිරවීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵල නිකුත් වූ මාසය ලෙසද මෙය හැඳින්විය හැක. එම ජූලියේ ඇතිවූ කලබලකාරී තත්වය තුල පැවති ජයවර්ධන පාලනය සිතූ සේ ජාතිවාදීන්ට කටයුතු කිරීමට ඉඩ දී කල් හැරියා මිස එම ජාතිවාදී ගැටුම් නැවැත්වීමට කටයුතු කළේ නැත.

ඉහත සිද්ධි දෙක පිළිබඳ මදක් අවධානය යොමු කරමු. 1980 ජූලි වර්ජනයේදී ගැටුම ඉතා පැහැදිලිය. තම ශ්‍රමයට කිසියම් ගෙවීමක් ඉල්ලා සිටින වැඩ කරන ජනයාත් එම ගෙවීම ප්‍රතික්ෂේප කරන ධනපති පාලනයත් මේ ගැටුමේ ප්‍රධාන පාර්ශව දෙක විය. එහෙත් 1983 ජූලි මාසයේ ඇතිවූ ගැටුම්වල මූලික පාර්ශවයන් සේ පෙනුණේ සිංහල, දෙමළ ජාතිකත්වයන්ය. සැබැවින්ම මෙරට පසුගාමී ධනපති දේශපාලඥයන්ගේ වුවමනාව වූයෙත් මෙයයි. එනම් සැබෑ පංති ගැටුම යටපත් කර එකම පංතියේ මිනිසුන් ජාතිකත්ව පදනමින් ඇණ කොටා ගන්නා තත්වයට පත් කර තම පැවැත්ම තහවුරු කර ගැනීමයි.

වසර 30 කට අධික කාලයක් දිග් ගැසුණු යුද්ධය අවසන් වීමෙන් පසුව පවා මෙරට පාලකයන් සිදු කළේ ජාතිවාදය තව තවත් පෝෂණය කිරීමය. පැවති රාජපක්ෂ පාලනය එයට කදිම නිදසුනකි. මේ තත්වය අවබෝධ කරගත් ජ.වි.පෙ. ජාතික සමගිය වෙනුවෙන් වැඩි බරක් තබමින් කටයුතු කරමින් සිටි. ඒ අනුව ජ.වි.පෙ. තරුණ සංවිධානය වන සමාජවාදී තරුණ සංගමය විසින් කළු ජූලිය සොඳුරු ජූලියක් බවට පත් කර ගැනීමේ වුවමනාවෙන් මෙවරද වැඩසටහන් රාශියක් දියත් කරන ලදී. පසුගිය ජූලි 23වැනිදා 'සහෝදරත්වයේ සාහිත්‍ය උළෙල' නමින් යාපනේ ට්‍රිමර් ශාලාවේදී සාහිත්‍ය උළෙලක් පවත්වනු ලැබිණි. මේ අවස්ථාව සඳහා ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා ඇතුළුව කලාකරුවන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, විද්වතුන්, ආදී විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් පිරිස් පැමිණ සිටියහ. මේ හා සමාන්තරව ඇතැම් ගම්මානයන්හි වෛද්‍ය සායන පැවැත්වීම, පෙර පාසැල්, ප්‍රජා ශාලා ආදිය පිළිසකර කරදීම ආදියද සමාජවාදී තරුණ සංගමයේ මැදිහත් වීමෙන් සිදුවිය.




# STOP SAITM

පෞද්ගලික වෛද්‍ය විද්‍යාල පිළිබඳ කථිකාව දශක දෙකකට එපිට කාලයකට ඇදී යයි. අසූව දශකයේදී උතුරු කොළඹ වෛද්‍ය පීඨයට අනුබද්ධව පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් ස්ථාපිත වූ අතර මෙයට එරෙහිව ප්‍රබල ජනතා විරෝධයක් මතු වූ හෙයින් එය හකුළාගැනීමට එවකට පැවති එ.ජා.ප ආණ්ඩුවට සිදුවිය. ඒ දවසද පෞද්ගලික වෛද්‍යවිද්‍යාල අහෝසි කිරීමේ සටනට නායකත්වය දී තිබුණේද ජ.වි.පෙ.ය.

අද දවසේද පෞද්ගලික වෛද්‍යවිද්‍යාල කථිකාව නැවත වටයකින් උච්ස්ථානයකට පැමිණ තිබේ. මේ වන විට ජ.වි.පෙ. ශිෂ්‍ය හා තරුණ සංවිධානද, වෘත්තීය සමිති ව්‍යාපාරයද, කාන්තා සංවිධානද මාලඹේ පිහිටා ඇති සයිටම් පෞද්ගලික වෛද්‍ය උපාධි ආයතනය අහෝසි කරන ලෙස ආණ්ඩුවට බල කිරීමේ ක්‍රියාමාර්ග රැසකට අවතීර්ණ වී සිටී.

'ජීවිත වනසන, අධ්‍යාපන අයිතිය අහෝසි කරන ආණ්ඩුවේ ප්‍රතිපත්ති පරදවමු'ව යන තේමාව මුල් කරගනිමින් පසුගිය ජූලි මස 12 වෙනිදා කොළඹ හයිඩ් පිටියේදී පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විරෝධී මධ්‍යස්ථානය විසින් රැලියක් සූදානම් කර තිබුණි. මේ රැලිය සඳහාද මූලිකත්වය ගෙන සිටියේ ජ.වි.පෙ. සහ එයට අනුබද්ධ සංවිධාන සහ කලාකරුවන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, වෘත්තීය සමිති නායකයින්ය. තවද මෙහි ප්‍රධාන දේශනයක් ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා විසින්ද පවත්වන ලදී.

# අයාලේ යන ප්‍රවාහන අර්බුදය



මීට ටික කලකට ඉහත රූපවාහිනී නාලිකාවල එක්තරා චොකලට් වර්ගයක් පිළිබඳ වෙළඳ දැන්වීමක් විකාශනය විය. එම චොකලට් වර්ගය නිපදවන සමාගම එම චොකලට් වර්ගය හඳුන්වා දී තිබුණේ ට්‍රැෆික් ජෑම් (Traffic Jam) වශයෙනි. වෙළඳ දැන්වීමෙහි නිරූපණය වූයේ අධික වාහන තදබදයක රැඳී ඇති වාහනයක් තුළ සිටින තරුණියක් තම ගමනට සංඥා එළි දැල්වෙන තෙක් වාහන හසුරුවන පොලිස් නිලධාරියා දෙසටද දිගු කරමින් චොක්ලට් රසවිඳින ආකාරයයි. මීට වසර කිහිපයකට පෙර විකාශය වූ එම වෙළඳ දැන්වීම අදට අනුකූලව සකස් වන්නේ නම් ඉහත කී තරුණියට තම රථයේ සිට චොක්ලට් පෙට්ටි කිහිපයක්ම ගිල දැමීමට සිදුවනු ඇත. ඒ, මීට වසර කිහිපයකට වඩා අද වන විට මාර්ග හා වාහන තදබදය ඉහළ ගොස් තිබෙන බැවිනි.

නියමුවා පුවත් පත මගින් ආරම්භ කරන ලද ගවේෂණාත්මක ලිපි පෙළ තුළින් මෙවර ගවේෂණයට භාජනය වනු ලබන්නේ මෙරට ප්‍රවාහන අර්බුදයයි.

මේ ප්‍රවාහන අර්බුදය යන්නෙන් බොහෝවිට අද දවසේ අදහස් වන්නේ මාර්ග තදබදය නැතහොත් Trafficය. විශේෂයෙන් මේ මාර්ග තදබදය පිළිබඳව ගැටලුව බොහෝකොටම මතු වන්නේ කොළඹ නගරය හා තදාසන්න ප්‍රදේශවලිනි.

මැතක් වන තුරුම කොළඹ නගරය පැවතියේ මෙරට පරිපාලන හා වෙළඳ නගරය වශයෙනි. පසුව එය වෙනස් වුවත් මේ වන විටත් රටේ පරිපාලන කටයුතු හා වාණිජ කටයුතු කේන්ද්‍ර වී තිබෙනුයේ කොළඹ නගරයටය. එබැවින් රටේ අනෙකුත් නගරයන්ට සාපේක්ෂව කොළඹට ඇදී එන ජනගහනය ලක්ෂ 06කට වැඩිය. මෙසේ රාජකාරී සඳහා මෙන්ම වෙනත් කටයුතු සඳහාද කොළඹට ඇදී එන ජනයා දෛනිකව මුහුණ පාන ප්‍රධාන ගැටලුවක් වී ඇත්තේ අධික වාහන තදබදයයි. උදෑසන පාසල් හා කාර්යාල ආරම්භ කරන වේලාවන්, දහවල් පාසැල් නිමාවන වේලාවන් සහ සවස කාර්යාල අවසන් වන වේලාවන් අධික ලෙස වාහන තදබදය ඇති වන අවස්ථා ලෙස හඳුනාගත හැක.

**පාර මදිද? වාහන වැඩිද?**

ප්‍රවාහනය සඳහා මාර්ග යන්හි තිබෙන සීමිත ඉඩකඩ යානවාහන සඳහා ප්‍රමාණවත් නොවීම තුළ හටගන්නා තත්වය මාර්ග තදබදය ලෙස හඳුන්වනු ලබයි. සාමාන්‍යයෙන් තදබදය යන වචනය භාවිත නොවුවත් මෙවැනි අර්බුද සෑම ක්ෂේත්‍රක් තුළම ඇතිවේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේදී පාසැල්වලට ළමුන් ඇතුළත් කරගැනීමට යාමේදී ඇතිවන්නේද මෙවෙනි තත්වයකි. ඉල්ලුමට අනුව පාසැල් සපයන්නට නොහැකි වීම නිසා අර්බුදයක් හටගනී. රෝහල්වලටද ජනතාගේ සෞඛ්‍ය ඉල්ලීම් සැපිරීමට නොහැකි වීම නිසා එතැනද ඇත්තේ තදබදයකි. සරලව ගතහොත් ජනතාව විසින් ඉල්ලා සිටින ප්‍රවාහන අවශ්‍යතාවයන් සපුරා දීමට පාලකයන්ට නොහැකිවීම මෙවෙනි අර්බුද හට ගැනීමට හේතුව වේ.

කිසියම් මාර්ග යක් සැලසුම් කර තිබෙනුයේ නිශ්චිත රථවාහන සංඛ්‍යාවක් ධාවනය වීම ඉලක්ක කරගෙන නම් එම ප්‍රමාණයට වඩා වාහන ප්‍රමාණයක් එම මාර්ගයේ ධාවනය වුවහොත් එවිට ඇති වනුයේ රථ වාහන තදබදයයි විශේෂයෙන් බස්නාහිර පළාත තුළ කොළඹ නගරය කේන්ද්‍ර කරගත් මාර්ග පද්ධතියක් ගැන අවධානය යොමු කළහොත් එම මාර්ග සැලසුම් කර ඇත්තේ මීට දශක එකකට හෝ දෙකකට පූර්වයෙන් වූ රථ වාහන ප්‍රමාණය ඉලක්ක කර ගනිමිනි. නමුත් මෑත කාලයේදී මෙරටට ගෙන්වන ලද රථ වාහන විශාල ප්‍රමාණය මේ පවතින මාර්ග පද්ධතියට දරා ගත නොහැකි ලෙස වැඩි වී තිබේ.

මෙහි සඳහන් වගුව අනුව විශේෂයෙන් පෞද්ගලික ප්‍රවාහන කටයුතු සඳහා ගෙන්වන ලද වාහන එනම් පෞද්ගලික මෝටර් රථ, ත්‍රී වීල්, යතුරු පැදි ආදිය පසුගිය වසර කිහිපය තුළ මෙරට ලියාපදිංචි වී ඇති ප්‍රමාණයන් මෙසේය.

| වසර | ප්‍රමාණය |
|---|---|
| 2005 | 189,064 |
| 2006 | 248,670 |
| 2007 | 298,179 |
| 2008 | 220,993 |
| 2009 | 178,547 |
| 2010 | 313,531 |
| 2011 | 449,643 |
| 2012 | 322,645 |
| 2013 | 281,333 |
| 2014 | 390,703 |

ඒ අනුව 2005 සිට 2014 දක්වා වසර 10ක කාලය තුළ පෞද්ගලික පරිහරණය සඳහා පමණක් වාහන 2,843,308ක ප්‍රමාණයක් ලියාපදිංචි වී තිබේ.

**පොදු ප්‍රවාහනයේ මළගම**

ඉහතින් අප සඳහන් කළේ මාර්ගවලට දරා ගත නොහැකි ලෙස රථ වාහන ප්‍රමාණය ඉහළ ගොස් ඇති බවය. බැලූ බැල්මට වාහන තදබදයට මුලිකම හේතුව විශාල වශයෙන් වාහන ගෙන්වීම බව පෙනී ගියද මූලිකම හේතුව එය නොවේ.

වර්ෂ 1980 /85 යන කාලවකවානුවලදී රටේ ජනතාවගෙන් 85%ක පමණ පිරිසක් භාවිතා කරනු ලැබුවේ පොදු ප්‍රවාහන සේවයයි. නමුත් 2015 පමණ වන විට එය 47% දක්වා පහත වැටී ඇත. පොදු ප්‍රවාහනය සැලකූවිට ආකාර දෙකකි. එකක් රාජ්‍ය පොදු ප්‍රවාහන සේවයයි. එය මූලික සිදුවන්නේ ලංගම බස් රථ හා දුම්රිය මගිනි. එහෙත් දේශපාලන මැදිහත්වීම් හා දුර්වල කළමනාකරණය හේතුවෙන් රාජ්‍ය පොදු ප්‍රවාහන සේවය බිඳ වැටීමකට ලක්ව ඇත. මේ වන විට දළ වශයෙන් පොදු ප්‍රවාහන සේවයට රාජ්‍ය අංශයේ දායකත්වය 15%-20% ත් අතර ප්‍රමාණයක පවතින අතර පෞද්ගලික අංශයේ දායකත්වය 80%-85% අතරය.

රාජ්‍ය පොදු ප්‍රවාහනය බිඳ වැටීමට සාපේක්ෂව පෞද්ගලික පොදු ප්‍රවාහන බස් රථ පිළිබඳව ජනතාවගේ ඇත්තේද එතරම් හොඳ ආකල්පයක් නොවේ. එබැවින් ප්‍රධාන වශයෙන් මහජනතාව පොදු ප්‍රවාහනයෙන් ඉවත් වෙමින් පවතී. එහි තාර්කික ප්‍රතිඵලය වී ඇත්තේ තමන්ගේ ප්‍රවාහන කටයුතු සඳහා පෞද්ගලික විසඳුම් සෙවීමය. කුමන ආකාරයකින් හෝ මෝටර් රථයක් ත්‍රී වීලයක් නැතහොත් යතුරු පැදියක් හෝ ලබා ගැනීම ඔවුන්ගේ අපේක්ෂාවය.

**ඉල්ලන දේම සැපයීම**

රථ වාහන වැඩි වීම හේතුවෙන් ඇතිවන මාර්ග තදබදය නිසා වඩාත් නියමිත වේලාවට ගමන්බිමන් යාමට නොහැකිවීමෙන් පීඩාවට පත් වන්නේද පොදු ප්‍රවාහනයේ ගමන් කරන මගියාය. එනිසා එම මගීන්ට තමන්ගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාගැනීමට ඇති එකම විකල්පය ලෙස පෙනීයන්නේ, පෞද්ගලිකව වාහනයක් හිමි කර ගැනීමයි.

මගීන් එසේ සිතුවද සෛධාන්තිකව සිදු වන්නේ මෙයයි. වාහන වැඩි වන විට මාර්ගයට ඇති ඉල්ලුම වැඩිවේ. රථ වාහන තදබදයද වැඩිවේ. එවිට බලයේ සිටින පාලකයන් බොහෝ විට සිදු කරනුයේ එම ඉල්ලුමට සරිලන පරිදි මහා මාර්ග පුළුල් කිරීම පිළිබඳව අවධානය යොමුකිරීමය. එනම් මංතීරු ප්‍රමාණ වැඩි කිරීම, අධිවේගී මාර්ග තැනීම, ගුවන් පාලම් ඉදිකිරීම ආදියයි. එවිට නැවත් සිදු වන්නේ මහා මාර්ගවල ආකර්ෂණය වැඩිවීම හේතුවෙන් නැවතත් එම මාර්ග පෞද්ගලික වාහනවලින් පිරීයාමය. එවිට නැවතත් ඒ ආකාරයටම රථ වාහන තදබද ඇතිවේ. ඉල්ලුම සහ සැපයුම අතර සිදුවන මෙම ක්‍රියාවලිය හේතුවෙන් පෞද්ගලික වාහන මාර්ගවලට එක් කිරීම හෝ මාර්ග තැනීම හෝ මාර්ග තදබදයට ස්ථිර සාර විසඳුමක් ලබා නොදෙයි. ලෝකයේ තිබෙන අත්දැකීම් අනුව මාර්ග තදබදයට මෙය දිගුකාලීන විසඳුමක් වී නොමැත.

"පෞද්ගලික වාහන මාර්ගවලට එක් කිරීම හෝ මාර්ග තැනීම මාර්ග තදබදයට ස්ථිර සාර විසඳුමක් ලබා නොදෙයි. ලෝකයේ තිබෙන අත්දැකීම් අනුව මාර්ග තදබදයට මෙය දිගුකාලීන විසඳුමක් වී නොමැත."

**ප්‍රවාහන දාමයේ බර**

දුප්පතාගෙ හිතවතා ලෙස පාපැදිය හැඳින්වීමට අපි කලක පටන් පුරුදුව සිටියෙමු. ඒ, පාපැදි භාවිතා කරනු ලබන්නේ ආර්ථික වශයෙන් පහළ මට්ටමක සිටින පුද්ගලයින් බවට වන අදහසක් සහිතවය. අද පොදු ප්‍රවාහන සේවයටද සිදුව ඇත්තේ එයයි. එය දුප්පතාගේ ප්‍රවාහන මාධ්‍ය ලෙස සමාජ ආකල්පයක් ගොඩනැගී තිබේ. එනිසා පොදු ප්‍රවාහනය භාවිතා කරන මගියා තුළ පවා පවතිනුයේ කෙසේ හෝ පෞද්ගලික වාහනයක් ලබා ගෙන දුප්පතාගේ ප්‍රවාහන මාධ්‍යයෙන් ඉවත් වීමේ ආකල්පයයි. අප වැනි පසුගාමී ධනේශ්වර සමාජ පසුබිමක් ඇති රටක තමන්ගේ සමාජ මට්ටම පෙන්වීමේ මාධ්‍යයක් ලෙස රථ වාහන යොදාගැනීම සුලභය. මාර්ග තදබදයට ප්‍රධාන හේතුව වී ඇත්තේ පොදු ප්‍රවාහනයෙන් මගියා පෞද්ගලික ප්‍රවාහනයට සීරු මාරු වීම නම් මෙවැනි සමාජීය ආකල්පද අර්බුදය උග්‍ර කිරීමට උත්ප්‍රේරකයක් සපයයි.

ප්‍රවාහනය සම්බන්ධයෙන් අධ්‍යනය කිරීමේදි ප්‍රවාහන දාමය සංචලතාව (Mobility) යන පදය ව්‍යවහාරයට පැමිණේ. අපට මෙහිදී වැදගත් වනුයේ ප්‍රවාහන දාමයේ වියදම පිළිබඳවයි. එය සරලව විස්තර කළහොත් කිසියම් ප්‍රදේශයක නිශ්චිත කාලයක් තුළ ප්‍රවාහනය වෙනුවෙන් ගිය සම්පූර්ණ වියදම ලෙස ගත හැක. එනම් මෙසේය. යම් නිශ්චිත කාලයක් තුළ එම ප්‍රදේශයේ රථ වාහන සඳහා වියදම, මහා මාර්ග සඳහා වියදම, මිනිසුන් ප්‍රවාහනයට යන කාලයේ වියදම, රථවාහනවලින් සිදුවන පරිසර දූෂණය නිසා ගණනය කළ හැකි පාඩුව, මාර්ග අනතුරු නිසා වන පාඩුව, එකතු කර කිසියම් ගණනය කිරීමක් කර ප්‍රවාහන දාමයේ වියදම සෙවිය හැක. (මීට අමතරව ගණනය නොකළද මේ දාමයට තව වියදම් එක් කළ හැක එනම් පොලිසි, රක්ෂණ සමාගම්, නීති කටයුතු සඳහා යන වියදම් යනුවෙන්)

15වැනි පිටුවට



"නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදය, ජනගහනයේ අති විශාල බහුතරයක් සඳහා, සූරා කනු ලබන හා වැඩ කරන ජනතාව සඳහා, ලෝකයේ පෙර නොවූ විරූ තරමින් ප්‍රජාතන්ත්‍රවාදයේ සංවර්ධනයක් හා ව්‍යාප්තියක් ගෙන දී තිබේ. සෝවියට් ආණ්ඩුව එම නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදයේ එක් ආකෘතියකි."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**9වැනි වෙළුම,**
**27 පිටුව**

# තුර්කිය: නව දේශපාලන ගමනක

පසුගිය ජූලි 15වැනි සිකුරාදා ජාත්‍යන්තර වශයෙන් වැදගත් සිදුවීමක් සිදුවිය. ඒ තුර්කියේය. එදින තුර්කි හමුදාව එරට ජනාධිපති රසේප් ටියිප් එර්ඩෙගොන්ගේ (Recep Tayyip Erdoğan) ආණ්ඩුව බලයෙන් පහකර රටේ බලය අල්ලා ගැනීමට උත්සාහ කළේය. මෙම හමුදා කුමන්ත්‍රණය පරාජය වුවද, තුර්කිය NATO සාමාජික රටක් වීමත් ඉදිරියේ දී යුරෝපා සංගමයේ සාමාජිකත්වය බලාපොරොත්තුව සිටීමත් මේ මොහොතේ ලෝකයේ ප්‍රධාන ප්‍රශ්නයක් වන මැදපෙරදිග අර්බුදයේත් එහිම කොටසක් වන සිරියානු අර්බුදයේත් ප්‍රධාන පාර්ශ්වකරුවෙකු වීමත් කටාර්, සෞදි අරාබි සහ එක්සත් ජනපදය අක්ෂයේ සිට ඉරාන, සිරියානු හා රුසියානු අක්ෂය වෙත නැඹුරු වීමේ ලක්ෂණ පෙන්නුම් කළා වූ රටක් වීමත් විසින් මෙම සිදුවීමට අමතර අවධානයක් යොමු වී තිබේ.

### කුමන්ත්‍රණය දිගහැරෙයි

එදින රාත්‍රියේදී කුමන්ත්‍රණයට සම්බන්ධ වූ තුර්කි හමුදා සෙබළුන් විසින් ගුවන් තොටුපළවල් දෙකක් අල්ලා ගත් අතර ආසියානු තුර්කිය හා යුරෝපියානු තුර්කිය සම්බන්ධ කරන පාලම් වසා දමනු ලැබීය. ඔවුහු ඉස්තාන්බුල් හා ඇන්කාරා නගරවලට ගුවන් ප්‍රහාර එල්ල කරන්නට පටන් ගත්හ. ඇන්කාරා නුවර පාර්ලිමේන්තු ගොඩනැගිල්ලටත් තුර්කි රහස් තොරතුරු ඒකක ගොඩනැගිල්ලටත් බෝම්බ ප්‍රහාර එල්ල කෙරිණි.



හමුදා කුමන්ත්‍රණය දියත් වෙද්දී තුර්කි ජනාධිපතිවරයා මධ්‍යධරණී මුහුද අසබඩ නිවාඩු නිකේතනයක නිවාඩුව ගත කරමින් සිටියේය. ඔහු වහාම පුද්ගලික ගුවන් යානයෙන් ඇන්කාරා බලා පිටත් වූ අතර තුර්කි CNN සේවයේ නිවේදිකාවක් වෙත දුරකථනයෙන් ඇමතීය. එය සජීවීව CNN නාලිකාව හරහා විකාශනය විය. ජනාධිපතිවරයා ජනතාවගෙන් ඉල්ලා සිටියේ ප්‍රජාතන්ත්‍රවාදය රැක ගැනීම සඳහා වීදි බසින ලෙසය. තුර්කියේ මුස්ලිම් පල්ලි හරහාද කුමන්ත්‍රණයට විරුද්ධව වීදි බසිනා ලෙසට ජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබිණි. ඊට ප්‍රතිචාර ලෙස ජනතාව වීදි බැස හමුදා කුමන්ත්‍රණයට එරෙහිව කටයුතු කළෙන් කුමන්ත්‍රණය පරාජයට පත් විය. ජනාධිපති එර්ඩෙගොන් යළි බලය මධ්‍යගත කර ගත්තේය.

ඒ සමගම දැවැන්ත අත්අඩංගුවට ගැනීම්, නෙරපා දැමීම්, ප්‍රමාණයක් සිදු කිරීම ආරම්භ කෙරිණි. මේ වන විට රට තුළ සොල්දාදුවන් 6000ක් පමණ රඳවා ගනු ලැබ තිබේ. යුධ හමුදා පුහුණු පාසලෙහි සිසුන් 60ක්, පොලිස් නිලධාරීන් 8000ක්, විනිසුරුවන් 3000ක්, ඔත්තු නිලධාරීන් 100ක්, ආගමික කටයුතු අංශයේ නිලධාරීන් 492ක්, පවුල් හා සමාජ ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ සේවකයින් 399ක්, අගමැති කාර්යාලයේ සේවකයින් 267ක්, බලශක්ති අමාත්‍යාංශයේ සේවකයින් 300ක්, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් 15,000ක් ආදී වශයෙන් අතිවිශාල පිරිසක් අත්අඩංගුවට ගෙන හෝ තනතුරුවලින් නෙරපා දමනු ලැබ තිබේ.

තුර්කියේ සිදු වූ මෙම අසාර්ථක හමුදා කුමන්ත්‍රණය පිළිබඳව පළවෙන්නේ එකිනෙකට පරස්පර විරෝධී මතයන්ය. ඒ එක් එක් මතය ඉදිරිපත් කරන්නවුන් තමන්ගේ මතය තහවුරු කිරීම සඳහා සැලකිය යුතු කරුණු ප්‍රමාණයක් ඉදිරිපත් කිරීමටද, සමත් වී සිටියි. NATO සංවිධානයේ දෙවන විශාලතම හමුදාව හිමි තුර්කිය තුළ හමුදා කුමන්ත්‍රණ ගණනාවක්ම සිදුවී තිබේ.

යුරෝපා සංගමය ප්‍රකාශ කළේ දැනට සිදුකෙරෙමින් පවතින අත්අඩංගුවට ගැනීම් හමුදා කුමන්ත්‍රණයට පෙර සිටම සැලසුම් කරතිබූ බවයි. ඔවුන් ඉන් ඇඟවීමට උත්සහ දරන්නේ මෙම කුමන්ත්‍රණය ජනාධිපති එර්ඩොගොන්ගේ සැලසුමක් අනුව සිදු වූ බවය. මීට අමතරව මාධ්‍ය ගණනාවක්ම මෙම කුමන්ත්‍රණය ජනාධිපතිවරයාගේ සැලසුමක් විය හැකි බවට සෘජුවම මත පළකර තිබුණි. ඔවුහු කුමන්ත්‍රණයේ එක් එක් පියවර සිදුවී ඇති ආකාරය විග්‍රහ කරමින් මෙය ජනාධිපතිවරයාගේ සැලසුමක් බව ඔප්පු කිරීමට කරුණු ඉදිරිපත් කරති.

තවත් සමහර විශ්ලේෂකයන් ප්‍රකාශ කරන්නේ, කුමන්ත්‍රණය අතරමඟදී ඊට සහය පළකිරීමට සූදානම්ව සිටි පිරිසක් ඉන් ඉවත් වීමෙන් කුමන්ත්‍රණය මෙලෙස අසාර්ථක වන්නට ඇති බවය.

ජනාධිපති එර්ඩෝගන් මෙහි වරද පැටවූයේ එක්සත් ජනපදයේ පෙනිසෙල්වේනියාවේ සිට ක්‍රියාත්මක වන විරුද්ධ පක්ෂ නායකයෙකු හා ආගමික නායකයෙකුද වන ෆෙතුල්ලා ගුලේන්ටය. එනම් මෙම කුමන්ත්‍රණය පිටුපස එක්සත් ජනපදය සිටිය හැකි බවයි, ඔහු ප්‍රකාශ කරන්නේ.

### නව දේශපාලන පෙළගැස්ම

මේ කවරක් හෝ සිදුවී තිබෙන්නට හැකිය. මේ පිළිබඳ වඩාත් නිශ්චිත කරුණු ඉදිරියේදී හෙළිදරව් වීමට ඉඩ තිබේ. එහෙත් වඩා වැදගත් කරුණු වන්නේ මෙකී හමුදා කුමන්ත්‍රණය සිදුවන මොහොත වන විට තුර්කිය හා සම්බන්ධ දේශපාලන ප්‍රතිවිරෝධතා කවරාකාරයෙන් සකස් වී ඇද්ද යන්නය.

පසුගිය ජූනි මස අවසානයේදී ජනාධිපති එර්ඩෝගන් සිරියානු අහසේදී රුසියානු ප්‍රහාරක යානයක් බිම හෙළා එහි ගමන් ගත් ගුවන් නියමුවන් ඝාතනය කිරීම පිළිබඳව රුසියානු ජනාධිපති පුටින්ගෙන් සමාව ගත්තේ ය. එහිදී ඔහු තවදුරටත් ප්‍රකාශ කළේ රුසියාව තුර්කියේ මිතුරෙකු මෙන්ම උපක්‍රමිකව වැදගත් රටක්ද වන බවයි.

**පසුගිය කාලය පුරාම නේටෝ සාමාජිකයෙක් ලෙසද ලෝක දේශපාලනයේදී සහ මැදපෙරදිග දේශපාලනයේදී එක්සත් ජනපදය සමග එක්ව කටයුතු කළ රටක් ලෙසද තුර්කිය සිය දේශපාලන පක්ෂපාතීත්වය වෙනස් කරන්නේනම් එය ලෝක දේශපාලනයේ මේ මොහොතේදී තීරණාත්මක හා වැදගත් සිදුවීමක් වනු නොඅනුමානය.** සුන්නි මුස්ලිම්වරුන් බහුතරයක් ජීවත් වන තුර්කිය පසුගිය කාලය පුරාම සිරියානු ජනාධිපති අසාද්ගේ රෙජීමය නෙරපීම සඳහා කටයුතු කළ අතර මැදපෙරදිග කලාපයේ සහ අනෙකුත් අර්බුදවලදී එක්සත් ජනපදය, සෞදි අරාබිය සහ කටාර් රාජ්‍යය සමග එක්ව කටයුතු කළේය. දේශපාලන විශ්ලේෂකයන්ට අනුව මේ වන විට මැදපෙරදිග කලාපය තුළ එක්සත් ජනපද වුවමනාවන් සහ තුර්කියේ ජාතික වුවමනාවන් අතර ගැටුමක් හටගෙන ඇත. එනම් සිරියානු හා මැදපෙරදිග අර්බුදය හරහා ස්වාධීන කුර්දිස්ථානයක් බිහි කරලීම සඳහා වන එක්සත් ජනපදයේ උත්සාහය හා එවැන්නක් බිහිවීම වැළැක්වීමේ තුර්කි වුවමනාව එකී ප්‍රතිවිරෝධයයි. මේ නිසා සිරියානු හා මැදපෙරදිග අර්බුදය මේ අයුරින් තවදුරටත් ඉදිරියට ගලා ගියහොත් එය තමන්ට අවාසි සහගත වනු ඇතැයි තුර්කිය තේරුම් ගැනීමයි. දේශපාලන විශ්ලේෂකයන්ට අනුව රුසියානු ප්‍රහාරක යානය බිඳවැටීමේ සිද්ධියෙන් පසු රුසියාව තුර්කියට එරෙහිව පැනවූ ආර්ථික සම්බාධකද, තුර්කි ආර්ථිකය දුර්වල වීමට දැඩි සේ බලපා ඇත.

මෙකී හමුදා කුමන්ත්‍රණය සිදුවීමට සතියකට පෙර දී රුසියානු ස්පුට්නික් පුවත් සේවය උපුටා දක්වන 'CHINA DAILY' පුවත් පත වාර්තා කර තිබුණේ "ඇන්කාරා, උපක්‍රමික වෙනසකට සූදානම්" බවය. එම පුවත්පතට අනුව තුර්කිය ඉදිරියේදී රුසියාව, සිරියාව හා ඊශ්‍රායලය සමග සබඳතා ශක්තිමත් කර ගැනීමට සූදානමින් සිටියි.

කෙසේ වෙතත්, තුර්කියේ පක්ෂපාතීත්වයේ වෙනසක් සිදු වේ නම් සහ එය රුසියාව හා චීනය දෙසට හැරේ නම්, එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදයට ප්‍රබල පහරක් වනු නිසැකය.

## කියුබාවට සෞදි මුදල්




කියුබාව සහ සෞදි අරාබිය වැදගත් ආර්ථික ගිවිසුම් දෙකකට පසුගිය ජූලි 21වැනි දින අත්සන් කරනු තැබීය. කියුබානු පාර්ශ්වයෙන් මේ සඳහා විදේශ වෙළඳාම සහ විදේශ ආයෝජන පිළිබඳ ඇමතිවරයාද, සෞදි පාර්ශ්වයෙන් සෞදි සංවර්ධන අරමුදලේ සාමාන්‍යාධිකාරිවරයාද අත්සන් තැබූහ.

පළමු ගිවිසුම කියුබාවේ මටාන්සාන් පළාතේ කාර් දිනාස් නගරයේ ජලය පිරිසිදු කිරීමේ පහසුකම් සහ ජල පහසුකම් ලබා ගැනීම සඳහා වන ව්‍යාපෘතියකට අවශ්‍ය ණය පහසුකම් ලබා ගැනීම සඳහා වන අතර, දෙවැන්න කියුබාවට අවශ්‍ය භාණ්ඩ සෞදි අරාබියෙන් මිලදී ගැනීම සඳහා ණය පහසුකම් සැපයීම සඳහා වන ගිවිසුමකි.

පළමු ගිවිසුමෙන් කියුබාවට දිගු කාලීන ණය පහසුකම් ලෙස ඩොලර් මිලියන 29.1ක් ලැබෙන අතර ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය තාක්ෂණය සහ ශ්‍රමිකයන් කියුබාව විසින්ම සපයා ගනී. ජල ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය උපකරණ, භාණ්ඩ, වාහන සහ අමතර කොටස් ලබා ගැනීම සඳහා එකී ණය මුදල් භාවිතා කිරීමට නියමිතය.


## එක්සත් ජනපදයේ වර්ණභේදවාදය!




ජූලි මාසය තුළදී එක්සත් ජනපදයේ කළු සුදු ගැටුම් කිහිපයක්ම යළිත් වාර්තා වුණි. කළු ඇමරිකානු ජාතිකයින් දෙදෙනෙකු පොලිස් නිලධාරීන් අතින් ඝාතනයට ලක් වුණු අතර උද්ඝෝෂණයක් අතරතුරදී ස්නයිපර් ප්‍රහාරයක් හේතුවෙන් සුදු ජාතික පොලිස් නිලධාරීහු පස් දෙනෙක් ඝාතනයට ලක් වූහ.

මෙකී සිදුවීම්වලින් මතුපිටට පැමිණෙන්නේ, එක්සත් ජනපදය තුළ වර්ධනය වෙමින් පවතින වර්ණභේදවාදයයි. පහත සඳහන් සංඛ්‍යා ලේඛන වලින් පෙන්නුම් කරන්නේ එකී වර්ණභේදවාදයේ බරපතළකමයි.

- දුගීභාවය - සුදු ජාතිකයන් අතර 10%
  කළු ජාතිකයන් අතර 26%
- අන්ත දුගීභාවය - සමස්ත එක්සත් ජනපදය තුළ 07%
  කළු ජාතිකයන් අතර 12%
- විරැකියාව - සුදු ජාතිකයන් අතර 05%
  කළු ජාතිකයන් අතර 11%
- ලෝකයේ සිරගත වූවන් වැඩිපුරම සිටින රට වන්නේ එක්සත් ජනපදයයි.
  සුදු ජාතිකයින් අතර සිරගත වූවන් පුද්ගලයින් 100,000කට 500කි.
  කළු ජාතිකයින් අතර සිරගත වූවන් පුද්ගලයින් 100,000කට 3074කි.
- වයස අවුරුදු 20 - 30ත් අතර කළු ජාතිකයින් ගෙන් 40%ක් සිරගතව සිටියි.
- 2016 වසරේ පමණක් කළු ජාතිකයෝ 123 දෙනෙක් පොලිස් නිලධාරීන් අතින් මැරුම් කෑහ.
- අත්අඩංගුවට ගැනීම්වලදී පොලීසිය බලය පාවිච්චි කිරීම
  සුදු ජාතිකයින් අත්අඩංගුවට ගැනීම - 02%
  කළු ජාතිකයින් අත්අඩංගුවට ගැනීම - 3.6 %
- පොලීසිය විසින් අත්අඩංගුවට ගැනීම
  සාමාන්‍ය අගය - පුද්ගලයින් 100,000 කට 108කි.
  සුදු ජාතිකයින් අතර පුද්ගලයින් 100,000 කට 76කි.
  කළු ජාතිකයින් අතර පුද්ගලයින් 100,000 කට 273 කි.
- කළු ජාතිකයින් අත්අඩංගුවට ගැනීමෙන් පසු බලය යෙදවීම
  සුදු ජාතිකයින් 1000 කට 36කි.
  කළු ජාතිකයින් 1000 කට 46කි.
- 2001 සිට 2013 අතර කාලයේදී එක්සත් ජනපද තුළ ගිනි අවි භාවිතා කොට පුද්ගලයින් 406,496ක් ඝාතනය කර ඇත.
- 1997 සිට මේ දක්වා සමූහ ඝාතන සිද්ධීන් 51ක් සිදුවී ඇත.



# ශ්‍රී ලංකා ආර්ථිකයේ වසර මැද අර්බුදය

පසුගියදා වසර මැද රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබඳව වාර්තාව මුදල් අමාත්‍යාංශය විසින් පාර්ලිමේන්තුවට සභාගත කරන ලදී. එම වාර්තාව මගින්ද වර්තමාන පාලනය මෙන්ම ධනපති ක්‍රමය ලාංකේය සන්දර්භය තුළ මුහුණදී ඇති අර්බුදයේ ස්වභාවය යම් පමණකට පැහැදිලිව දැකිය හැකිය. කඩා වැටෙන ආර්ථිකය මෙම ප්‍රමාණයට හෝ රඳවාගෙන අර්බුදය කල් දමමින් ඇත්තේ බදු සහ ණය මගින් බව එම වාර්තාව මගින්ද පැහැදිලි විය. කෙසේ නමුත් අර්බුද කල් දැමීමටද සීමාවක් පවතී.



**ණය අවුල**

2014 වසරේ රුපියල් බිලියන 7390.9ක් වූ රාජ්‍ය ණය ප්‍රමාණය 2015 වසරේදී රුපියල් බිලියන 1112.3කින් වැඩිවී රුපියල් බිලියන 8503.2ක් දක්වා වර්ධනය විය. මෙම ප්‍රමාණයෙන් රුපියල් බිලියන 4959.2ක් දේශීය ණය වශයෙන්ද බිලියන 3544ක් විදේශීය ණය වශයෙන්ද වේ. මීට අමතරව භාණ්ඩාගාරය විසින් ලබා ගෙන ඇති තවත් බිලියන 1500ක් පමණ ඇති බව අගමැතිවරයා පසුගියදා පාර්ලිමේන්තුවට අනාවරණය කරන ලදී.

**ආදායමේ අර්බුදය - ඇස්තමේන්තු සහ ඇත්ත**

(ඇමුණුම 01)

2016 (ජනවාරි - අප්‍රේල්) ආදායම සහ වියදම

| | (රුපියල් බිලියන) ඇස්තමේනතුගත | සත්‍ය | වෙනස |
|---|---|---|---|
| මුළු ආදායම | 541.3 | 472.7 | -68.6 |
| බදු ආදායම | 495.0 | 441.2 | -53.8 |
| බදු නොවන ආදායම | 46.3 | 31.5 | -14.8 |
| මුළු වියදම | 715.0 | 706.1 | -8.9 |
| පුනරාවර්ථන වියදම | 565.0 | 559.7 | -5.3 |
| ප්‍රාග්ධන වියදම | 150.0 | 146.4 | -3.6 |

ඉහත ලේඛනය අනුව ඉතා පැහැදිලි කරුණක් වන්නේ, ආර්ථිකයේ ආදායම ආණ්ඩුව අපේක්ෂා කරන මට්ටමින් ළඟාකර ගැනීමට 2016 වර්ෂයේ මුල් කාර්තුව තුළ ඔවුන් අසමත් වී ඇති බවයි. 2016 ජනවාරි සිට අප්‍රේල් දක්වා ඔවුන් අපේක්ෂා කළ ආදායමට වඩා බිලියන 68.6ක් අඩුවෙන් උපයන විට වියදමින් අඩුකර ගත හැකි වී ඇත්තේ අපේක්ෂා කරන ප්‍රමාණයට වඩා රුපියල් බිලියන 8.9ක් පමණි. ඉන් පසුව මැයි මාසයේ

> ඉහත ලේඛනය අනුව ඉතා පැහැදිලි කරුණක් වන්නේ, ආර්ථිකයේ ආදායම ආණ්ඩුව අපේක්ෂා කරන මට්ටමින් ළඟාකර ගැනීමට 2016 වර්ෂයේ මුල් කාර්තුව තුළ ඔවුන් අසමත් වී ඇති බවයි.

සිට වැට් බදු ගැසීම් මගින් බදු ඉහළ දැමීමේ ජනතා පීඩාකාරී ක්‍රියාමාර්ග තේරීමේ හේතුව මේ අනුව අපට පැහැදිලිය. ආණ්ඩුව බදුවලින් පමණක් 2016 අප්‍රේල් දක්වා මාස කිහිපයේදී අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා රුපියල් බිලියන 53.8ක් අඩුවෙන් උපයා ඇත. ඒ අඩුව පියවීම සඳහා මැයි සිට බොහෝ නව භාණ්ඩද ඇතුලත් කර 15%ක් දක්වා වැඩිකළ නව බදු හඳුන්වා දෙන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙම බද්ද අය කිරීම නතර කළද, ආණ්ඩුවේ අර්බුදය හමුවේ එම වැට් අයකිරීම නතර කිරීම ඉතාම තාවකාලික වනු ඇත. වැට් බදුවලින් පවා ආණ්ඩුව පළමු කාර්තුවේ අපේක්ෂා කළ ප්‍රමාණය ලබා ගැනීමට අසමත් වී ඇත. නමුත් 2015 ජනවාරි - අප්‍රේල් කාලය තුළදී බිලියන 43ක් වූ වැට් ආදායම 2016 වසරේ අදාළ කාලය තුළ බිලියන 51 ක් දක්වා 16% කින් වැඩිකර ගැනීමට ආණ්ඩුව සමත් වී ඇත.

**හිස් භාණ්ඩාගාරය**

බොහෝ අවස්ථාවන්හිදී "භාණ්ඩාගාරය හිස්" යයි දේශපාලන වේදිකාවන් තුළ සාකච්ඡා වුවද, එම හිස් බව කොතරම් මූල්‍යමය වටිනාකමක්දැයි ප්‍රකාශයට පත්වන්නේ නැත. නමුත් පහත වාර්තාව (ඇමුණුම 02) විසින් වර්තමාන භාණ්ඩාගාරය හිස් බව හෙළිදරව් කර ඇත. ඒ අනුව 2016 ජනවාරි 01 වැනි දිනට භාණ්ඩාගාරයේ මුදල් ශේෂය සෘණ රු. බිලියන 196.8ක් විය. (රුපියල් කෝටි 19,680කි) මෙයට එම කාර්තුවේ ලැබීම් වූ රුපියල් බිලියන 466.1ක් එකතු කිරීමෙන් සහ මෙහෙයුම් හා ආයෝජන කටයුතුවලට දරන ලද රුපියල් බිලියන 674.6ක් ගැලපූ පසු භාණ්ඩාගාරයේ ශුද්ධ මුදල් හිඟය රුපියල් බිලියන 208.5ක් විය. එහි තේරුම මේ වන විට රුපියල් කෝටි 20,000ක පමණ දෛනික හිඟයක් භාණ්ඩාගාරයේ පවතින බවයි. එනම් ශ්‍රී ලංකා ආර්ථිකයේ ලාච්චුව හිස්ව පවතිනවා පමණක් නොව රටට මෙන්ම භාණ්ඩාගාරයද රටට ණය බවයි.

මේ අනුව 2015 ජනවාරි සෘණ බිලියන -180.7 සිට 2016 අප්‍රේල් 30 දක්වා "යහපාලන" පාලන කාලය තුළදී පමණක් සෘණ බිලියන 208.5ක් දක්වා බිලියන 27.8කින් ආර්ථිකයේ මුදල් ශේෂය සෘණ මට්ටමට පත් කිරීමට ආණ්ඩුව කටයුතු කර ඇත.

භාණ්ඩාගාරයේ මුදල් ශේෂය සෘණ වන්නේ කෙසේ දැයි කෙනෙකුට සාධාරණ සැකයක් මතුවිය හැකිය. සෘණ යනු දැනට රජය භාරයේ ඇති අරමුදල් භාණ්ඩාගාරය විසින් වියදම් කර එම අරමුදල්වලට භාණ්ඩාගාරය ණය වී ඇති බව මෙම සෘණ අගය මගින් හෙළිවේ. උදාහරණ ලෙස අර්ථ සාධක අරමුදලේ මුදල්, සේවක විශ්‍රාම වැටුප් අරමුදලේ මුදල්, රක්ෂණ භාර අරමුදල වැනි රජයේ භාරයේ ඇති අරමුදල් මේ වනවිට භාණ්ඩාගාරය විසින් වියදම් කර ඇති බව මෙයින් පැහැදිලි වේ.

**රජයේ මුදල් ප්‍රවාහය (2016 - ජනවාරි සිට අප්‍රේල් දක්වා) (බිලියනවලින්) (ඇමුණුම 02)**

| | 2015 ජනවාරි - අප්‍රේල් සත්‍ය | 2016 ජනවාරි- අප්‍රේල් සත්‍ය |
|---|---|---|
| ආරම්භක මුදල් ශේෂය (ජනවාරි 01ට) | -196.8 | -196.8 |
| ආදායම/ලැබීම සමස්ත මුදල් ගලා ඒම | 376.6 | 466.1 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල සමස්ත මුදල් ගලා යෑම | 521.4 | -553.3 |
| ආයෝජන සඳහා මුදල් ගලායාම | -130.7 | -121.3 |
| ශුද්ධ මුදල් අතිරික්තය/හිඟය | -275.5 | -208.5 |

**2016 ණය අර්බුදය**

2016 මුල් මාස 04 තුළ රජය රු. බිලියන 453.4ක් (කෝටි 45340) සමස්ත ණය ගැනීම ප්‍රමාණයක් වාර්තා කර ඇත. එයින් රු: බිලියන 403.4ක් දේශීය ණය ගැනීම් වන අතර රු: බිලියන 50ක් (රු: කෝටි 5000ක්) විදේශීය ණය ගැනීම් විය. දේශීය ණය ගැනීම්වලින් රු: බිලියන 2018ක් කලින් ගත් ණය වාරිකය ගෙවීමටද ඉතිරිය පොලී ගෙවීමටද යොදවා ඇත. මෙම කාලය තුළ මාස හතරට පමණක් ශුද්ධ ණය ගැනීම් රු: බිලියන 235.4ක් (රු: කෝටි 23540) විය.

දේශීය ණය ගැනීම් (2016 ජනවාරි - අප්‍රේල්)

| ණය උපකරණය | රු: බිලියන වටිනාකම |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 199.2 |
| භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ) | 9.9 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 160.6 |
| මහා බැංකු තාවකාලික අත්තිකාරම් | 33.7 |
| එකතුව | 403.4 |

හවුල් ආණ්ඩු පාලනය සහ රාජපක්ෂ පාලනය අතර ණය ගැනීමේදී බොහෝ සමානකම් අතර එක් වෙනස්කමක් ඇත. ඒ නම් කලින් පාලනය ලිහිල් කොන්දේසි මත වැඩි පොලියට ණය ගනු ලැබීය. වර්තමාන යහපාලනය ඒ ණය ගත් ව්‍යාපෘතිවල ණය ගෙවනු වෙනුවට, ණයට හිලව්වට එම ව්‍යාපෘති ණය ගත් රටවලටම පැවරීමට කටයුතු කරනු දක්නට ඇත. මත්තල ගුවන් තොටුපළ, හම්බන්තොට වරාය, නොරොච්චෝලේ විදුලි බලාගාරය ආදී ව්‍යාපෘති අරහයා ආණ්ඩුවේ ආර්ථික පිළිවෙත වී ඇත්තේ එයයි.

2016 මුල් මාස 04 තුළද ණය දෙන ආයතන සහ රටවල් සමග එළඹ ඇති සමස්ත එකඟතාවයන්ගේ වටිනාකම ඇ: ඩොලර් මිලියන 855.4 (රු: මිලියන 122,365ක්)කි. මෙයින් ඩොලර් මිලියන 727.5ක් ණය ගිවිසුම් හරහා ලැබී ඇති අතර, ඉතිරි ඩොලර් බිලියන 127.9ක් ගිවිසුම් 09ක් මගින් ප්‍රදාන ආධාර ලෙස ලැබෙනු ඇත.

මෙම වසර මැද (2016) මුදල් අමාත්‍යාංශය විසින් පාර්ලිමේන්තුවේ සභාගත කළ මූල්‍ය ප්‍රකාශනය මගින් උපුටා ගත් සංඛ්‍යා දත්ත මගින් එළඹිය හැකි නිගමනය වන්නේද රට ණය කිරීම හා ජනතාවට බදු පිට බදු පැනවීම හැර වෙනත් නිෂ්පාදන ආර්ථික සැලසුමක් නොමැති මේ දුබල ධනපති ආණ්ඩුවලට ජනතාවගේ ප්‍රශ්න විසඳීම කළ නොහැකි බවයි.



"මා ඔබට මාළුවකු දුන්නොත් ඔබේ කුසගින්න එක වේලකට නිව්වා වේ. මා ඔබට මාළු අල්ලන ක්‍රමය කියා දුනහොත් ඔබේ කුසගින්න සදහටම නිවා දැමුවා වෙයි.

**චීන පිරුළකි**

# හැඟීම්බර වීම හා හැඟීමට යටවීම



මිනිසුන් වන අප සියලු දෙනා සිතීමට, ඒ සිතන දේ තවකෙකුට ප්‍රකාශ කිරීමට සහ අප ප්‍රකාශ කරන දේ මගින් අනෙකා තුළ යම් හැඟීමක් උත්පාදනය කිරීමට හැකියාව ඇති සත්ව කොට්ඨාසයකි. මේ සුවිශේෂී හැකියාව සමාජයේ සංවර්ධනය උදෙසා
ප්‍රගතිගාමී ලෙස යොදා ගැනීමේ කිසිදු වරදක් නොමැත. නමුත් මෙම හැකියාව ප්‍රතිගාමී ලෙස යොදා ගන්නේ නම් ඒ තුළින් සමාජයේ පැවැත්මට හානිකර විවිධ ප්‍රශ්න, ගැටුම්කාරී තත්වයන්ද උද්ගත වීම වළක්වාලිය නොහැක.

පුද්ගලික ජීවිත තුළත් පොදුවේ සමාජය තුළත් මතුවන ඇතැම් ප්‍රශ්නවලදී වඩාත් වැඩියෙන් හැඟීම්බර වන්නේ කාන්තාවන්ය. එසේ හැඟීම්බර වීමේ කිසිදු ප්‍රශ්නයක් නොමැත. එහෙත් ඒ හැඟීම්බර වීම තුළ විවිධ වැරදි තීන්දු තීරණයන්ට එළැඹෙන්නේ නම් එය යම් හානිකර තත්වයක් ඇතිවීමේ මූලාරම්භය විය හැක. එසේම සමාජයේ ඇතැම් පිරිස් විසින් එවැනි දුර්වලතාවන් තමන්ගේ වාසියට යොදා ගැනීමටද මාන බලමින් සිටිති.

ඊට මෑතම උදාහරණය වන්නේ පසුගිය මාසයේ යාපනය සරසවියේ සිසුන් දෙපිරිසක් අතර ඇති වූ ගැටුම යොදා ගනිමින් ඇතැම් පිරිස් ජාතිවාදී හැඟීම් ඇවිස්සීමට ගත් උත්සාහයය. මෙම සිදුවීම පාදක කොටගෙන දකුණේ ඇතැම් බලලෝභී දේශපාලකයන් ජාතිවාදය ඇවිලීමට උත්සාහ කළ අතර හිටපු ජනපති මහින්ද රාජපක්ෂ ''ඔබට සතුටුයිද දැන්'' යනුවෙන් දකුණේ ජනතාවගෙන් අසමින් රාජ්‍ය නායකයෙකුව සිටි පුද්ගලයෙකුට නොගැලපෙන ආකාරයේ ප්‍රකාශ පවා කිරීමට පසුබට නොවුණි. එවැනි ප්‍රකාශ සිදු කෙරෙන්නේ ජාතිවාදී ගැටුම් අවුළුවා හෝ බලයට ඒමේ කෑදරකමින් පසුවන්නන්ගේ මුවකින් පමණි. එවැනි පුද්ගලයන්ගේ සැබෑ අරමුණ තේරුම් ගැනීමට උතුරේත් දකුණේත් කාන්තාවන් දැන්වත් සමත් විය යුතුය.

උතුරේ හා දකුණේ එවැනි බලලෝභී පුද්ගලයන්ගේ ජාතිවාදී ප්‍රකාශවල සැබෑ යටි අරමුණ වටහා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් අනිසි ප්‍රතිවිපාකයන්ට අවස්ථා කිහිපයකදීම අප මේ වනවිටත් මුහුණ දී ඇත. උතුර නැගෙනහිර වසර තිස් ගණනක් පුරා ඇදුණු යුද්ධයද ජාතිවාදයේ ප්‍රතිඵලයකි. යුද්ධයක් තුළ වඩාත් වැඩි පීඩාවකට ලක්වන්නේ කාන්තාවන් හා ළමුන්ය. යුද්ධය හේතුවෙන් අනාථ තත්වයට පත් වූ, වැන්දඹුවන් බවට පත් වූ කාන්තාවන්ගේ ගැටලුවලට තවමත් විසඳුම් ලැබී නොමැත. ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවීමේ කිසිදු වැඩපිළිවෙළක් මේ වනතෙක් පැවති හා පවතින ආණ්ඩු විසින් ක්‍රියාත්මක කර නොමැත. පොදුවේ රටේ සියලු කාන්තාවන් ආර්ථිකව නගා සිටුවීමේ හා ඔවුන්ගේ ජීවන තත්වය උසස් කිරීමේ සැලැසුම් බොහෝ විට පවතිනුයේ ලේඛනයන් තුළ සිරගතවය. ඒවා ප්‍රායෝගික තලයේ ක්‍රියාත්මක නොවන සැලසුම් බවට පත් වී හමාරය.

එසේ රටේ බහුතරයක් කාන්තාවන් පොදුවේ සමාජීය, දේශපාලන හා ආර්ථික වශයෙන් පීඩාවට ලක්ව සිටින වටපිටාවක් තුළ කාන්තාවන් පහසුවෙන් ජාතිවාදයේ ගොදුරු බවට පත් කර ගැනීමට ඇතැම් පිරිස් වෙර දරමින් සිටින බව පෙනේ.

ජාතිවාදයේ තෝතැන්නක් බවට රට පත්කර ඒ හරහා සැමදා බලයේ සිටීමට උතුරේ හා දකුණේ ඇතැම් දේශපාලකයන් අතීතයේත් උත්සාහ කළ අතර අදත් උත්සාහ කරමින් සිටී. එවැනි දේශපාලකයන්ට අප තවදුරටත් රැවටිය යුතුද? අපේ වටිනා ඡන්දයෙන් අප පත්කර ගත යුත්තේ ජාතික සමගිය වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයන් නොවේද? ජාතිවාදී හැඟීම්වලට යටවී තීන්දු තීරණ ගැනීමට අප ඉක්මන් නොවිය යුතුය. කුමන මුහුණුවරකින් හෝ එන ජාතිවාදය හඳුනාගැනීමට අප බුද්ධිමත් විය යුතුය. එය හඳුනාගෙන එය පරාජය කිරීමට කාන්තාවන් වන අප සියලු දෙනා අත්වැල් බැඳ ගත යුතුය.

## හදමු තව අලුතෙන් පැළ...

ඇසළ සඳ ගිනි ගන්නා මැදියම
ඇයිද මෙතරම් තවම කළුවර
කුරුබිලි වලින් රිංගලා එළියට
බලන් හිරු යළි නොබසින

කාවඩි තනුවකට
සිංහල හඬින් ගැයුණද
ඉඳහිට වැයුණු ගැට බෙර
ඇසුනෙ මෝටාර් ශබ්දෙ ලෙසටද?

මෘදංග ගැට බෙර එකට එක්කර
එකම නැටුමක් අපි නටන දින
වැයෙන අත්පොළසන් බස
සිංහලද? දෙමළද?

නුඹ දැක්කෙ නැතිවාට
පොංගල් බතේ රසයට
අපිත් කැමතියි මල්ලියේ
විද්‍යාලා ඉසිප්‍රියාලා
මෙහෙත් මැරෙනව නංගියේ
මායිමෙන් පැන
බලන් අතහැර විරසක
නුඹලා වගේම අපිත් පුංචියි මල්ලියේ

යාල් දේවියේ නැගගෙන
සාමා අමර සමඟින
ෆාතිමා මොහොමඩ් එක්ක
රමේෂ් පරමේෂ්වරීත් අරගෙන
අපිත් නෑගම් එනව උතුරට

නාගදීපෙත් වැඳගෙන
නල්ලූර් කෝවිලේ -
රතුම රතු තිලකෙත් තියාගෙන
තල් පොල් දෙවැට යාකර
හදමු තව අලුතෙන් පැළ
තල් වුවද පොල් වුවද
අමතකද මේ දෙකම
අයිති තාල වර්ගෙට.

# සිව්දෙසින්

## මුගාබේට එරෙහිව කාන්තාවන් පාරට...



ජුලි 16 දින සිම්බාබ්වේ කාන්තාවන් සිය ගණනින් එක්ව හට්ටි මුට්ටිවලට ගසමින් රොබට් මුගාබේගේ ඒකාධිපති පාලනයට එරෙහිව විරෝධතාවයක යෙදුනි.

සිම්බාබ්වේහි ප්‍රධාන වෙළෙඳ දිස්ත්‍රික්කයක් වන බුලාවයෝ වෙත රැස්වී ඔවුහු මෙසේ විරෝධතාවයේ යෙදුණාහ.

''මුගාබේ ඔබ අසමත්. කරුණාකර ගෙදර යනු'' , ''සිම්බාබ්වේ ජනතාවට නිදහස දෙනු'' යනුවෙන් සඳහන් පුවරු රැගෙන විරෝධතාවයේ යෙදුණු විරෝධතාකරුවෝ නිදහස්, සාධාරණ, විශ්වාසනීය මැතිවරණයක් පවත්වන ලෙසද ඉල්ලා සිටියහ.

සිම්බාබ්වේ ආණ්ඩුව මේ වනවිට මුදල් හිඟයකට හා ඉහළ විරැකියා අර්බුදයකට මුහුණ දී ඇති අතර එරට වැඩ කරන ජනතාවගේ වැටුප් ගෙවීමට නොහැකි තත්වයකට පත්ව ඇත.

රොබට් මුගාබේ ගේ පාලනයේ ප්‍රතිඵලයක් ලෙස එරට බහුතරයක් ජනතාව සාගින්නෙන් හා දරුණු ආර්ථික අපහසුතාවන්ගෙන් පෙළෙමින් සිටිති.

## THAAD වලට ජනතා විරෝධය...

එක්සත් ජනපද තැඩ් (THAAD) මිසයිල් ආරක්ෂක ඒකකයක් පිහිටුවීමට දකුණු කොරියා ආණ්ඩුව ගත් තීරණයට එරෙහිව ජුලි 13 දින දකුණු කොරියාවේ සියොන්ජු ප්‍රාන්තයේ ජනතාව සියොල් වෙත රැස්ව විරෝධතාවය පළ කළහ.

සියොන්ජු නගරයේ පිහිටුවීමට නියමිත මෙම මිසයිල් ඒකකය වහාම නතර කරන ලෙස ඔවුන් එරට ආණ්ඩුවට බල කර සිටි අතර ඔවුන්ගෙන් නොවිමසා බලධාරීන් ගත් තීරණය මුළුමනින්ම වැරදි බවද පවසයි.

ඔවුන්ගේ ප්‍රාන්තයේ අනාගතය වෙනුවෙන්, තම අනාගත පරපුර වෙනුවෙන්, ඔවුන්ගේ සෞඛ්‍යය හා ජීවත්වීමේ අයිතිය වෙනුවෙන් මෙයට දැඩි විරෝධය දක්වන බව සියොන්ජු ජනතාව පවසයි.

දකුණු කොරියාවේ ජනාධිපතිනිය පවසන්නේ ආණ්ඩුවේ මෙම සැලසුමට ජනතාව සහය දිය යුතු බවත් උතුරු කොරියාවෙන් එල්ල විය හැකි තර්ජන හේතුවෙන් මෙය අනිවාර්යයෙන්ම කළ යුතු බවත් ඇය පවසයි.

2017 වසර අවසන් වීමට පෙර මෙම තැඩ් මිසයිල් පද්ධතිය ක්‍රියාත්මක කෙරෙන බව එරට ආරක්ෂක ඇමතිවරයා පවසයි.

චීනය හා රුසියාව මෙයට දැඩි විරෝධය පළ කර ඇති අතර ඔවුන් පවසන්නේ උතුරු කොරියාව පමණක් නොව චීනයේ හා රුසියාවේ ප්‍රදේශයන්ද මෙම පද්ධතියේ රේඩාර්වලට හසුවිය හැකි බවය.



දැනුම සමාජය හා චින්තනය 07

# වෙළඳ ව්‍යාපාරයක් වූ මිත්‍යාව




අප සාකච්ඡා කරමින් සිටින්නේ, මිත්‍යාවේ පැවැත්මේ සමාජමය හා දේශපාලනමය හේතු පිළිබඳවය. අතීතයේ බොහෝ මිත්‍යා විශ්වාස බිහිවූයේ නූගත්කම හෙවත් සොබාදහම පිළිබඳ මිනිසාගේ දැනුම දුර්වලව පැවති නිසාය. එහෙත් දැන් සොබාදහමේ රහස් විද්‍යාව මගින් අනාවරණය කර තිබියදීත් මිත්‍යාවන් අහෝසි නොවී පවතී. ඊට එක් හේතුවක් වූයේ, නූගත්කම හා ගතානුගතිකභාවය වන අතර තවත් හේතුවක් වූයේ, ලාභ ඉපැයීම හෙවත් ආර්ථිකමය වාසි ලැබීමය.

මේ වන විට මිත්‍යාවන් ඉතා විශාල ලෙස ලාභ ලබන වෙළඳ ව්‍යාපාරයක් බවට පත්ව තිබේ. මහමග අයිනේ බෝ පැලයක් සිටුවා (පන්සලක සිටුවනවා වෙනුවට) එය ඉදිරිපිට පින් කැටයක් තබන්නෙත්, මහමඟ හැම තැනම දේවාල ඉදිකරන්නෙත් එම ස්ථානවල පින්කැට මුදල්වලින් පිරීයන නිසාය. මහමඟ රථවාහන වැඩි නිසාත් මාර්ගවල දුර්වලතා නිසාත් විනයක් නොමැතිකම නිසාත් ඉක්මනින් යාමේ තරඟය නිසාත් ලංකාවේ රථවාහන අනතුරු නිතර සිදුවේ. ඉන් බියට පත්වන වාහන පදනවන රියදුරන් මෙන්ම මගීහුද තම ආරක්ෂාව වෙනුවෙන් මහමඟ අයිනේ ඇති දේවාලවල පිං කැටවලට මුදල් දමා යති. එවිට එය ව්‍යාපාරයක් බවටපත් වේ; මුදල් එකතු වේ. ඒ නිසාම එම ආයතන බාර අය ඒවා පවත්වාගෙන යනු ලැබේ.

### දෙවියන්ට මුදල් ඇයි?

අප රටේ දේවාරූඪයෙන් ශාස්ත්‍ර කියන, දේව හාස්කම්වලින් ලෙඩ රෝග සුවකරන බව කියන හා දේව ආශිර්වාදය ලබාදෙන බොහෝ ස්ථාන තිබේ. ඒවා තවම පවතින්නේ ඇයි, ඒවා මුදල් උපයන විශාල ව්‍යාපාර බවට පත්ව තිබෙන නිසාය. ඒවායේ අයිතිකරුවෝ තම තැරැව්කරුවන් මගින්, විවිධ ක්‍රම මගින් මිනිසුන් ඊට අද්දවා ගනිති. සමහරු ලක්ෂ ගණන් ගෙවා රූපවාහිනී දැන්වීම් හා පුවත්පත් දැන්වීම්ද පළ කරති. ඒ දුකට පත් ජනතාවට පිහිට වීම සඳහා නොව මුදල් ගැරීම සඳහාය. ශාස්ත්‍ර කියන්නේ සැබෑ ලෙසම දෙවියන් නම්, ලෙඩ සුවකරන්නේ හෝ අපල ඉවත්කරන්නේ දෙවියන් නම් ඊට මුදල් ගැනීමේ තේරුමක් නැත. ඒ දෙවියන්ට මුදල් අවශ්‍ය නොවන නිසාය. සුපර් මාකට්වලින් බඩු ගන්නා දෙවිවරුන් අප තවම දැක නැත. එහෙත් දෙවියන් විකුණාගෙන කන අයනම් මන්දිර හදති; යාන වාහන ඉඩකඩම් මිලදී ගනිති; බැංකු ගිණුම් පුරවා ගනිති. ඒ අනුව මිත්‍යාව වෙළඳ ව්‍යාපාරයක් වූ විට දෙවියන් විශ්වාස නොකරන අය පවා දෙවියන් සිටින බව පවසා මුදල් ගැරීමට පෙළඹීම මිත්‍යාව දිගට පැවතීමට හේතු සදයි.

ජ්‍යෝතිෂ්‍යකරුවෝ හා හඳහන් බලන්නෝද මේ වර්ගයේමය. මේ සේවාව සඳහා ඔවුන් විශාල වශයෙන් මුදල් අය කරන අතර එය මුදල් ඉපැයීමේ පහසු මාර්ගයක් වී තිබේ. මිනිසුන් සුභ නැකැත් ගැන විශ්වාස නොකරන්නේ නම් නැකත් බලා වෙලාව සාදා දී මුදල් උපයන්නන්ගේ රැකියාවට සිදුවන්නේ කුමක්ද? මිනිසුන් ජ්‍යෝතිෂ්‍ය විශ්වාස නොකරන්නේනම්, කෙන්දර බලා මුදල් උපයන අයට ආදායම් ලැබෙන්නේ කෙසේද? ඒ නිසාම මෙවැනි දේවලින් මුදල් උපයන අය ඒවා සත්‍ය බව පවසමින් ප්‍රචාරය කරති. එවිට විද්‍යාව තිබියදීත් ආර්ථිකමය වාසි සඳහා මිත්‍යාව පතුරුවන පිරිස නිසා මිත්‍යාව රජ කරයි.

### මිත්‍යාව හා ප්‍රාග්ධනය

දෙවියන් පිළිබඳව, භූතයින් පිළිබඳ, ග්‍රහලෝක පිළිබඳ පතුරුවන මිත්‍යාවට වඩා බරපතළ ලෙස හා සියුම් ලෙස මිත්‍යාව හා අවිද්‍යාව පැතිරවීමේ කාර්යය දැන් සිදුකරමින් සිටින්නේ බහුජාතික හා ජාතික සමාගම්වල ප්‍රාග්ධන හිමියන් විසිනි. ඔවුන් විසින් ජනමාධ්‍ය උපයෝගී කරගෙන විශේෂයෙන් රූපවාහිනිය හරහා පතුරුවන අවිද්‍යාව ඉතාම බරපතළය.

> දෙවියන් පිළිබඳව, භූතයින් පිළිබඳ, ග්‍රහලෝක පිළිබඳ පතුරුවන මිත්‍යාවට වඩා බරපතළ ලෙස හා සියුම් ලෙස මිත්‍යාව හා අවිද්‍යාව පැතිරවීමේ කාර්යය දැන් සිදුකරමින් සිටින්නේ බහුජාතික හා ජාතික සමාගම්වල ප්‍රාග්ධන හිමියන් විසිනි. ඔවුන් විසින් ජනමාධ්‍ය උපයෝගී කරගෙන විශේෂයෙන් රූපවාහිනිය හරහා පතුරුවන අවිද්‍යාව ඉතාම බරපතළය.

ප්‍රාග්ධන හිමි සමාගම්වල ප්‍රධාන අරමුණ ලාභ ලැබීමය. වැඩි වැඩියෙන් ලාභ ලැබීම සඳහා තම නිෂ්පාදන වැඩි වැඩියෙන් විකුණා ගත යුතුය. ඒ සඳහා ඒවා මිලදී ගැනීමට මිනිසුන් පොළඹවා ගත යුතුය. අනෙක් අතට වැඩිපුර ලාභ ලැබීමට භාණ්ඩවල ගුණයද අඩුකළ යුතුය. ඉදින් ගුණාත්මකභාවයෙන් අඩු භාණ්ඩ වෙළඳපොළේ විකුණා ගැනීමට නම් එම භාණ්ඩ පිළිබඳ බොරු කිව යුතුය. නැතිගුණයක් පෙන්විය යුතුය. පාරිභෝගිකයා බියවැද්දීම හා රැවටීම කළ යුතුය. රූපවාහිනී වෙළඳ දැන්වීම් මගින් කරන්නේ එයයි. ඉන් සිදුවන්නේ ගුණාත්මක නොවන භාණ්ඩ මිලදී ගැනීමට මිනිසුන් පෙළඹීම පමණක් නොවේ. සමාජය තුළ විවිධ මිත්‍යාවන් පැතිරීමද ඉන් සිදුවේ.

දත්වල ඇති ඇසට නොපෙනන කුඩා සිදුරු වසා දමා දත් මතුපිට කැල්සියම් ආවරණයක් ඇති කිරීමට සමත්බව කියන දන්තාලේපයක් පිළිබඳ දැන්වීමක් මෑත කාලයේ රූපවාහිනී නාලිකාවල විකාශනය විය. දන්ත වෛද්‍ය විද්‍යාවට අනුව දත්වල ඇති කුඩා සිදුරු (මෙයද සත්‍යයක් නොවේ) පිටතින් යොදන දන්තාලේපයක කැල්සියම්වලින් වැසිය නොහැක. එය මිත්‍යාවකි. එහෙත් එම මිත්‍යාව කිසිදු බාධාවකින් තොරව පතුරුවති. වෛද්‍යවරුද ඊට නිහඬය. කිරිපිටි සමාගම්ද එලෙස මිත්‍යා මත පතුරුවනු දැකිය හැකිය. ඒ කිරිපිටි විකුණා ගැනීම සඳහාය. දවසේ ප්‍රබෝධය හා ශක්තිය ලබාදෙන බව කියන පානය දිගටම පාවිච්චි කළහොත් දියවැඩියාව පවා සෑදෙනු ඇත. ඒ, ඒවායේ සීනි ප්‍රමාණය වැඩි නිසාය. මෙලෙස ආහාර පිළිබඳ, රූව ලස්සන කරන විවිධ ආල්පන පිළිබඳ මිත්‍යාවන් සමාජයේ පතුරුවා හරින්නේ ලාභ ඉපැයීම සඳහාමය. මිත්‍යාවෙහි හා සත්‍යයෙහි වෙනස සඟවන ප්‍රාග්ධන හිමියෝ ජනතාවට නින්දෙහි හා සැප නින්දෙහි වෙනස උගන්වති. ආර්ථික වාසි වෙනුවෙන් මිත්‍යාව පතුරුවා හරින්නේ එසේය.

### පංති දේශපාලනය හා මිත්‍යාව

සමාජයක් තුළ මිත්‍යාව පවත්වා ගැනීමේදී ප්‍රබලම කාර්යභාරය ඉටුකරන්නේ දේශපාලන වුවමනාවන් විසිනි. දේශපාලන වාසි ගැනීම සඳහා, තමන් වෙත බලය ගැනීම සඳහා ධනපති දේශපාලන පක්ෂ වේදිකා මත වපුරන බොරු හා අසත්‍ය මතයන්ට වඩා ධනපති ක්‍රමය සමාජ ක්‍රමයක් ලෙස අසත්‍ය පැතිරවීම සඳහා අනුග මනය කරන ක්‍රියාමාර්ග ඉතාම සියුම්ය; බරපතළය.

ධනවාදයට මේ මිහිතලය මත තවත් කාලයක් පැවතිය හැකි වන්නේ, එහි පැවැත්ම ජනතාව තුළ සාධාරණය කරගත හැකි වන්නේ සමාජයේ යථාර්ථයන් සඟවා බොරුව හා මිත්‍යාව රජකරවීම තුළය. සමාජයක ජීවත් වන මිනිසුන් ගෙන් ටික දෙනෙක් පොහොසතුන් වී බහුතරය දිළින්දන් බවට පත්ව සිටින්නේ ධනපති සූරාකෑමත් දේපළ බෙදීයාමේ අසමානත්වයත් නිසාය යන සත්‍යය පැවසීමට ධනපති ක්‍රමයට හැකිද? නැත. එසේ පැවසුවහොත් ධනවාදය වහාම අහෝසි වනු ඇත. ඒ නිසා මිනිසුන්ගේ දුප්පත් පොහොසත් භේදයට හේතුව පෙර කළ අකුසල්, නොලැබීම, ග්‍රහ අපල, දේව කැමැත්ත ආදී වෙනත් කරුණුවලට බැර කිරීමට ධනපති පංතියට අවශ්‍යය. ධනපති පාලකයන්ට හැම විටම ආගම් අවශ්‍ය වන්නේ ඒ නිසාය. එවිට ඔවුන් එම මිත්‍යාවන්ට උදව් කරමින් ඒවා පවත්වාගෙන යති. ඒ තම පංති පාලනය පවත්වා ගැනීම සඳහාය.

මෙහිදී ධනේශ්වර පංතිය ප්‍රතිවිරෝධයක සිට ක්‍රියාත්මක වේ. ධනේශ්වර නිෂ්පාදනයේදී, භාණ්ඩ නිපදවීමේ හා වෙළඳාමේදී ඔවුනට ලාභ ලැබීම සඳහා භාණ්ඩ වැඩිපුර නිපදවීම සඳහා විද්‍යාව අවශ්‍යය; තාක්ෂණය අවශ්‍යය. යුද්ධ කිරීම සඳහා, බලහත්කාරය සඳහා අවි තැනීම සඳහා විද්‍යාව හා තාක්ෂණය අවශ්‍යය. එසේම පෘථිවි ගෝලය පමණක් නොව පිටසක්වල සම්පත්ද හඳුනාගෙන ඒවා සූරාකෑම සඳහා විද්‍යාව හා තාක්ෂණය අවශ්‍යය. ඒ අර්ථයෙන් ධනවාදය නිතරම නිෂ්පාදනයේ සීමාව තුළ විද්‍යාව හා තාක්ෂණය දියුණු කරනු ලැබේ. විද්‍යාව මෙතරම් දියුණු වූයේ ධනවාදය තුළය. එය අමතක කළ යුතු නැත. ධනේශ්වර නිෂ්පාදනය හා සූරාකෑම සඳහා විද්‍යාව හා තාක්ෂණය දියුණු කරන ධනවාදය, ධනවාදී සමාජ ක්‍රමය පවත්වාගෙන යාම සඳහා මිත්‍යාවන්ද පවත්වා ගනී. තමන් වෙළඳ භාණ්ඩ මගින් උපයා ගන්නා අතිරික්ත ධනයෙන් කිසියම් ප්‍රමාණයක් විද්‍යාවේ හා තාක්ෂණයේ වර්ධනයට යොදවන අතරම එම අතිරික්ත ධනයේම තවත් ප්‍රමාණයක් මිත්‍යාව සඳහාද වැය කරයි. ආගමික මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට උදව් කරයි. පාසල් අධ්‍යාපනය තුළ විද්‍යාව සමඟ එකට මිත්‍යාවද උගැන්වීමට කටයුතු කරයි. ධනපති ප්‍රාග ්ධනය ක්‍රියාකාරිත්වය තුළින් නිර්මාණය වන මෙම ප්‍රතිවිරෝධය සමාජයීය දැනුම තුළද ප්‍රතිවිරෝධී ලෙස ප්‍රකාශයට පත්වේ. ඒ, විද්‍යාව සමඟ එහි ප්‍රතිවිරෝධය වන මිත්‍යාවද එකට පැවතීමය. එබැවින් විද්‍යාවේ වර්ධනයේ හා පැවැත්මේ කොන්දේසි මෙන්ම මිත්‍යාවේ පැවැත්මේ කොන්දේසිද පවතින්නේ ධනවාදී සමාජ ක්‍රමය තුළමය. එම ප්‍රතිවිරෝධය ධනවාදයේ පැවැත්මේ අවශ්‍යතාවය හා එහි ජාති ලක්ෂණය වී ඇත. ඒ අනුව මිත්‍යාව සැබෑ ලෙසම අහෝසි වනු ඇත්තේ ධනවාදයේ පරාජයත් සමඟය. ධනවාදය ලොව පවතින තුරු විවිධ

15වැනි පිටුවට



"නිදහස් අදහස් එන්නේ කොහෙන්ද? ඒවා අහසින් වැටෙනවාද? නැත. ඒවා හිත් තුළ ඉබේම පහළවෙනවාද? නැත. ඒවා එන්නේ සමාජ භාවිතයෙන්ය, එයින් පමණක්මය. ඒවා තුන් වර්ගයක සමාජ භාවිතයෙන් එයි. එනම් නිෂ්පාදනය පිණිස කරන අරගලය, පංති සටන සහ විද්‍යාත්මක පර්යේෂණයයි."

**මාඕ සේතුං**
**උදෘත පාඨ**
**256 පිටුව**

# පල්දෝරු මාධ්‍ය භාවිතය

ධනවාදය තුළ වුවද සංවර්ධිත ධනවාදී රටවල් සහ පසුගාමී ධනවාදී රටවල් අතර විශාල වෙනස්කම් පවතින බව සරල සත්‍යයකි. දියුණු ධනේශ්වර රටවල සමාජයන් අත්පත් කර ගෙන ඇති ශක්‍යතා බොහොමයක් අත්පත් කර ගැනීමට පසුගාමී ධනේශ්වර රටවලට නොහැකිය. නිෂ්පාදනීය ආර්ථිකයක් සහිත රටවල සහ ඒ හා බැඳුණු ද්‍රව්‍යමය මිනිස් සබඳතාද අධ්‍යාත්මික මිනිස් සබඳතාද එමෙන්ම නිෂ්පාදනය නොවන ආර්ථිකයක් සහිත රටවල එම සබඳතා අතරද විශාල පරතරයක් ඇත. අද ලංකාවේ ගත් කළ ඇත්තේ මේ තත්වයන් දෙකටම වෙනස් සූදුකාර ආර්ථිකයක් සහිත සමාජයක් යැයි කිවහොත් වඩා යෝග්‍යය යැයි අපට හැඟේ. රටක ආර්ථිකය මූලික වශයෙන් සූදුකාරයන්, පාතාලයන්, දූෂිතයන්, සල්ලාලයන් මෙහෙයවන කල එම මෙහෙයුම් අධිකාරියේ ප්‍රතිවිපාක සමාජයේ සියලු දහරාවක්ම ග්‍රහණයට හසු කර ගනී. අද ලංකාවේ මාධ්‍ය ගැනද කිවයුත්තේ එයමයි.

සූදුකාරයන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, ජනතා දේපළ කොල්ලකන පාතාල දේශපාලුවන්ට රටේ ජනමාධ්‍ය හැසිරවිය හැකි තත්වයකට පරිවර්තනය වී ඇති අතර රටේ දේශපාලන බල අධිකාරිය තුළද ඔවුන්ගේ බලපෑම ඉහළය. දේශපාලන බලය හොබවන කොටසම රටේ මාධ්‍ය හසුරුවන්නේ නම් තත්වය මොනතරම් ඛේදජනකද යන්න අමුතුවෙන් කිවයුතු නැත. ඕනෑම යුගයක රජයන අදහස් උදහස් වූ කලී ඒ යුගයේ පාලක පන්තියේ අදහස් උදහස් වේ යන්න මාක්ස්වාදය අපට උගන්වන කාරණයයි. පොදුවේ ධනවාදය සම්බන්ධයෙන්ද ඒ නිගමනය එලෙසම වලංගුය. එහෙත් ඊනියා ධනේශ්වර සදාචාරයද ඉක්මවා ගොස් රටක මාධ්‍ය අමු අමුවේ ප්‍රසිද්ධියේ වෛශ්‍යා වෘත්තියේ යෙදවීමට තරම් යම් රටක පාලකයන් නිර්ලජ්ජිත තත්වයට ඇද වැටී ඇත්නම් එම රටට අත්විය හැකි ඉරණම ගැන අමුතුවෙන් පහදා දිය යුතු නැත.

මිනිසුන්ට වස කැවීම සඳහාත්, ඔවුන් රැවටීමට සහ නොමග යැවීමටත් අද ධනපති පන්තිය සතුව තිබෙන ප්‍රබලම අවිය ජනමාධ්‍ය යැයි කිවහොත් ඒ සමග කිසිවෙක් එකඟ නොවීමට තිබෙන ඉඩකඩ ඉතා අල්පය. පෑගී සිටින්නා වුද, සූරා කෑමට ලක්ව සිටින්නා වුවද අති මහත් ජනතාව රැවටීම සඳහා පොහොසතුන්ට, ධනවතුන්ට තිබෙන ප්‍රබල අවියක් ලෙස පුවත් පත් සහ අනෙකුත් මාධ්‍ය හැසිරෙන අන්දම ලෙනින් විසින් මීට ශතවර්ෂයකට පෙරම පහදා දී ඇත. එය දුප්පතුන් රැවටීමටත්, දූෂණය කිරීමටත්, මුලා කිරීමටත්, ධනපතියන් සතුව තිබෙන ප්‍රබල අවියක් බව ඔහු පෙන්වා දෙයි.

**"ඕනෑම කෙනෙක් දන්නා පැහැදිලි හා සරල සත්‍යය මෙයයි. එය කාටත් පෙනෙන හා වැටහෙන දෙයකි. එහෙත් එය හැමෝම වාගේ 'කුලැටි' ලෙස නිහඬව නොතකා හරිති. 'බයාදු' ලෙස මඟහරිති". - පුවත්පතේ නිදහස ගැන - ලෙනින්.**

අද ලංකාවේ සිදුවෙමින් තිබෙන්නේද මාධ්‍යවලට මෙම හැසිරීම 'කුළැටි' ලෙස සහ 'බයාදු' ලෙස මගහැරීමක් නොවේද?

මාධ්‍ය නිදහස ගැන පුරාජේරු කථා බොහෝ ඇසෙන මෙම වකවානුවේ ඇත්තටම එම නිදහස ඇත්තේ කාටද? එහි ප්‍රතිඵල මොනවාද යන්න ගැන ලෙනින් එදා කී කථා අදටත් වලංගුය. අද තරම් සංකීර්ණ මාධ්‍ය ජාලයක් නොතිබුණු ප්‍රධාන මාධ්‍ය බවට පුවත්පත පත්ව තිබූ යුගයකය ඔහු මෙසේ කියන්නේ.

**"ධනවාදී ව්‍යාපාරය අනුව පුවත්පත් නිදහස යනු පුවත්පත (මාධ්‍ය) පගාවට ගැනීම සඳහා පොහොසතුන්ගේ නිදහසයි. ඊනියා මහජන මතය හැඩග ස්වන්නටත්, ගොඩනගන්නටත් ඔවුන්ගේ වස්තුව පාවිච්චි කිරීම සඳහා නිදහසය"-පුවත්පතේ නිදහස ගැන -ලෙනින්**

අද වන විට ලාංකේය හුදී ජනතාව ඇන්දීමේ කලාව හොඳින්ම පුරුදු පුහුණු කර ඇත්තේ රටේ ජනමාධ්‍ය සහ ඒවායේ බොහෝ මාධ්‍යවේදීන් යැයි කිවහොත් එය වඩා නිවැරදිය. දේශපාලකයා, මාධ්‍යකරුවා සහ මාධ්‍ය හිමියාද අතර අද ඇත්තේ අවියෝජනීය සහ සම්බන්ධයකි. ඔවුන් එකිනෙකාව අන්දගන්නා ගමන්ම විටෙක ත්‍රිපාර්ශවයම එකතු වී ජනතාව අන්දවති.

අහිංසක වන සතුන් මරා 'සෙල්ෆි' ගසා ෆේස්බුක්වල දැමූ පසු ඒවා මාධ්‍යවල පුන පුනා ප්‍රදර්ශනය කරමින් නැවත නැවතත් 'චූන්' ගැනීමට තරම් අද බොහෝ මාධ්‍ය ප්‍රපාතයට ඇද වැටී ඇත. ඒවාට පහරදෙන ගමන්ම ඒවා පිළිකුල් කරන ගමන්ම (බොරුවට) ඒ ගැන රාත්‍රී ප්‍රවෘත්තිවලට පෙන්වා පිළිණු වූ දර්ශන නැවත පසුවදා උදේ වරුවේද දිවා කලද නැවත රාත්‍රියේද ප්‍රදර්ශනය කරයි. මේ සතුන්ට ඇති ආදරය නිසාද? පරිසරයට ඇති ආදරය නිසාද? නැතිනම් දඩ මස් පවා තම මාධ්‍යයේ 'රේටින්' වැඩි කර ගැනීම සඳහා වෙළඳපොළ භාණ්ඩයක් ලෙස යොදා ගැනීමේ ප්‍රාග්ධන තර්කනය නිසාද?

පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීවරයා කුඩා ළමුන් 09 දෙනෙකුට පාසලක් අහිමි වීම නිසා බෙල්ලේ වැලදා ගැනීමට යයි. ඉන් පසු සති ගණනක්ම එය මාධ්‍යවල උත්කර්ෂයට නගයි. අන්තිමට 'තෙවරප්පෙරුම සටනින් ජය ගනී' යනුවෙන් සිරස්තල සහිතව ඒ මාධ්‍ය සන්දර්ශනය හමාර කරයි. එම සිද්ධියේදී බොහෝ මාධ්‍ය හැසුරුණු අන්දම දිහා බැලූ විට හැඟී යන්නේ අප රටේ පාසල්වලට ඇතුල් කර ගැනීමේදී අසාධාරණයට ලක්වූ එකම දරුවන් අදාල සිද්ධියට අදාළ දරුවන් පමණක් බවට ලඝු කිරීමට අවිඥානිකව හෝ මාධ්‍ය හැසුරුණු බවයි.

දැන් ලංකාවේ සියලුම දරුවන් පාසල්වලට ඇතුලත් කර ගැනීමේ පහසුම ක්‍රමය සියලුම ආසනවල මන්ත්‍රීවරු කලාප අධ්‍යාපන කාර්යාලවලට ගොස් බෙල්ලේ වැල දා ගැනීමට තැත් කිරීමය. කිසිම දේකට නීතියක්, රීතියක්, විනයක් නැති රටක අධ්‍යාපනය සම්බන්ධයෙන්ද එය අපේක්ෂා කිරීම විහිළුවකි.

මීට දශක කිහිපයකට පෙර රටේ සදාචාරය, විනය, අපරාධ, විවිධ ජනතා ප්‍රශ්න ගැන කථා කිරීම බැරෑරුම් දෙයක් බවට පත්ව් තිබුණි. ඒ වෙනුවෙන් අරගල කිරීම ඊටත් වඩා බර සහිත කටයුත්තක් වී තිබුණි. එම කාල වකවානුවේ පීඩිත ජනතා කොටස්වල අවශ්‍යතා නියෝජනය කිරීම වාම දේශපාලනයට තිබූ ලොකු ශක්තියක්ව පැවතිණි. එක්තරා දුරකට වමට ඒ සඳහා ඒකාධිකාරියක්ද තිබුණි. ඒත් අද ඒ තත්වය සෑහෙන විපර්යාසයකට ලක් වී ඇත. අද ජනතා ප්‍රශ්න ගැන කථා කිරීම, අරගල කිරීම කිසිදු බරක් නැති සැහැල්ලු දේ බවට පත් වී ඇත. සැබෑ විසඳුම් නොව සරල, මතුපිට දෙයට 'විසඳුම් ලෙස පෙනෙන' යමක් කළ හැකිය.

> ❜ මාධ්‍ය සමාගම් විසින් කලින් සමාජ ව්‍යාපාර කළ කාර්යභාරය ස්වේච්ඡාවෙන් පවරා ගෙන ඇත. අද ජනතා ප්‍රශ්න එම මාධ්‍ය මගින් සංකල්පීය පාරිභෝගික භාණ්ඩ බවට පත් කර ඇත. ඒ නිසා අද ජනතා ප්‍රශ්න යනු මාධ්‍ය හිමියන්ගේ ප්‍රාග්ධන ගිණුම් තරකරන හුවමාරු භාණ්ඩ විශේෂයකි.

ඕනෑම පල්හොරෙකුට ඉතාම සුළු මොහොතකින් 'සංවේදී' 'ජනතා' නායකයෙක් බවට පත්වීමට පුළුවන.


**මාධ්‍ය සමාගම් විසින් කලින් සමාජ ව්‍යාපාර කළ කාර්යභාරය ස්වේච්ඡාවෙන් පවරා ගෙන ඇත. අද ජනතා ප්‍රශ්න එම මාධ්‍ය මගින් සංකල්පීය පාරිභෝගික භාණ්ඩ බවට පත් කර ඇත. ඒ නිසා අද ජනතා ප්‍රශ්න යනු මාධ්‍ය හිමියන්ගේ ප්‍රාග්ධන ගිණුම් තරකරන හුවමාරු භාණ්ඩ විශේෂයකි. බොහෝ මාධ්‍යවේදීන් යනු 'මාධ්‍යවේදී' යන ගරු නාමයෙන් හඳුන්වනු ලබන ඉහත ධනපති සමාගම්වල ශ්‍රමිකයින්ය. ඔවුන් ජනතා ප්‍රශ්න කථා කරන්නේ මොනතරම් සැහැල්ලුවකින්ද?**

අද ජනතා ප්‍රශ්න අර්ථකථනය කරන්නේද ඔවුන්ය. ඒවා කතිකාවන් බවට පත්කරන්නේද ඔවුන්ය. එම කථිකාවල නීති රීති නිර්ණය කරන්නේද ඔවුන්ය. මෙය ඉබේ සිද්ධ වූ දෙයක්ද? නැත. එය ප්‍රාග්ධනයේ සවිඥානික ක්‍රියාකාරීත්වයයි. වමේ භූමියෙන් ජනතා ප්‍රශ්න උදුරාගෙන ඒවා අද ධනපතියන්ගේ ප්‍රාග්ධනය තරකරන පාරිභෝගික භාණ්ඩ බවට පත් කිරීමට තරම් අද ධනපති මාධ්‍ය සූක්ෂම වී ඇත. අද මිනීමරුවන්ගේ හිස මතට ධාතු වඩන්නේද ඔවුන්ය. පාදඩයින් මඟමානවකයින් කරන්නේද ඔවුන්ය. පුස්සන් නිස්සන් කොට නිස්සන් පුස්සන් කරන්නේද ඔවුන්ය.

ගංවතුරට යට වූ මිනිසුන්ට අනුන් දෙන ආධාර තමන්ගේ ඒවා මෙන් බෙදන විට, දූෂණයට, වංචාවට, විරුද්ධව කථා කරන විට, සියලු වර්ගයේ අපරාධ ප්‍රතිනිර්මාණය කර නිවුස් හදන විට, අනතුරුවලින් මියගියවුන්ගේ සිරුරු පෙන්වන විට, නාය යාමෙන් විපතට පත් ජනතාව වෙනුවෙන් කතා කරන විට, සාලාව පිපිරීමෙන් අනාථ වූ ජනයා ගැන කථා කරන විට එහි දී පෙරමුණේම සිටින්නේ තමන් බව රටට පෙන්වීමට මෙම මාධ්‍ය මොනතරම් දැගලිල්ලක් දඟලන්නේද? ඔවුන් මහජනයාට ඒත්තු ගන්වන්නට හදන්නේ එක් දෙයකි. එනම් "අනේ මේ මාධ්‍ය කට්ටිය කොච්චර ශෝක්ද? අනේ ඒ ගොල්ලො මිනිසුන්ට කොච්චර ආදරේද?" යන්නය. අද කුස පිළිසිඳගත් දරුවාගේ සිට හෙට මිය යාමට නියමිත මහල්ලා දක්වා තමන් වටා භ්‍රමණය වන දුහුවිලි කැබලි බවට පත් කර ගැනීම සඳහා රටේ මාධ්‍ය දරන්නේ මොන තරම් වෙහෙසක්ද?

රටේ පවතින ජඩ දේශපාලනයට ගැලපෙන මිනිසුන් නිපදවන ෆැක්ටරි බවට අද බොහෝ මාධ්‍ය පත් වී ඇත. මීට ටික කලකට ඉහතදී එක නාලිකාවක් සිදු කළේ සමාජයේ විවිධ පීඩිත චරිත ගෙන්වා සාකච්ඡා කර ඔවුන්ගේ අන්ත අසරණ ජීවිතවල ඇතුළාන්තය මුළුමනින්ම එළියට ගැනීමය. එම වැඩසටහන මෙහෙය වූ නිවේදිකාව පවා අර දුකට පත් වූ චරිතය සමග කඳුළු පෙරමින් හඬන සෙයක් හඟවමින් ඉතා අපූරුවට එම වැඩසටහන මෙහෙයවන ලදී. එක් දිනක මේ වැඩසටහනට ගෙනවිත් තිබුනේ ගණිකා වෘත්තියේ යෙදෙන කාන්තාවකි. සාකච්ඡාව අවසාන මොහොතට ආසන්න වන විට අර කාන්තාව හදවතින්ම හඬා වැටෙන අතර නිවේදිකාව කඳුළු වැටීමට ඔන්න මෙන්න තත්වයක් මවා පෙන්වීය. කටහඬ කඳුළු බර කෙඳිරියක් බවට පත් වී තිබුණි. ඉන් පසු අපූරු දෙයක් සිදුවී තිබුණි. අර නිවේදිකාව අදාළ නාලිකාව තුළ එම වැඩසටහන මෙහෙයවන විටත් හොර රහසේම තවත් නාලිකාවක ඊට වඩා වැඩි වැටුපකට ගිවිසුම් ගසා තිබීමය. එම නිවේදිකාවට එම වටිනාකම ආවේ කොහෙන්ද? අර අසරණ කාන්තාවගේ කඳුළු විකිණීම සඳහා තමන් ලබා දුන් දායකත්වයේ සංකේත වටිනාකම නිසා නොවේද? ඒ සංකේත වටිනාකමට අර තමන්ගේ ළමුන් පෝෂණය කිරීම වෙනුවෙන් තම ලිංගික අවයව කුලියට දුන් ස්ත්‍රියගේ කඳුළු එකතුවී තියෙන බව ප්‍රේක්ෂකයින් වැඩි දෙනෙක් තේරුම් ගන්නට අසමත්ය.

මිනිසාද අලෙවි භාණ්ඩයක් සේ ගණන් ගන්නා ධනවාදයට ඔහුගේ ප්‍රශ්න අලෙවි භාණ්ඩ නොවන්නේ කෙසේද? ලස්සන වචනවලින් වසා ඇති 'මනුසත් මාධ්‍යවල' ඇතුලාන්තය දැකීමට නම් සියුම් දේශපාලනික කියවීමක් ප්‍රගුණ කළ යුතුමය.



ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස්
වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2016 ජූලි 05

# වෘත්තීමය සභාවල අරමුණ විය යුත්තේ ජනතාව ආරක්ෂා කිරීමයි

## පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා

(හෝමියෝපති පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට එක්වෙමින්)

ලෝකයේ විවිධ වෛද්‍ය ක්‍රම තිබෙනවා. එක් එක් කාලවලදී ඒ වෛද්‍ය ක්‍රම සොයා ගෙන තිබෙන්නේම ජනතාවගේ ජීවිත සුවපත් කරන්නත්, ජනතාවට වඩා හොඳ ජීවිතයක් උරුම කර දෙන්නත්, දැන් අපේ රට ගත්තොත්, අපේ ප්‍රමුඛ වෛද්‍ය ක්‍රමය බවට පත් වෙලා තිබෙන්නේ බටහිර වෛද්‍ය ක්‍රමයයි. ඒ හැර තිබෙන සියලුම වෛද්‍ය ක්‍රම විකල්ප වෛද්‍ය ක්‍රම හැටියට හඳුන්වනවා. ඒ යටතේ, දේශීය වෛද්‍ය ක්‍රමයට අයත් ආයුර්වේද, සිද්ධ, යුනානි වාගේම හෝමියෝපති, ඇලෝපති, චීන කටු චිකිත්සාව වැනි සියලුම දේවල් තිබෙනවා.



### හැමෝම වෙද්දු වූ රටක්

බටහිර වෛද්‍ය ක්‍රමය පැමිණෙන්න පෙර, මේ විවිධ වෛද්‍ය ක්‍රම ඉතාම දක්ෂ ආකාරයට අත්හදා බැලූ රටක් තමයි අපි. 1666දී ලංකාවට ඇවිල්ලා වසර 19යි. මාස 6යි. දින 14ක් සිරගත වෙලා හිටපු රොබට් නොක්ස් ඔහුගේ "එදා හෙළදිව" පොතේ කියනවා, මේ රටේ තිබුණු එවැනි වෛද්‍ය ක්‍රම ගැන. ඔහු මෙහෙම කියනවා.

"මේ රටේ එක් විශේෂයක් ඇත. එනම් රටේ හැමෝම වෙද්දුය. මේ රටේ ඒ සඳහා වෙන වෙනම නම් දැරූ විශේෂ වෛද්‍යවරු හෝ ශල්‍ය වෛද්‍යවරු හෝනැත්තාහ. කෂාය, බෙහෙත් ගැන හා කැපුම්, කෙටුම්, පැස්සුම් ගැන කොයි කාටත් සාමාන්‍ය පළපුරුද්දක් ඇත්තේය. ඔවුන් ඔහු පිළියෙල කරන්නේ ගස් වැල්වල කොළ පොතු ආදියෙනි. වමනය කරවීමටත්, විරේකය කරවීමටත්, අලුත් වණ සුව කර ගැනීමටත්, ඇස් රුදා ආදිය සනීප කර ගැනීමටත් ඔවුහු ගස්වල කොළ පොතු පාවිච්චි කරන්නාහ."

විශේෂයෙන් ශල්‍ය වෛද්‍යවරු හෝ විශේෂ වෛද්‍යවරු නොසිටියාට, මේ රටේ හැමෝම වෙද්දු කියලා තමයි එදා රොබට් නොක්ස් සඳහන් කරන්නේ. ඒ වාගේම අපේ දක්ෂකම් ගැනත් එතුමා මෙහෙම කියනවා;

"උගුල් ඇටවීමටත්, හන්දි වෙදකමටත් ඔවුන් තරම් දක්ෂයෝ මුළු ලෝකයේම නැත්තෝය. බතකුත් මාළු දෙකකුත් උදවු වන්නට කලියෙන් ඔහුට පත්තුවක් ගල්වා බිඳුණු හන්දියක් ප්‍රකෘතිමත් කළ හැකිය."

එහෙම වෛද්‍ය ක්‍රම තිබුණු රටක් තමයි, මේ රට. ලෝකයේ ප්‍රවණතාව ගත්තත්, ලෝක සෞඛ්‍ය සංවිධානය මීට වසරකට කලින් සමීක්ෂණයක් කරලා මේ විකල්ප වෛද්‍ය ක්‍රම සඳහා ජනතාවගේ තිබෙන නැඹුරුව පිළිබඳ වාර්තාවක් එළිදැක්වුවා. ඒ අනුව ඔවුන් කියනවා. ප්‍රංශ ජනතාවගේ සියයට 75ක්, කැනඩාවේ සියයට 70ක්, ඕස්ට්‍රේලියාවේ සියයට 48ක්, ඇමෙරිකා එක්සත් ජනපදයේ සියයට 42ක් පමණ විකල්ප වෛද්‍ය ක්‍රම සඳහා යොමුවන, පෙළඹෙන ප්‍රවණතාවක් තිබෙනවා කියලා.

මම කලින් කිව්වා වාගේම, මේ කවර වෛද්‍ය ක්‍රමයක් ගත්තත් ඒ සියල්ලේම අරමුණ බවට පත්වෙලා තිබෙන්නේ ජනතාව නීරෝගිමත් කිරීමයි. අපි විවිධ නම් දමා ගෙන හිටියාට, මේ බොහෝ වෛද්‍ය ක්‍රමවේදවල යම් යම් සමානකම් තිබෙනවා. ඒ නිසා ජනතාව සුවපත් කරන්න, ජනතාවගේ ජීවිත නඟාසිටුවන්න තිබෙන මේ වෛද්‍ය ක්‍රම අනිවාර්යෙන්ම නියාමනය කළ යුතු වනවා. ඒ වෛද්‍ය සේවයේ නිරත වන අය පුහුණු කරන්න. ඔවුන්ගේ පුහුණුවට අදාළ යම් තත්ත්ව පිළිබඳව අගයන්න. ඒ ආයතන පිළිබඳව සොයා බලන්න. ඒ ඒ වෛද්‍ය ක්‍රමවල තිබෙන ඖෂධ, ප්‍රතිකාර ක්‍රම පිළිබඳව සොයා බලන්න යනාදී සියලු කාරණා සම්බන්ධයෙන් යම් නියාමන පද්ධතියක් අවශ්‍ය කරනවා. ඒ සඳහා තමයි මෙන්න මේ වෛද්‍ය සභා වුවමනා කරන්නේ.

### පාර්ලිමේන්තුවට වගවීම

ඒ නිසා අපි හිතනවා, මේ කවර හෝ වෛද්‍ය සභා ස්වාධීන, අපක්ෂපාති වන තරමට, ඒ වෛද්‍ය සභා වෘත්තීයභාවයක් සහිත වන තරමට එයින් ජනතාවට සෙත සැලසීම වඩාත් වැඩි වෙනවා කියලා. ඒ අනුව තමයි අද අපි බහුලව භාවිත කරන බටහිර වෛද්‍ය ක්‍රමය එංගලන්තයේ General Medical Council අපට ගෙනැත් දුන්නේ. ඔවුන්ගේ අරමුණු මොනවාද කියලා එංගලන්ත වෛද්‍ය සභාව බොහොම පැහැදිලිව කියා තිබෙනවා; "We are not to protect doctors.Their interests are protected by others. Our job is to protect the public" එංගලන්ත වෛද්‍ය සභාවේ අභිප්‍රාය වෛද්‍යවරු ආරක්ෂා කිරීම නොවෙයි. වෛද්‍යවරු ආරක්ෂා කරන්න ඕනෑ තරම් කට්ටිය ඉන්නවා. ඒ නිසා ඔවුන්ගේ අභිප්‍රාය තමයි ජනතාව ආරක්ෂා කිරීම. එතැනින් එහාට ගිහිල්ලා ඔවුන් කියනවා. "We are independent of Government and the medical profession and

15වැනි පිටුවට

2016 ජූලි 07

# ජනතාවට මිථ්‍යාවෙන් ගැලවෙන්නට උදව් කළ යුතුයි!

(ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා

අපේ රටේ විද්‍යාඥයන් දිගුකාලීනව කරන ඉල්ලීමක් තමයි, පර්යේෂණවලට මුදල් වෙන් කරන්න කියන එක. ඒක රජයක් වශයෙන් අයවැයකදී කළ යුතු දෙයක්. නමුත් ඊළඟට තිබෙන ප්‍රශ්නය, අපි කරන පර්යේෂණ පැහැදිලිවම කුමක් ඉලක්ක කර ගෙනද කරන්නේ කියන එක. ශුද්ධ පර්යේෂණ -pure research- අපි ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. ඒක රටකට අත්‍යවශ්‍යයි. නමුත් අපට පෙනෙනවා. විශේෂයෙන්ම රජයට සම්බන්ධ දෙපාර්තමේන්තු යටතේ පවතින පර්යේෂණ ආයතන ගොඩක් MSc target කර ගත් පර්යේෂණ සිද්ධ කරන බව.

### පර්යේෂණ ඉලක්ක අවුල

මම උදාහරණයක් කියන්නම්. අනුර දිසානායක සහෝදරයාත්, මමත් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග ඇමති සහ නියෝජ්‍ය ඇමති වශයෙන් හිටපු කාලයේ අපි හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු, පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ගෙන්නුවා. ඒ ආයතනය ඉතා වැදගත් ආයතනයක්. නමුත් අපි එහි අවුරුදු දෙකක සියලුම පර්යේෂණ පත්‍රිකා ගෙනැල්ලා සාකච්ඡා කළා. එහි අදාළත්වය ගත්තොත් එය කරන පුද්ගලයාට පමණයි එය අදාළ වෙන්නේ. 1956 පිහිටුවන ලද ගමක වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් පර්යේෂණ පත්‍රිකාවක් තිබුණා. මම කියන්නේ නැහැ. කිසිම පර්යේෂණයක් නොවැදගත් කියලා. නමුත් අපට අදාළ, අත්‍යවශ්‍ය පර්යේෂණ තිබෙන්න ඕනෑ. මේ විද්‍යාත්මක ආයතනවල තිබෙන ප්‍රශ්නයක් තමයි, ඒවායේ පර්යේෂණ ඉලක්ක ශුද්ධ පර්යේෂණ වුණත්, ව්‍යවහාරික -applied- පැත්තට යොමු වන ප්‍රමාණය හරිම අඩුයි. පර්යේෂකයන් පිළිබඳව අපට ගරුත්වයක් තිබුණාට, ඒ පර්යේෂකයන් විසින් රටට ගෙනැත් දුන්නු ආර්ථික සහ සාමාජයීය ජයග්‍රහණ මොනවාද කියලා බැලුවොත් මා හිතන්නේ රටේ ජනතාව තුළ ඔවුන් පිළිබඳව එච්චර ලොකු ඇගැයීමක් නැහැ. අවංකව ගත්තොත් පෞද්ගලිකව අපට නම් මතක් වෙන්නේ නැහැ. අපේ රටේ විද්‍යාඥයෙකු විසින් හඳුන්වා දුන්නු මෙන්න මේ පර්යේෂණ හරහා අපට හොඳ ප්‍රතිලාභයක් ලැබිලා තිබෙනවාය කියලා. ඒක ඒ ගොල්ලන්ට විතරක් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. ලොකුම ප්‍රශ්නය හැටියට තිබෙන්නේ ඔවුන් ඉදිරිපත් කරන්නා වූ සොයා ගැනීම්, යෝජනාවන් ක්‍රියාත්මක කරන්න රාජ්‍යමය වශයෙන් සහ වාණිජමය වශයෙන් කවුරුවත් ඉදිරිපත් වෙන්නේ නැති එකයි. පර්යේෂණ ඉලක්ක ගත්තාමත් අපට පැහැදිලිව



පෙනෙන්න තිබෙනවා. පෞද්ගලික අධ්‍යාපනික අරමුණුවලට එහා ගිය සමාජයීය වශයෙන්, ක්ෂේත්‍රයීය වශයෙන් යොමු වීම අඩුයි කියලා. මේ පර්යේෂණය කරන්න කියලා විද්‍යාඥයින්ට නියෝග කරන්න අපට බැහැ. නමුත් එවැනි සංස්කෘතියක් විද්‍යාත්මක ප්‍රජාව ඇතුළේ ගොඩ නැගිය යුතුයි කියලා මා හිතනවා.

### ජනමාධ්‍ය මිථ්‍යාව වපුරනවා

ඊළඟට විශේෂම කාරණය හැටියට මම මේ කාරණයත් කියන්න කැමතියි. විද්‍යා පර්යේෂණ ආයතනයක් හදන වෙලාවේ අපි ඉතා පැහැදිලිවම කියන්න ඕනෑ. අපේ රට දැනුවත්ව මිථ්‍යාවට ගෙනියමින් ඉන්න බව. මම නැවත නැවතත් කියන දෙයක් තමයි, සාමාන්‍ය මිනිසුන්ට කිසිම රූපවාහිනී නාලිකාවක විද්‍යාව උගන්වන්න විනාඩි තිහක් වෙන් වන්නේ නැති බව. විද්‍යාව උගන්වනවාය කියන්නේ බුධ ග්‍රහයාගේ කක්ෂය වෙනස්වෙලා තිබෙන්නේ කොහොමද කියන එක නොවෙයි. **හැබැයි, හැම මාධ්‍ය නාලිකාවකම -channel එකකම. සාස්තරකාරයෝ ඇවිල්ලා laptop තියාගෙන උදේට පැය ගණන් අමු බොරු කියනවා. මේවා අපි අහගෙන ඉන්නවා. කුමන නාමයකින්ද මේවා කෙරෙන්නේ? මොවුන් බරපතළ ගණයේ වංචනිකයෝ. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාව මේ රටේ සාස්තරකාරයෝ අනාථ කරලා තිබෙනවා. දැන් ඔප්පුවෙලා තිබෙනවා නේ, මේ රටේ සාස්තරකාරයෝ බොරු කිව්වේ කියලා.** එහෙම තත්වයක් තිබියෙදී මම හිතනවා, ආණ්ඩුවක් වශයෙනුත් පර්යේෂකයන් වශයෙනුත් වාගේම ජනමාධ්‍යවලටත් මේ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවාය කියලා. හැම දාම උදේ 8.00 ඉඳලා 9.00 වන තුරු මිනිසුන්ගේ ඔළු කුණු කරනවා. මේ කරන කටයුත්ත වැරැදියි.

එකඟවෙලා විතරක් මදි. ඇමතිතුමාට ඒ සඳහා බලය තිබෙනවා. මේ කටයුත්ත කරන්න කියලා මම යෝජනා කරනවා. මම කියන්නේ මෙකයි. මිනිස්සු කැමැති නම් ඔවුන් සාස්තර ඇහුවාට අපට ප්‍රශ්නයක් නැහැ. අපට ඒක නතර කරන්න බැහැනේ. නමුත් ජනමාධ්‍ය කියන්නේ මහ ජනතාවට තිබෙන දේපළක්. ඒ frequency පාවිච්චි කරලා ඕනෑ කුණුහරුපයක්, ඕනෑ කුණු ගොඩක් පෙන්නුවාට වැඩක් නැහැ. මම නම් කියන්නේ ඔය පැය තුළ blue film එකක් පෙන්නුවත් ඔච්චර නාස්තියක් වෙන්නේ නැහැ කියලායි. උදේ 8.00 ඉඳලා 9.00 වනතුරු ඔළු කුණු කරන සාස්තරවලට වඩා කුණුහරුප පෙන්නුවොත් අඩු හානියක් තමයි වෙන්නේ. මිනිස්සු කැමැති නම් ගිහිල්ලා සාස්තර බලා ගත්තාවේ. හැබැයි, මේවා ඉතාම වැරැදි මත.

රජයක් වශයෙන් ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා. එම නිසා මේ පර්යේෂණ ආයතනයේ ඔබතුමා විශේෂ ඒකකයක් පිහිටුවන්න. මෙවැනි දේ සම්බන්ධයෙන් කටයුතු කරන්න. මේ දේවල් තහනම් කරන්න බැරි නම්, මේ මිථ්‍යා මත සම්බන්ධයෙන් රජයේ පර්යේෂණායතනය සහ National Science Foundation එක counter කරන්න ඕනෑ. National Science Foundation එක කියන්න ඕනෑ. මේවා බොරුය කියා. එතකොට වාදයක්නේ. අද ඒක වෙන්නේ පෞද්ගලික මට්ටමෙන්. රටේ භෞතිකවාදී සංගමයෙන්, නැත්නම් සමහර විද්‍යාඥයන්, ඒ වාගේම සමහර දොස්තර මහත්වරුන් තනි තනිවම ඒක කරනවා. ඒ අය තනි තනිවම කරන දේවල් තමයි තියෙන්නේ. එහෙම නොවෙයි. කළ යුත්තේ. මේවායින් කී දෙනෙක් මැරිලා තියෙනවාද කියන එක ඔබතුමා දන්නවා. දූවරුන් දෙන්නෙක් මැරුණා. මොකක්ද විශේෂ බලයක් තිබෙනවාය කියා දරුවෝ දෙන්නාට තැඹිලි ගෙඩියක් බොන්නට දීලා. ඒ සිද්ධිය වෙලා දැනට මාස ගණනක් වෙනවා. මේ අය පල් බොරු කරන්නේ.

රත්රන් පොරවා ගත් එක් ශාස්ත්‍රකාරයෙක් ඉන්නවා. එයාගේ රත්රන් හොරකමක් සිදු වුණාය කියා පැමිණිලි කරන්නේ තලාතුඔය පොලීසියට. තමන්ගේ නැති වෙච්ච රත්රන් හොයා ගන්න බැරි වෙච්ච මිනිහා කොහොමද, අපේ ප්‍රශ්න විසඳා දෙන්නේ? අපි ඉල්ලා සිටිනවා, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවෙන් මේ මිථ්‍යාව සම්බන්ධයෙන් අධ්‍යයනය කර, සමාජයීය වශයෙන් ඒ ඒ මොහොතේ පවතින, ජනතාව මං මුළා කරන, ජනතාව නාස්ති වෙන මේ තත්වය නැති කරන්නට කටයුතු කරන්නටය කියා.

## කවුළුව හැර තබමි

# යෝගී සහ ජෝගී

ලක්ෂ 700 ක මූල්‍ය වංචාවකට පසුගියදා බන්ධනාගාර ගත කළ පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ 'නීති' පුත්‍රයා බන්ධනාගාරයේදී අපූරු ප්‍රකාශයක් කර තිබූ අන්දම මාධ්‍යවල පළවී තිබුණි. ඔහුගේ සුව දුක් බැලීමට ගිය ප්‍රමුඛ නඩයටට ඔහු කියා තිබුණේ "මම දැන් මෙකෙ හිරකාරයන්ට යෝගී භාවනා උගන්වනවා" කියාය. ඔහුගේ පියතුමාද පසුගිය දිනවල කකුල් දෙකෙන් එල්ලී යෝගී භාවනා කරන සංදර්ශනයක් මාධ්‍යවලින් අපි දුටිමු. රටේ මහජන මුදල් සිත් සේ කාබාසිනියා කරමින් ජෝගී නටා රටම ජෝගියක් කළ රාජපක්ෂ නඩය දැන් හිරකාරයන්ට යෝගී භාවනා ප්‍රගුණ කරමින් සිටී.

අපි අසා තිබෙන පරිදි යෝගී භාවනාවලින් කරන්නේ, මිනිසා කායිකව සහ මානසිකව පිරිපුන් බවට පත්කිරීමය. එය සත්‍යනම් වැඩිකල් නොගොස් මැගසින් බන්ධනාගාරය වසා දැමීමට සිදුවනු ඇත. ඒ, නාමල්ගේ යෝගී පංතිය නිසා හෙට දින එහි සියලු අපරාධකරුවන් තවදුරටත් සිරකරුවන් ලෙස තබාගැනීමට අවශ්‍ය නොවන නිසාය. සමහර විට නාමල් පුතා යෝගී ඉගෙන ගෙන ඇත්තේ තාත්තාගෙන් විය හැක. තාත්තාගෙන් යෝගී ඉගෙන ගත් නඩය නටන "ජෝගී" දුටු විට පුතාගෙන් යෝගී ඉගෙන ගන්නා අය නටන "ජෝගී" ගැන අපට හිතාගත හැක.

නාමල් යෝගී භාවනා කරන්නේ තමන් විඳින දඬුවම් නිසා ඇති වූ මානසික සහ ශාරීරික ආතතිය සමනය කර ගැනීමට නම් එය කිසිවෙකුටත් ප්‍රශ්නයක් නොවේ. එහෙත් එය එසේ නොවන බව රාජපක්ෂවරුන්ගේ කැරට්ටුවද  දන්නා අය දනිති. ඔවුන් අපායට ගියත් කල්පනා කරන්නේ නැවත බලයට එන එක ගැනය. ඊට දැමිය යුතු දහං ගැට ගැනය. 'තමා අත වරද නැත. හිරගෙදරදී වුවද මෙතරම් සැහැල්ලුවෙන් සිටින්නේ ඒ නිසාය. බලන්න රාජපක්ෂවරු මොන තරම් පිරිසිදුද? එඩිතරද කියා.' යෝගී නාමල් රටට දෙන්න හදන හැඟවුම එබඳුය. මහජන මුදල්වලින් ජෝගී නටා හිරේට ගිය නාමල් හෙට දින "යෝගී මුනිවරයෙකු" වී එළියට ආවද අපටනම් පුදුමයක් නැත. ඒ, මේ "ජෝගී" රටේ ඒවා සිම්පල් වැඩ නිසාය.



# සටනක පෙළගැස්ම




සයිටම් හෙවත් මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට සහ එහි උපාධි කඩයට එරෙහිව වසර කිහිපයක සිට විරෝධතා රැල්ලක් හටගෙන ඇත. විශ්වවිද්‍යාල සිසුන්, වෛද්‍යවරුන්, ආචාර්ය මහාචාර්යවරුන්, කලාකරුවන්, විවිධ වෘත්තිකයන් ඊට එරෙහිව විශාල හඬක් නගමින් සිටින බව පෙනෙන්නට තිබේ. පසුගියදා මේ සියලු ක්ෂේත්‍ර නියෝජනය කරමින් මහජන රැලියක්ද හයිඩ් පිටියේදී පවත්වන ලදී. ඔවුන්ගේ එකම හඬ වූයේ සුදුසුකම් නැති අය මුදල් වෙනුවෙන් වෛද්‍යවරුන් ලෙස භෞතිස්ම කර සමාජයට දැමීම ජනතාවට මහත් අනතුරක් බවයි. රටේ දරුවන්ට තමන් සුදුසුකම් ලබා ඇති ක්ෂේත්‍රයක වැඩිදුර අධ්‍යාපනය ලැබීමට ඇති අයිතියට අපි ඉහළින්ම ගරු කරමු. ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම රජයේ වගකීමයි.

වෛද්‍ය වෘත්තිය යනු ඉතා වගකීම් සහගත වෘත්තියක් බව ලොවම පිළිගන්නකි. එය මූලිකවම වගකියන්නේ මිනිස් ජීවිතවලටය. එහිදී වෛද්‍යවරයකු ලෙස සේවයේ යෙදෙන්නා ප්‍රගුණ කළ යුතු අධ්‍යාපනය සහ ශික්ෂණය ගැන අමුතුවෙන් කිවයුතු නැත. එය නිමි ඇඳුම් නිපදවන ෆැක්ටරියකින් තොගපිටින් වෙළඳපොළට ඇඳුම් නිකුත් කරන වර්ගයේ වැඩක් නොවේ. මෙතන ප්‍රශ්නය ඇත්තේ මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන්ගේ නොව මුදල් හම්බවෙන්නේනම් ඕනෑම දෙයක් විකිණීමට සූදානම් 'සිස්ටම්' එක තුළය.

මීට පෙර එජාප ආණ්ඩු සමයකදී රාගම පෞද්ගලික විශ්ව විද්‍යාල ප්‍රශ්නයේදී වටිනා තරුණ ජීවිත කොපමණ සංඛ්‍යාවක් පාලකයින් විසින් බිලි දී ගත්තේද යන්න රටට අමතක විය නොහැක. අමතක කළද නොහැක. එක රැයකින් 'සුපර් ස්ටාර්ලා' තොග ගණනින් නිපදවා එළියට දමන මාධ්‍ය ෆැක්ටරි තිබෙන මේ රටේ හෙට දින ඒ ආකාරයෙන්ම වෛද්‍ය ෆැක්ටරිද බිහිවන්නට පුළුවන. ධනවාදයට වටින්නේ මිනිසා නොව මුදල පමණක්ය යන්න නැවත මතක්කර ගැනීමට සිදුවන්නේ මේ නිසාය.

# ලෙයට ලෙයම ඉල්ලන පිසාචයෝ

පසුගියදා යාපනය විශ්වවිද්‍යාලය තුළ සිදු වූ සිසු ගැටුමෙන් වඩාත්ම සතුටට සහ ප්‍රමෝදයට පත්වී සිටින කණ්ඩායම මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ ඔහු වටා සිටින ජාතිවාදී නඩය බව පෙනෙන්නට තිබේ. බලය සඳහා ඕනෑම පහත් මාවතක් තෝරා ගැනීමට දෙසැරයක් නොසිතන මෙම කල්ලිය එම සිද්ධිය තම මජර අරමුණ සඳහා පවුරක් කර ගැනීමට තතනමින් සිටී. කිසිදු හිරිකිතයකින් තොරව මෙම සිද්ධියේදී සුපුරුදු ජාතිවාදී විෂ විදිමින් මහින්ද රාජපක්ෂ ප්‍රකාශ කළේ "අපි ආණ්ඩු කරන කාලෙ සිංහල සිසුන්ට ඔහොම ගැහුවෙ නෑ. අපි ඒවට ඉඩ තිබ්බෙ නෑ. දැන් ඔබට සතුටුයි නේ" කියාය. සිංහල ප්‍රජාවගේ ජාතිවාදී හැඟීම් ඇවිස්සීමේ යටි අරමුණ සහිතව කළ මෙම ප්‍රකාශය ඔහුගේ නිර්ලජ්ජිත ජාතිවාදය නැවත වතාවක් මතුකර පෙන්වීමකි.



පහර කෑමට ලක්වූ සිංහල සිසුවා බැලීමට විමල් වීරවංශ ප්‍රමුඛ නඩයද රෝහලට යන අන්දම රූපවාහිනියෙන් පෙන්වන ලදී. එහිදී මාධ්‍යවලට ප්‍රකාශයක් කරමින් ඔහු කීවේ මෙම පහරදීම සිංහල ශිෂ්‍යයකු විසින් දෙමළ ශිෂ්‍යයකුට සිදු කළා නම් තත්වය කෙබඳුවේද කියාය. මෙබඳු හැසිරීම්වල අරමුණ ජාතිවාදී නයි විෂ දකුණේ සමාජයට මුදාහැරීම  බවට සැකයක් නැත.

මීට පෙර දකුණේ සිංහල විශ්ව විද්‍යාල සිසුන්ද තම තමන්ගේ ඔළු පළා ගෙන ඕනෑ තරම් රෝහල් ගතවී සිටි අවස්ථා අපි දුටුවෙමු. පොලීසිය විසින්ද සිසුන්ගේ ඔළුපලා රෝහල් ගතවී සිටි අවස්ථාද එමටය. එම කිසිදු අවස්ථාවක අර 'ජාතිමාමක නඩයට' එම සිසුන්ගේ සුවදුක් බැලීමට තරම් සිතක් පහළ වූයේ නැත. මෙහිදී ඔවුන්ට බරපතළ ප්‍රශ්නය වී ඇත්තේ දෙමළ සිසුවෙකු සිංහල සිසුවෙකුගේ ඔළුවට පොල්ලෙන් ගැසීමය. සිංහල කොල්ලාට දෙමළ කොල්ලා ඔළුවට ගසා ඇත්තේ දෙමළ පොල්ලකිනි. ඉතිං ඊට සිංහල පොල්ලකින් පිළිතුරු දිය යුතුය. මහින්දලා "ඔබට සතුටුදැයි" අසන්නේ ඒකටය.

යාපන විශ්ව විද්‍යාල සිසු ගැටුම අදාල සන්දර්භය තුල ඉතා ප්‍රවේශමෙන් විසඳාගත යුතු කරුණකි. එය දේශපාලන වැඩකි. එහිදී දශමයකින් හෝ ජාතිවාදයට ඉඩ නොතැබිය යුතුය. සිංහල දෙමළ ජාතිවාදී දේශපාලන නායකයින්ගේ ජඩ බල උමතුව නිසා ජාතිවාදී ලේ සාගරයේ ගිල්වා විනාශ කළ මිනිස් ජීවිත කොතරම්ද? එහෙත් බලය සඳහා නින්දා සහගත උමතුවකින් පෙළෙන ඉහත වර්ගයේ දේශපාලුවන්ට මිනිස් ජීවිත තව තවත් විනාශ වුවද ගාණක් නැත. මෙවැනි ජාතිවාදී සර්පයින් ගැන තීන්දුවක් ගැනීමට සිංහල දෙමළ, මුස්ලිම් ජනයා දැන්වත් පෙරට ආ යුතුය.

# පොලිටිකල් පංතිය

පොලිටික්ක පංතියට ආවෙ සෑඩ් මූඩ් ගහගෙන. පෙනුමත් නිදි මරලා වගේ හින්ද පංතියට එද්දි හැමෝම වගේ එක නිගමනේකට බැස්සා, පොලිටික්කගේ කවුරුහරි මැරිල...

"ගුඩ් මෝ..." වසන්තිය කටට ආවට කියන්න ගිහින් අන්තිමේදි බය හිතිල ඇකිළුව. "මළ ගෙවල් අස්සෙ මෝනිං එක ගුඩ් වෙන්නෙ කොහොමද?" වසන්තිය හිමීට කෙඳිරුව.

"කවුද සර් මැරිල තියෙන්නෙ?" චමිය මද්දුම බණ්ඩාර වගේ ඉදිරිපත් වුණේ හැමෝම මළ ගෙදර වගේ නිහඬ වෙලා ඉන්න අතරෙ.

"මැරිල... ආ... කවුද කියන්න නම් දන්නෙ නෑ, බර ගාණක් මැරිල නේද?" පොලිටික්ක එක පාරට ඇහැරිලා අහක යන බෝලෙකට බැට් එක දැම්ම.

"සර් කියන්නෙ ප්‍රංශෙ කේස් එක ගැනනෙ. අපි ඇහැව්වෙ සර්ගෙ කවුරුහරි මැරිලද කියල දැනගන්න." චමියගෙන් පැහැදිලි කිරීමක්.

"ඇයි මගෙ මූණ මළගෙදරක යන්න වගේද?" පොලිටික්කත් ඇහුවෙ පැහැදිලි කරගන්න.

"නෑ... එහෙම්මම නෙමෙයි සර්, ඒත් අප්සෙට් එක පේනව." මංජුව මූණු සාත්තරෙන් කිවුව.

"ප්‍රශ්නයක් නෑ ළමයිනේ, මේ දවස් ටිකේ නින්ද නම් ගියේ නෑ." පොලිටික්ක කොළේ වැහුව කියල එයාට ඇරෙන්න හැමෝටම තේරුණා.

"ගෙදර ප්‍රශ්නයක් නම් කියන්න එපා සර්." සමන කතා කළේ හැබෑම අනුකම්පාවෙන්.

"නෑ ළමයිනේ එහෙම ප්‍රශ්නයක් නෑ. මට... හිතට අමාරුයි නාමල් බේබි හිරබත් කනවට..." පොලිටික්කට හේතුව කියන්නම වුණා.

"නැහැනෙ නාමල් මන්ත්‍රීතුමා කන්නෙ ගෙදරින් ගේන කෑමනෙ." මංජුව වැඩේ කිංඩි කරල දැම්ම.

"කෑම නෙමෙයි ළමයිනෙ... අච්චර දුවල පැනල හිටපු ළමයට හිර කරල තියෙන එකට... බේබිට කොච්චර හිතට අමාරු ඇද්ද?" පොලිටික්ක ඒක කියපු විදිහට ළමයි දැනගත්ත පවුලෙ කෙනෙකුට දැනෙන විදිය.

"දුවල පැනල රගර් ගහපු කෙනා වුණාට මෙට්ටයක් නැතුව නින්ද යන්නෙ නැතිලු නේද?" චමිය හීනියට කිවුව හින්ද පොලිටික්කගෙ කණට ගියේ නැහැ.

"බේබි බේබි කිවුවට කරපු වැඩනම් බේබි සයිස් නෙමෙයි, ට්‍රිබල් එක්ස් එල්." මංජුව සද්දෙට කොක්ක ඇද්ද.

"මොනවද කරපු වැඩ. රටේ රගර් ක්‍රීඩාව දියුණු කරන්න හදපු එකද?" පොලිටික්කට මල.

"ඔව්, ඔව්, ඒකනෙ ඒ උත්තමයා කණ්ඩායමේ නායකත්වය ගත්තෙ... බලෙන් හරි චියර් කරන්න නේවි එකේ කට්ටිය බැස්සුවෙ... අනෙක රගර් ක්‍රීඩාව දියුණු කරන්න බාධාවක් වෙච්චචි රගර් ක්‍රීඩකයින්ට යන්නම දුන්නෙ.. මංජුව ක්‍රිමිනල් කේසුත් කියාගෙන යනව.

"හරි දැන් බලන්න මොනවටද අත්අඩංගුවට ගත්තෙ කියලා. ක්‍රිෂ් එකෙන් මිලියන 70ක් ගත්ත කියලනෙ. ඒක සිවිල් කේස් එකක්. සමාගම කැමැත්තෙන් දුන්න. නාමල් බේබි කැමැත්තෙන් ගත්ත." පොලිටික්ක නිදි මරාගෙන අහපු දේශපාලන වැඩසටහනක කෑලි දානව.

"මිලියන 70 කිවුවට මිනිස්සුන්ට හිතාගන්න බෑ. ලක්ෂ 700ක්, කෝටි 07ක් කිවුවම තමයි තේරෙන්නෙ." කනිය විශේෂඥ අදහස් දැක්වීමක.

"කවුරුවත් කෝටි 07ක් කැමැත්තෙන් දෙන්නෙ නෑ. ඇත්ත කතාව ඒ තමයි ආර්ඩීඑ් එකේ ඉඩම ක්‍රිෂ්ලට අරන් දීපු එකට කොමිෂන් එක. ඒක රගර්වලට ගියේ නැහැ; ගියේ නාමල්ගෙ සාක්කුවට. මහජන දේපළ කුණු කොල්ලෙට දීල"  මංජුව ගේම ඉල්ලනව. "දැන් කියයි මේ ඔක්කොම ඩේසි ආච්චිගෙ මැණික්වලට හම්බවුණු සල්ලි කියල."

"නෑ මංජු, අනික් ඒවා අතාරින්න. මේක නාමල් මන්ත්‍රීතුමාට තනිකරම අපහාසයක්" සමන මංජුව නතරවෙනකම් ඉඳල කිවුවම කට්ටියට හිග් ගෑවුණා.

"ඈ සමන් මොකද්ද ඒ කතාව" මංජුවටත් අප්සෙට්.

"අන්න සමන්ටත් තේරුණා... මේක පිටිපස්සෙ කතාව" පොලිටික්කගෙ කට කනේ. "නාමල් බේබි නීතීඥයෙක්. හරි වැරැද්ද හොඳට අඳුනනව."

"නීතීඥ විභාගෙනම් ලිව්වෙ වෙන කවුදලුනෙ... මේ හිරේට ගත්ත එක අපහාසයක්... නාමල් කෝටි 07ක් ගත්ත කියන පැහැදිලි අපහාසයක්. හම්බන්තොට වෝටර් ප්‍රොජෙක්ට් 06කින් විතරක් රුපියල් කෝටි 2000 ගාණක් සිංගප්පූරු එකවුන්ට් එකකට ගිහින් තියෙද්දි මෙතන තේ බීපු සල්ලිවලටනෙ හිරේ ගිහින් තියෙන්නෙ. මොන තරම් අපහාසයක්ද?" සමනගෙ කතාවට පංතියටම හිනායද්දි පොලිටික්කගේ කනට ගිය කට ඇද ගැහුවා. "සීඑස්එන් ගත්තා. හෙලෝකොප් ගත්තා..." සමන තව මොන මොනවද කිවුවත් හිනා සද්දෙ හින්ද ඇහුණෙ නෑ.

## වෘත්තීමය සභාවල

13 පිටුවෙන්



accountable in Parliament" කියලා. ඔවුන් වග කියන්නේ රජයට නොවෙයි. ඔවුන් වග කියන්නේ වෛද්‍ය වෘත්තිකයාට නොවෙයි. ඔවුන් වග කියන්නේ පාර්ලිමේන්තුවටයි. ඔවුන් කියනවා "Our powers are given to us by Parliament through the Medical Act 1983" ඒ නිසා එංගලන්ත වෛද්‍ය සභාවේ තේමාව බවට පත්වෙලා තිබෙන්නේ. "ජනතාව ආරක්ෂා කිරීම සහ ජනතාව නියෝජනය කරන ජනතා පරමාධිපත්‍ය පිළිබිඹු කෙරෙන පාර්ලිමේන්තුවට වග කීම"යි.

අපි මෑත කාලයේදී එක් එක් අය අතේ තිබුණු බලය මේ පාර්ලිමේන්තුවට ප්‍රදානය කළා; පාර්ලිමේන්තුවට අරගත්තා. පොලිස්පතිවරයා අතේ තිබුණු බලයෙන් කොටසක් අරගෙන ස්වාධීන පොලිස් කොමිසමට භාර දුන්නා. ඒ වාගේම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත් කිරීමේ බලයෙන් කොටසක් අරගෙන අධිකරණ සේවා කොමිසමට දුන්නා. රාජ්‍ය සේවයේ නිලධාරීන් පත් කිරීමේ බලය අරගෙන රාජ්‍ය සේවා කොමිසමට දුන්නා. ඒ වාගේම අපි හිතනවා, මෙවැනි ආයතන ස්වාධීන කරන්නත්, අපක්ෂපාතී කරන්නත්, ඒවායේ වෘත්තීයම හැකියා වැඩි කරන්නත් -බලයක් සහිත ආයතන හැටියට- පාර්ලිමේන්තුව යටතට පත් විය යුතුයි කියලා. නමුත් මේ ඉදිරිපත් කර තිබෙන හෝමියෝපති පනත තුළ සඳහන් කර තිබෙන හෝමියෝපති වෛද්‍ය සභාවේ ස්වාධීනත්වය සහ අපක්ෂපාතීත්වය එතරම් දුරට ආරක්ෂා කරනවාද කියන එක පිළිබඳව සැකයක් තිබෙනවා.

## මිථ්‍යාව තවමත්...

11 පිටුවෙන්

ආකාරයන්ගෙන් සමාජ විඥ්ඥානය තුළ මිත්‍යාවන්ද පවතිනු ඇත. මානව සමාජයේ දැනුම තුළ අවිද්‍යාව හා අසත්‍යය පවතිනු ඇත.

සමාජයේ දැනුම තුළ වන මෙම ප්‍රතිවිරෝධය සමාජයට ජනතාවට සිදුකරන හානිය සුළුපටු නොවේ. ඒ පිළිබඳව කථාකිරීමට

## අයාලේ යන...

07 පිටුවෙන්

මෙසේ කළ ගණනය කිරීමකදී 2015 වසරේ බස්නාහිර පළාත තුළ ප්‍රවාහන දාමයේ වියදම බිලියන 397කි. එය එම පළාතේ දළ දේශීය ආදායමෙන් 11.7%-12%ත් අතර අගයක් ගනී. මෙය වෙනත් ආකාරයකින් පැවසුවහොත් මිනිසුන් 100 දෙනෙකුගෙන් 12 දෙනෙක් ප්‍රවාහනය සඳහා පමණක්ම වැඩ කළ යුතු තත්වයක්ව පවතී.

ගණනය කර ඇති ආකාරයට තවත් 10% ක ප්‍රමාණයක් පොදු ප්‍රවාහනයෙන් ඉවත් වී පෞද්ගලික රථ වාහන සඳහා යොමු වුවහොත් ප්‍රවාහන දාමයේ මෙම වියදම තව 25%කින් (බිලියන 496.25 බවට) ඉහළ නගිනු ඇත. මෙයට හේතු වන්නේ රථ වාහන තදබදය වැඩිවීම හේතුවෙන් ඉන්ධන, වාහන ක්ෂයවීම්, මාර්ග තැනීම හා අලුත්වැඩියාව සඳහා රුපියල් බිලියන ගණනින් වියදම් වීමයි.

මේ මොහොතේ රටේ පවතින ආර්ථික මට්ටම අනුව 10%ක් නොව 1%ක ප්‍රමාණයක් හෝ පොදු ප්‍රවාහනයෙන් ඉවත් වුවහොත් එයට රටට දරා ගත නොහැකි වනු ඇති බව ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ මතයයි.

### ලෝක අත්දැකීම්

මෙරට තුළ රථවාහන තදබදය ජාතික තලයේ ප්‍රශ්නයක් බවට උඩු දුවමින් යද්දී ලෝකයේ මෙම රථවාහන තදබදයට සාර්ථක විසඳුම් ලබාදුන් රටවල් මෙන් නගරද තිබේ. සිංගප්පූරුව සහ හොංකොං එයට කදිම උදාහරණයන්ය. 1970 වකවානුවේදී පමණ සිංගප්පූරු පාලකයන් විසින් තමන්ගේ රටේ ඇති සීමිත ඉඩකඩ තුළ අසීමිත ලෙස මහාමාර්ග ඉදි නොකිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේ.

ඒ අනුව ඔවුන් මගී ප්‍රවාහනයේදී ප්‍රමුඛතාව දෙන ලද්දේ පොදු ප්‍රවාහනයටය. ඒ අනුව පෞද්ගලික වාහන අයිතිය සීමා කිරීම, භාවිතය සීමා කිරීම, ඒ වෙනුවෙන් විශාල වශයෙන් බදු මුදල් අය කිරීම මෙන්ම පොදු ප්‍රවාහන සේවය දියුණු කිරීමට ප්‍රමුඛතාවයක් ලබාදීම සිදුකෙරේ. විශේෂයෙන් මාර්ග සංඥාවලදී පෞද්ගලික වාහනවලට පෙර පොදු ප්‍රවාහන බස් රථ සඳහා මුලිකත්වය ලබාදීමේ නෛතික තත්වයන් මෙන්ම නවීන තාක්ෂණය යොදා ගනිමින් පොදු ප්‍රවාහන සේවා වැඩි දියුණු කිරීම ආදි කාරණාද එම ප්‍රතිපත්ති තුළ ඇතුලත්ය. 'සමාජවාදය ආවොත් අපිට පුද්ගලිකව වාහනයක්වත් පාවිච්චි කරන්න වෙන එකක් නැහැ' යනුවෙන් කොඳුරමින් සිටින අයට සිංගප්පූරුව විසින් අපූරු පාඩමක් කියා දී ඇත්තේ ධනවාදය තුළම අර්බුදය වෙනුවෙන් ඒ අයිතිය සීමා කර දමමිනි.



වත්මනේ සිංගප්පූරුවේ 70%-75% අතර ප්‍රමාණයක් පොදු ප්‍රවාහනය භාවිතා කරන අතර ඔවුන්ගේ ඉලක්කය වී ඇත්තේ 2020 වන විට එම ප්‍රමාණය 80%-85% අතර ප්‍රමාණයකට ගෙන ඒමයි.

සිංගප්පූරුව එදා පොදු ප්‍රවාහනය ගොඩනැගීමට කටයුතු කරද්දී ඒ හා සමගාමීව සිටි බැංකොක්, මැනිලා සහ ජාකර්තා ආදී නගර සිදු කළේ මංමාවත් පුළුල් කරමින් එනම් අධිවේගී මාර්ග ඉදිකරමින්, මංතීරු ප්‍රමාණය වැඩි කරමින්, ගුවන් පාලම් සාදමින් වඩ වඩාත් පෞද්ගලික වාහන ආකර්ෂණය වන ආකාරයට කටයුතු කිරීමය. එහෙත් වසර 40කට පමණ පසු බලන විට මෙනී යන්නේ එකී නගර වාහන අද ලෝකයේ තදබදය උපරිම නගර බවට පත්ව ඇති බවයි.

### අපිට පුළුවන්ද?

මාර්ග තදබදය අවම කිරීම සඳහා අපට ක්‍රම දෙකක් අනුගමනය කළ හැක. එකක් වැඩි වන වාහන ප්‍රමාණයට සරිලන ලෙස තවදුරටත් මාර්ග පුළුල් කිරීම සහ වැඩි වැඩියෙන් මාර්ග තැනීමයි. අනෙක පොදු ප්‍රවාහනය ශක්තිමත් කරමින් පෞද්ගලික වාහන පරිහරණය සීමා කිරීමයි. අපි ඉහතදී සාකච්ඡා කළ ආකාරයට පළමු ක්‍රමය අසාර්ථක බව තහවුරු වී තිබේ. ගැටලු ව ඇත්තේ මේ පවතින දේශපාලන අධිකාරීන් සමග දෙවන ක්‍රමයට යා හැකිද යන්නයි.

මන්ද යත් අපේ රටේ කිසිදු කේෂත්‍රයකට ජාතික ප්‍රතිපත්තියක් නැත. තිබුණද ඒවා නමට පමණක් සීමා වී තිබීමය. ප්‍රවාහනය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් පිළිබඳව සිතීමටවත් අසමත් අප රටේ ධනේශ්වර දේශපාලන පක්ෂ දෙකෙන් වෙනත් කිසියම් ක්ෂේත්‍රයක මතුව පවතින අර්බුදයකට මෙන්ම ප්‍රවාහන අර්බුදයටද විසඳුම් අපේක්ෂා කිරීම ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලීමකට වැඩි දෙයක් නොවේ.

## ශිෂ්‍ය ව්‍යාපාරයට නිවැරදි...

03 පිටුවෙන්



මාරුවට ණය ඉල්ලන් ලෝකෙ වටේ යන්නෙ ඒ නිසා.

ඉතින් ජනතාවට සුබසාධන ලැබෙනවා වෙනුවට තිබෙන ඒවාත් කප්පාදු වෙන එක තමයි මේ වගේ ණයට දුවන ආර්ථිකයකින් බලාපොරොත්තු වෙන්න සිදුවෙන්නෙ. එයින් ප්‍රධාන තැනක් ගන්නෙ සේවා. ඒ අතරින් අපේ රටේ රජය මැදිහත් වෙමින් ක්‍රියාත්මකවන ප්‍රධාන සේවා තමයි අධ්‍යාපනය සහ සෞඛ්‍යය. ඉතින් තම ආර්ථික ප්‍රතිපත්තිය නව ලිබරල්වාදය කරගත්ත ඔවුන්ට අධ්‍යාපනය විකුණන්නේ නැතිව ඉන්න බැහැ.

මේ නිසා තමයි පසුගිය අයවැයේදිත් ආණ්ඩුව කිව්වෙ වෛද්‍ය උපාධිය හැර අන් සියල්ල විකුණනවා කියලා. ඒත් අද තමන්ගේ ප්‍රතිපත්තිය තුළ තබාගන්නවා යැයි ප්‍රකාශ කළ සීමාවවත් ආරක්ෂා කරගන්න ආණ්ඩුවට බැරිවෙලා. ඒ නිසා මාලබේ නීතිවිරෝධී පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ වගේම තමයි රජයේ වියදමින් නඩත්තු වෙන කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේත් දැන් වෛද්‍ය උපාධිය විකුණනවා.

ඕනෑම මුදලාලි කෙනෙකුට විශ්වවිද්‍යාලයක් තමන් කැමති අයුරකින් පටන්ගෙන පවත්වාගෙන යන්න ඉඩදීලා තිබෙනවා වගේම තමයි දැන් දැන් රජය මැදිහත්වෙලා මුදල් අයකරන විශ්වවිද්‍යාල ආරම්භ කරන්නත් පටන් අරන්. ඒ විතරක් නෙවෙයි, සරසවිවලට ප්‍රමාණවත් ලෙස මුදල් වෙන්නොකර, ඒ ඒ ආයතනවලට තමන්ගේ වියදම් උපයාගන්නා ක්‍රමවේදයක් විදිහට දැන් රජයේ විශ්වවිද්‍යාල තුළත් මුදලට උපාධි විකුණන්න පටන් අරන්.

***නියමුවා:- මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පිළිබඳ ගැටලුව තීව්‍ර වී තිබෙනවා. ඒ අතර ජනසතු කිරීමක් මෙන්ම අහෝසි කිරීමක් යෝජනා වෙනවා. මේ පිළිබඳ නව තත්වය කුමක්ද?***

*රංගන දේවප්‍රිය සහෝදරයා:-* මේ නීතී විරෝධී පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය විසින් පසුගියදා සිය පළමු කණ්ඩායමේ අවසන් විභාගය පවත්වා වෛද්‍ය උපාධිය ලැබීමට සුදුස්සන් ලෙස කණ්ඩායමක් ප්‍රකාශයට පත්කළා. එලෙස නීතිවිරෝධී ආයතනයකින් උපාධි ලැබූ පිරිසක් වෛද්‍ය සේවාවට එක්වීම උදෙසා අවශ්‍ය පසුබිම සකසාගැනීමේ උත්සාහයක මේ වනවිට නිරතවෙමින් සිටිනවා. මෙම ආයතනය අහෝසි කරන ලෙසට වූ අරගලය තිව්‍ර වුණේ ඒ අනුව.

එහෙත් ඒ අතරතුර මෙම ආයතනය ජනසතු කරන්න යැයි කියමින් ව්‍යාජ ප්‍රගතිශීලීභාවයක් පෙන්නුම් කරමින් එය ආරක්ෂා කරගැනීමේ ක්‍රියාවලියකටද යම් යම් පිරිස් මැදිහත්වෙමින් සිටිනවා. ඒ අනුව මුදල් අයකර උපාධි ලබා දෙන රජයේ විශ්වවිද්‍යාලයක් ලෙස මෙය පවත්වාගෙන යාමට යෝජනා එමින් තිබෙනවා. ඒ වගේම අර්ධ රාජ්‍යකරණය යැයි කියමින් 51% රජයටත් 49% පුද්ගලික අංශයටත් ලෙස පවත්වාගෙන යාමටත් සංවාද ගොඩනගමින් තිබෙනවා. උපාධිය විකිණීම සඳහාම වූ එබඳු කිසිදු යෝජනාවකට එකඟවීමට අපිට බැහැ.

ජනසතු කිරීමට වෛද්‍ය උපාධියකට අවශ්‍ය පහසුකම් කිසිවක් මෙතන නැහැ. ආචාර්ය මණ්ඩලයේ ප්‍රමිතියක් නැහැ. කාර්ය මණ්ඩලයත් එහෙමයි. ශිෂ්‍යයො ලෙස ඉන්න පිරිසත් එහෙමයි. ප්‍රමිතියෙන් යුත් ශික්ෂණ රෝහලකුත් නැහැ. ඒ නිසා සමාජවාදී ශිෂ්‍ය සංගමය ලෙස අපි විශ්වාස කරනවා, ආණ්ඩුව විසින් වහාම කළ යුත්තේ මෙම නීති විරෝධී ආයතනය අහෝසි කිරීම. මුදලට නොව, උසස්පෙළ සුදුසුකම් මත ශිෂ්‍යයින් බඳවාගන්නා වෛද්‍ය පීඨයක් ලෙස නැවත ස්ථාපිත කරන්නේද යන්න ද්වීතික කාරණයක්.

***නියමුවා:- පසුගියදා යාපනය විශ්වවිද්‍යාලයේ ඇති වූ ගැටුම්කාරී තත්වය ශිෂ්‍ය ව්‍යාපාරයක් ලෙස කණගාටු විය යුතු දේශපාලනික වර්ධනයක්. සමාජවාදී ශිෂ්‍ය සංගමය මේ තත්වය තේරුම් ගන්නේ කොහොමද?***

*රංගන දේවප්‍රිය සහෝදරයා:-* මෙම ගැටුම පැහැදිලිවම ජාතිවාදය මත පදනම්ව සිදුවූ ගැටුමක්. ජාතිවාදයට එරෙහි, ජාතික සමගිය ගොඩනැංවීම උදෙසා පෙනී සිටින ශිෂ්‍ය සංගමයක් ලෙස අප පළමුකොටම එම සිදුවීම හෙළාදකිනවා. කිසිදු ආකාරයක ජාතිවාදයකට පක්ෂ වීමට අපට බැහැ.

ජාතිවාදය හැමදාමත් සිදුකළේ ජනතාව බෙදා වෙන්කිරීම. සටන්කරන බලවේගයන්ට හැමදාමත් ශක්තියක් වුණේ ඔවුන්ගෙ සමගිය. බෙදී වෙන්වීමෙන් වෙන්නෙ ඔවුන් තවදුරටත් දුර්වල වීම. ශිෂ්‍යයින්ටත් මේ සත්‍යය එලසමයි. ඒ නිසා තමයි පාලකයින් හැමදාමත් සටන්කරන බලවේග, ජාතිවාදය නම් වූ මේ උගුලට හිරකරන්න උත්සාහ කරන්නෙ. ඒ වගේම මේ මගින් තම පටු වුවමනාවන් සපුරාගැනීමට මානබලමින් සිටින කණ්ඩායම් මේ මොහොතේදීත් අපිට දකින්න පුළුවන්.

ඒ නිසා ජාතිවාදී ගැටුම් සම්බන්ධයෙන් සතුටුවිය හැක්කේ ධනේශ්වර පාලකයන්ට, දේශපාලන පක්ෂවලට පමණයි. ශිෂ්‍ය අරගල තිව්‍ර වී ඇති මොහොතක, ආචාර්යවරුන්, විද්වතුන්, කලාකරුවන් ඇතුළු ප්‍රගතිශීලි බලවේග ඒ වටා එක්වෙමින් සිටින මොහොතක ඒ අරගලයේ ප්‍රධාන කොටස්කරුවන් වූ ශිෂ්‍ය කණ්ඩායම් තුළ මෙවන් තත්වයක් ඇතිවීම සැබවින්ම ඛේදජනක කාරණයක්. ඒ නිසා මින්මතුවට මෙවැනි සිදුවීම් ඇති නොවීම උදෙසා සිදුකරනු ලබන අරමුණු සහගත මැදිහත්වීමක් ශිෂ්‍ය ව්‍යාපාරය විසින් කළ යුතුව තිබෙනවා.

***නියමුවා:- වර්ධනය වන සියලු තත්වයන් හමුවේ ශිෂ්‍ය ව්‍යාපාරයක් ලෙස සමාජවාදී ශිෂ්‍ය සංගමයේ භූමිකාව කවරාකාරද?***

*රංගන දේවප්‍රිය සහෝදරයා:-* ආණ්ඩුව විසින් සිදු කරන අධ්‍යාපන පෞද්ගලීකරණයත් ශිෂ්‍ය මර්දනයත් මෙන්ම ආණ්ඩුවේ ඒ අරමුණ සාර්ථක කරගැනීම වෙනුවෙන් විවිධ කණ්ඩායම් ප්‍රගතිශීලී යැයි පෙනෙන ව්‍යාජ යෝජනාවන් ගෙන එමින් තිබෙන අවස්ථාවකුයි මේ ගතවෙමින් තිබෙන්නෙ. එවැනි මොහොතක ශිෂ්‍ය ව්‍යාපාරය නිවැරදි දේශපාලන තීන්දු තීරණයන්හි කෙලින් සිටගත යුතුව තිබෙනවා. ගනු ලබන ක්‍රියාමාර්ගවල පටන් භාවිතාකරන වචන දක්වාම තෝරා බේරා ගත හැකි නිවැරදි දැක්මක් එය සතු විය යුතුයි.

ඒ සඳහා අවශ්‍ය වන මතවාදී මැදිහත්වීම ඉතිහාසයේ මෙන්ම අදත් සමාජවාදී ශිෂ්‍ය සංගමය ලෙස අප ශිෂ්‍ය ව්‍යාපාරයට ලබාදෙනවා. එහිදී දකුණේ මෙන්ම උතුරේත්, ඉතිහාසයේ අප මැදිහත් වූ සීමාවන් ඉක්මවූ මැදිහත්වීමක් සිදු කිරීමේ හැකියාව අද සමාජවාදී ශිෂ්‍ය සංගමයට ලැබී තිබෙනවා.

05 පිටුවෙන්

## ජාතික ආණ්ඩුවේ...



**රාජපක්ෂ කල්ලියත් සිය සියලු ක්‍රියාමාර්ග ඉලක්කර ඇත්තේ රිට හෝ ජනතාව දෙසට නොව බලය දෙසට බවය.** බලය අතට ගත් අය එය දිගටම බුක්ති විඳීමට එය තමන් වෙතම තබා ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා විට, බලය අහිමි වූ කල්ලිය නැවත බලයට ඒමේ සිහිනයෙන් අවදි නොවී සිටීමට විවිධ ක්‍රියාමාර්ග ගන්නා බවය. එබැවින් ඊනියා ජාතික ආණ්ඩුවේ කාලය දිගු වීමත් පළමු ඉනිම නිමාවීමට පෙරම දෙවැනි ඉනිමද ආරම්භ වීමත් රාජපක්ෂ කල්ලියේ සෝෂාවනුත් ජනතාවට කිසිදු දෙයක් ලබාදීමට සමත් නැති, පවතින පීඩාකාරී සමාජ රටාව හා පාලනය තවදුරටත් පවත්වාගෙන එන ඒවා බව තේරුම්ගත යුතුය.

ආර්ථික සංවර්ධනය පිළිබඳ, මෙගා ව්‍යාපෘති පිළිබඳ, රැකියා දශ ලක්ෂයේ වැඩසටහන් පිළිබඳ, සමගියෙන් සාකච්ඡාවෙන් රට පාලනය කිරීම පිළිබඳ මිත්‍යාවන් හා පම්පෝරිවලට යටින් ඇති සත්‍යය තේරුම් ගැනීමටත් එය සමාජයට තේරුම්කර දීමටත් සවිඥ්ඥානික ජනතා බලවේග කටයුතු කළ යුතුය. ඊනියා ජාතික ආණ්ඩුවක නාමයෙන් මහජන මුදල් නාස්තිකරමින්, ජනතාව මත බර පටවමින් පවත්වාගෙන යන ධනපති හවුල් ආණ්ඩුවේ ප්‍රතිගාමී ගමනත් ඊනියා ඒකාබද්ධ විපක්ෂයේ නමින් බලය සඳහා ගෙනයනු ලබන රාජපක්ෂ කල්ලියේ ප්‍රතිගාමී ක්‍රියාමාර්ගත් එක්ව පැරදවීමටත් රටත් ජනතාවත් සැබෑ ජයග්‍රහණයේ මාවතට, සමාජ සාධාරණත්වයේ මාවතට සමාජ ප්‍රගතියේ මාවතට ගෙනයා හැකි ජනතා බලයක් නිර්මාණය කිරීමටත් හැම දෙනාම පෙරමුණ ගත යුතුය.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


## සහෝදරත්වයේ දිනයෙන්..















# අද අධ්‍යාපනය ධනවතුන්ගේ වරප්‍රසාදයක් බවට පත්කරලා

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**



සෑම දරුවෙකුටම සමාන අධ්‍යාපන අයිතිවාසිකම් තහවුරු කරනු වෙනුවට අධ්‍යාපනය ධනය තිබෙන අයගේ වරප්‍රසාදයක් බවට ඇති බවට චෝදනා කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, අධ්‍යාපනය වෙළඳ භාණ්ඩයක් බවට පත්කර විකුණා ලාභ ලැබීම ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වී ඇතැයි කියා සිටියේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 17වැනි දින පැලවත්ත ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. එහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ අනුර දිසානායක සහෝදරයා, "දැනුම විකිණීම ශිෂ්ට සම්පන්නද? මේ ආණ්ඩුවල අධ්‍යාපන ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ මේකද"යයි ප්‍රශ්න කර සිටියේය.

"දැනුම යනු මුළු මානව ශිෂ්ටාචාරයේ අත්දැකීම්වල සම්භාරයයි. එය අයිති මානව සමාජයටයි. ඒ දැනුම සයිටම් මුදලාලිට අයිති දෙයක් නෙවෙයි. ඔහුට දැනුම අලෙවි කළ හැකිද? මේ වනවිට ලෝකය පුරා විශාල සංවාදයක් මතුවෙලා තිබෙනවා දැනුම වෙළඳ භාණ්ඩයක් කොට ලාභ ලැබීම සාධාරණද කියලා. පැවති පාලනයත් පවතින පාලනයත් අධ්‍යාපනය විකුණන්න සැලසුම් කළා. සයිටම් ආයතනය එහි හොඳම උදාහරණයයි. අධ්‍යාපනය විකිණීමට එරෙහිව ශිෂ්‍ය සටන් පැන නැගී තිබෙනවා. එය අද ශිෂ්‍ය ව්‍යාපාරයේ පමණක් නොව ජනතා අරගලයක් බවට පත්වෙලා. අධ්‍යාපනය වරප්‍රසාද ලත් පැලැන්තියට ලබාදීම වැළැක්විය යුතුව තිබෙනවා. ආණ්ඩුව අධ්‍යාපනය විකිණීමේ තම ප්‍රතිපත්ති වෙනස් කරනවා වෙනුවට එකිනෙකාට බෝලය පාස් කිරීමේ ආණ්ඩුවේ මෙම ක්‍රියාවලිය නිසා අද සිසු දරුවන්ට මහමඟට එන්න සිදුවෙලා. කොටුව දුම්රියපොළ ඉදිරිපිට නිදි වර්ජිතව සටන් කරන්න සිදුවෙලා."

# මෛත්‍රී-රනිල් ආණ්ඩුව සෙල්ලම් කරන්නේ ජන වරමත් සමඟයි!

**ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**



වත්මන් මෛත්‍රී-රනිල් ආණ්ඩුව බලයට පත්කළ ජනතාව විසින් නාස්තිය, දූෂණය, වංචාවට එරෙහිව වරමක් ලබා දී තිබූ නමුත් ආණ්ඩුව ජන වරමත් සමඟ සෙල්ලම් කරමින් සුපුරුදු නව ලිබරල් ආර්ථික ක්‍රියාවලිය ඉදිරියට ගෙන යමින් සිටින්නේයැයි ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා ප්‍රකාශ කළේය.

ඔහු මේ බව පැවසුවේ පසුගිය 11වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ හඳුන්නෙත්ති සහෝදරයා මෙසේද පැවසීය.

"අද විගණකාධිපතිවරයා පිළිබඳව විශාල සාකච්ඡාවක් මතුවෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ කෝප් කමිටුව, ගිණුම් කාරක සභාව වැනි කමිටුවලට විගණකාධිපතිවරයාගේ මැදිහත්වීමත් සමඟ බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව විගණකාධිපතිවරයා ලබාදුන් පිටු 1251ක ඓතිහාසික වාර්තාව නිසා ඔහුගේ කාර්යභාරය පිළිබඳව සමාජයේ ඇගයීමක් තිබෙනවා. මේ ආණ්ඩුව ජනවරමට අනුව කටයුතු නොකළත් විගණකාධිපතිවරයා ජනවරම නියෝජනය කරමින් කටයුතු කරනවා. රටේ ජනතාව විගණකාධිපතිවරයා පිළිබඳව විශ්වාසයකින් ඉන්නවා.

ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදය ගැන කියමින්, නීතියේ ස්වාධීනත්වය ගැන කියමින්, නාස්තිය-දූෂණය පිටුදකිනවා කියමින්, යහපාලනය ගොඩනගනවා කියමින් සිදුකරන්නේ ඊට හාත්පසින්ම වෙනස් දෙයක්.

# ලොව පුරා අධිරාජ්‍යවාදී මැදිහත්වීම් හෙළා දකිමු!

**ජ.වි.පෙ. ජාත්‍යන්තර අංශය**

අධිරාජ්‍යවාදී රටවල අනුග්‍රහය ඇතිව වැඩෙන ත්‍රස්තවාදී සංවිධානවල ක්‍රියාකාරකම් හා දකුණු චීන මුහුදු ප්‍රදේශයට කෙරෙන අධිරාජ්‍යවාදී අතපෙවීම් හෙළා දකිමින් ජ.වි.පෙ. ජාත්‍යන්තර අංශය විසින් පසුගිය 13වැනිදා නිවේදනයක් නිකුත් කරන ලදී.

එම නිවේදනයේ මෙසේද සඳහන්ය.

බංග්ලාදේශයේ ධකා අගනුවරට ආසන්න දින කිහිපයක දී සිදු කරන ලද ත්‍රස්තවාදී ප්‍රහාර ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලය ලෙස අපි දැඩිව හෙළා දකිමු. තිස් අවුරුදු යුද්ධයක දුක් වේදනා හා බලපෑම් පිළිබඳ අත්දැකීම් ඇති අපි මෙවන් අවස්ථාවක දී ජනතාව තුළ ඇති වන පීඩනය හා කණගාටුදායක තත්වය පිළිබඳව මනා අවබෝධයක සිටිමු. එසේම එම බියගුළු ප්‍රහාර නිසා ජීවිතක්ෂයට පත් වූ බංග්ලාදේශයේ හා විදේශ රටවල පුරවැසියන්ගේ පවුල්වලට කණගාටුව ප්‍රකාශ කිරීමටද මෙය අවස්ථාව කර ගනිමු. එමෙන් ම මෙම ප්‍රහාර නිසා තුවාල ලැබූවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමු.

අධිරාජ්‍යවාදී රටවල් විසින් ආරම්භ කරන ලද සහ එහි අනුග්‍රහය ලබන ත්‍රස්තවාදී සහ ජාතිවාදී සංවිධානවල කටයුතු නිසා අද ලොව බොහෝ රටවල අතිමහත් විනාශයන් හා බිහිසුණු සිවිල් යුද්ධ ඇති වී තිබේ. විශේෂයෙන්ම පසුගිය කාලයේ අධිරාජ්‍යවාදීන්ගේ වුවමනාව අනුව ආරම්භ කරන ලද 'මුජහිදීන්', 'අල්කයිඩා', 'අයිඑස්අයිඑස්' වැනි ත්‍රස්ත සංවිධාන සෘජුව ම අධිරාජ්‍යවාදී රටවල හා ඔවුන්ගේ දේශපාලන න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරන රටවල, යුදමය හා මුදල්මය ආධාර මත යැපෙන බව නොරහසකි.

මේ වනවිට දකුණු ආසියානු කලාපය තුළම ඇෆ්ගනිස්ථානය හා පකිස්ථානය පූර්ණ වශයෙන්ද බංග්ලාදේශය හා ඉන්දියාව අර්ධ වශයෙන්ද මෙම අන්තවාදී සංවිධානවල ප්‍රහාරයට ගොදුරු වී තිබේ. එයින් ප්‍රකට වනුයේ මැදපෙරදිගින් ඇරඹුණු මෙම ප්‍රහාර ඇමරිකාවට, යුරෝපයට මෙන්ම දකුණු ආසියාවටද පැතිරෙමින් ඇති බවයි. දශක තුනක් තුළ දී ජයග්‍රාහී නිදහස් අරගල දෙකකට දායකත්වය දුන් බංග්ලාදේශ ජනතාව මෙම ත්‍රස්තවාදී ක්‍රියාවලට නොබියව මුහුණ දී එයින් තම රට නිදහස් කර ගැනීමට සමත් වෙතැයි අපි විශ්වාස කරමු.

එසේ ම දකුණු ආසියාව සහ ආසියානු කලාපය තම යුද හා ආර්ථික උපායමාර්ගයේ ඊ ළඟ ගොදුර බවට පත් කර ගැනීමට අධිරාජ්‍යවාදීන් විසින් දරන උත්සාහයන් ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි දැඩිව හෙළා දකිමු.

විශේෂයෙන් ම චීනය ඉලක්ක කරගෙන සිදු කරන ප්‍රකෝප කිරීම් මෙහිලා විශේෂයෙන් සඳහන් කරමු. දකුණු චීන මුහුදේ දූපත් කිහිපයක අයිතිය පිළිබඳව ඇති වී තිබෙන ගැටලුවේදී ඒවාට අයිතිවාසිකම් කියන රටවල් අතර සාකච්ඡාවකින් එම ප්‍රශ්නය විසඳ ගත යුතු යැයි විශ්වාස කරන අපි, එම ගැටලුව දඩමීමා කරගෙන එක්සත් ජනපදය විසින් කලාපයට කරනු ලබන ඇඟිලි ගැසීම් හා ප්‍රකෝප කිරීම් හෙළා දකිමු. තම පැවැත්ම වෙනුවෙන් ලොව පුරාම යුද්ධ අවුළුවන අධිරාජ්‍යවාදය එහිම ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ත්‍රස්ත ප්‍රහාර ගැනත් ඒ ආශ්‍රිත ප්‍රශ්න ගැනත් සාකච්ඡා කිරීමට තමන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දිගින් දිගටම එවීම හාස්‍යජනක බව දකින අපි එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදී රටවල යුදවාදී, ආක්‍රමණකාරී භූමිකාව ලොව පුරා ජනතාවගේ පිළිකුලට ලක්වී ඇති බවත් මෙහිලා සඳහන් කරමු.

ත්‍රස්තවාදයෙන්, අන්තවාදයෙන් සහ අධිරාජ්‍යවාදී මැදිහත්වීම්වලින් පීඩාවට ලක් වී සිටින ලෝකවාසී සියලු ජනතාවට අධිරාජ්‍යවාදය බැඳ දමන දම්වැලක පුරුක් බවට පත්වන මෙන් දැඩි සහෝදරත්වයෙන් ඉල්ලා සිටිමු.

# ජාතික සමගිය ගොඩනැගීමෙන් තොරව රටට ඉදිරියට යා නොහැකියි

**සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා**



ජාතික සමඟිය ගොඩනැගීමෙන් තොරව රට අඩියක් හෝ ඉදිරියට ගෙන යා නොහැකි බවට අවධාරණය කළ සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, පාලකයින්ගේ ජාතිවාදයේ උගුල්වලට හසු නොවන ලෙස රටේ තරුණ පරම්පරාවෙන් ඉල්ලා සිටියේය.

ඔහු මෙසේ පැවසුවේ පසුගිය 20වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් පළ කළ එරංග ගුණසේකර සහෝදරයා මෙසේද පැවසීය.

"කළු ජූලිය සිදුවී මේ වනවිට වසර 33ක් ගතවෙලා තිබෙනවා. තවමත් අපේ රටේ ජාතික සමඟිය ගොඩනගන්න අසමත් වෙලා තිබෙනවා. ඇතැම් දේශපාලකයින් යාපනයේ සිදුවීම තමන්ගේ දේශපාලන වාසියට යොදාගනිමින් ඉන්නවා. මහින්ද රාජපක්ෂ අහනවා, 'ඔබට සතුටුයිද දැන්' කියලා. අපේ රටේ පිරිසක් තවත් පිරිසකගෙන් ගුටි කෑවාම රටේ හිටපු නායකයා විදියට මහින්ද රාජපක්ෂ අහන්නේ කොහොමද ඔබට සතුටුයිද දැන් කියලා? දේශපාලන නායකයෙකුට එවැනි ප්‍රකාශයක් කරන්න පුළුවන්ද කියන එකත් අපිට ගැටලුවක්.

අපේ රටේ ජනතාව ජාතිවාදයට එරෙහිව ජාතික සමඟිය වෙනුවෙන් මැදිහත් වෙන බව අපිට පැහැදිලියි. සමාජවාදී තරුණ සංගමය විදියට අපිත් ඒ වෙනුවෙන් කැපවෙලා ඉන්නවා."


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.